# කර්ම විපාක
# KARMA WIPAKA

පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ හිමි

## නැවත මුද්‍රණයෙන් වචනයක්

"සබ්බ දානං ධම්ම දානං ජිනාති"
සියළු දාන වලට වඩා ධර්ම දානය උතුම් වේ.

කර්ම විපාක නමැති දහම් පුස්ථකය මුලින්ම කරවූයේ පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ වන මහ සඟරුවනයි. තමන් වෙනුවෙන් දල්වා ගත් පහන් සිසිල පුහුදුන් සැදැහැතියන් වෙනුවෙන් කරුණා පෙර දැරිව මෛත්‍රී පූර්වාංගම මෙත් සිතැතිව මැදහත් භාවයෙන් යුතුව කර්ම විපාක නමැති දහම් පුස්තකයෙන් භය හතර දන්නා පිරිසක් ලෙසින් සසර ගමන සකසා ගැනීමට මඟ පෙන්වූ ඔබ වහන්සේට අපගේ ගෞරවනීය නමස්කාර පූර්වක ස්තූතිය වේවා.

සම්බුද්ධ සසුන බබුළුවාලමින් මෙවන් ශාසනීය මෙහෙවරක යෙදෙන ඔබවහන්සේටත් හැදූ වැඩූ දෙමාපියන්ටත් ගුරුවරුන්ටත් ආදී කොටගත් සුජීවත්ව වාසය කරන හෝ මියගොස් ඇති සැමගේම සසර දුකින් අතමිදීමට ප්‍රාර්ථනීය බෝධිය සඵල කර ගැනීමට තියුණු ධර්ම දානමය පින ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

මෙම පොත පරිහරණය කිරීමෙන් අප ලැබූ ශික්ෂනය තුළින් නැවත මෙම පොත පොත් පන්දහසක් පමණ මුද්‍රණය කොට නොමිළේ බෙදා දී දායකත්වය සපයන අපසැමටත් මියගිය මව්පිය ගුරුවරු ආදීන්ටත් සුජීවත්ව ඇති පිරිසටත් සසර ප්‍රාර්ථනීය බෝධිය සඵල කරගැනීමට මෙම ධර්ම දානමය පුණ්‍ය ශක්තිය උපනිශ්‍රය වේවායි යන්න අපගේ සැදැහැති පින් සිතිවිල්ලයි.

මෙම පොත බලන සැමට සසර දුක හඳුනාගෙන පහන් සිලක් තමන් වෙනුවෙන් දල්වා ගනිත්වා.

## පෙරවදන

අචින්තෙයය ධර්මතා සතරක් ඇත. සතත්ව විෂය ලෝක විෂය - බුද්ධ විෂය හා කර්ම විෂය යන සතරයි. සියල්ල දන්නා වූ සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේ හැර අන් කෙනෙකු විසින් සිතා මතා තීරණාත්මකව දත නොහැකි බැවින් මේ ධර්මතා සතර අචින්තෙයය නම් වෙත.

සත්ත්ව ලෝකය ගැනත්, සංස්කාර ලෝක අවකාශ ලෝකයන් ගැනත්, සර්වඥයන් වහන්සේ සෘද්ධිබලය ගැනත් කර්මයන්ගේ විපාක තත්වය ගැනත් බුද්ධ දේශනාව පිළිගැනීමෙන් හැර වෙනත් ක්‍රමයකින් අවබෝධ කරගත නොහැකි බැවින් අචින්තෙයයම වෙති.

බුද්ධක නිකායේ ථේරගාථා - ථේරිගාථා - අපදාන චරියා පිටක - ජාත්කපාලි - විමානවත්ථු පේතවත්ථු ආදී ග්‍රන්ථයන්හි සඳහන් වූ පුවත්පත්වලින් විවිධාකාර කර්ම විපාක සම්බන්ධව අවබෝධයක් ලබාගත හැකිවෙයි.

අභිණ්හ පච්චවෙක්ඛණ සූත්‍රයෙහි දක්වෙන පස්වැනි ප්‍රත්‍යාවේක්ෂාවද කර්මයගැන කළයුතු යෝනිසෝ මනසිකාරයයි. සැප දුක් වේදනා විඳුවමින් සෙවනැල්ලක්සේ තමා අනුවම පසුපස ගමන් කරන එකම දෙය නම් කුශලාකුශල කර්මයයි. එබැවින් ම සිත්තුල හටගන්නා වූ අකුශල චේතනාවන් දුරලමින් කුශල චේතනාවන්ම උපදවා ගැනීමට නිරතුරු උත්සාහ දරමි. ඒ මාගේ උත්සාහය සියලු භවගාමී කර්මයන් සිඳලන රහත් මඟ නුවණ සඳහාය. ඒ පිණිස මම සැදැහැවත් සීල සම්පන්න භාවනානුයෝගියෙක් වෙමි''. යනු කර්මය ගැන කළයුතු වන යෝනිසෝ මනසිකාරයේ සරල තේරුමය.

''කම්මස්කෝම්හි කම්මදායාදෝ කම්මයෝනි කම්ම බන්ධු කම්ම පටිසරණෝ යංකම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදේ භවිස්සාමීති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං''

"මම කර්මය ස්වකීය කොට ඇත්තෙමි. කර්මය දායාද කොට ඇත්තෙමි. කර්මය ඥාති බන්ධූකොට ඇත්තෙමි. කර්මය පිළිසරණ කොට ඇත්තෙමි. කුශල් වූ හෝ අකුශල් වූ හෝ යම් කිසි කර්මයක් කරන්නෙමි නම් එයට උරුමකරු වන්නෙමි යි නිරතුරු නුවණින් මෙනෙහි කළ යුතුය." යන ඒ බුද්ධ වචනයේ තේරුමයි.

උගත් සංකල්පනාවන් උද්‍යෝගිමත්ව සහශ්‍රික මහා පුණ්‍යකර්මයක් නිමලව ආරණ්‍යයේ දී සිදුකිරීමට සංවිධාන කළ පූජ්‍ය රිදියගම සුධම්මාභිවංස ආයුෂ්මතුන් වහන්සේ විසින් එම පුණ්‍ය කර්මය නිමිත්තෙන්ද පුණ්‍යෝත්සවය නිමිත්තෙන් ද පින්වත් ඩී. ජේ.අලහකෝන් මැතිනිය ප්‍රධාන සත්පුරුෂ පිරිසගේ දායකත්වයෙන් පළමුවර මුද්‍රණය කරවා පිරිනැමුනු මේ දහම් පොතෙන් උදාහරණ නිදසුන් රැසක් සහිතව කර්ම විපාක සම්බන්ධව බොහෝ කරුණු අවබෝධ කරගත හැකිවේ.

ඉමහත් ශ්‍රද්ධාවෙන් නුවණින් මේ දහම් පොත සම්පාදනය කළපූජ්‍ය රිදියගම සුධම්මාභිවංස ආයුෂ්මතුන් වහන්සේට තව තවත් උදාර ලෙස ධර්මදානයන් සපිරීමට නිරෝගී සුවදීර්ඝායුෂ රත්නත්‍රයානුභාව බලයෙන් අභිවර්ධනය වේවා. මෙවර ධර්ම දානය පිරිනමන ඩී. එස්. පතිරන මැතිතුමා සහ එම මැතිනිය ප්‍රධාන සත්පුරුෂ සැමට ද මෙය කියවන භාවිතා කරන සැමට ද ධර්ම ඥාණ මුදුන්පත් වී දෙලොව ජයගෙන පැතු බෝධියෙන් ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුව සේ සාක්ෂාත් වේවා.

**"සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා"**

මෙයට මෙතැති,

**නාඋයනේ අරියධම්ම ස්ථවිර**

නාඋයෙන් ආරන්‍ය සේනාසනය

පන්සියගම

# වචනයක්

අප සම්බුද්ධ සාසනයෙහි මහා පිනැති තේජවන්ත මහ රහතන් වහන්සේ නමක් වැඩ සිටියහ. උන්වහන්සේ නමින් උත්තර නම් විය. මේ උත්තර මහ රහතන් වහන්සේ මීට කල්ප තිස්දාහකට පෙර දී කරන ලද පිංකමක ආනිසංස බලයෙන් සංසාරික ජීවිත සුවපත් විය. කල්ප තිස්දාහකට පෙර සුමේධ නමින් බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහල වූහ. උන් වහන්සේ විවේක සුවයෙන් ගසක් මුල වැඩසිටින අවස්ථාවේ එක්තරා තරුණ ළමයෙක් ලඟ තිබූ ගසකින් කිණිහිරියා මල් තුනක් කඩාගෙන බොහෝම ගෞරවයෙන් භක්තියෙන් දොහොත් මුදුනේ තබා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද මූලයේ තබා පූජා කළේය. මේ පූජාමය පින ඔබ වහන්සේ යම් ධර්මයක් අවබෝධ කළේද?. එම ධර්මය මට ද අවබෝධ කර ගැනීමට ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

එදා පටන් මේ බුදුසසුන දක්වා කාලය වර්ෂ ගණනින් නොව කල්ප ගණනින් තිස්දහසක් විය. මේ කාලය තුල මල් පූජා කිරීමේ පුණ්‍ය බලයෙන් සතර අපාදුකින් අත්මිදුනේය. දෙව් මිනිසුන් අතර ලබන්නට තිබෙන සකල සම්පත් ලබන ලදී. දීර්සායුෂ, නීරෝගි බව, දර්ශනීය ජීවිත, පරිවාර සම්පත් ඇති ජීවිත උසස් කුල සම්පත්, මහා ධන සම්පත්, දිව්‍ය මාලිගා, පිනැති දරු සම්පත්, මහා ප්‍රඥාවන්. ජීවිත, මහේසාක්‍ය මහානුභාව සම්පන්න ජීවිත, ලැබූ අතර දීප චක්‍රවර්ති රජකම් වරක්ද, සක්විති පදවිය වරක්ද, ලබන ලදී. එසේම රට රටවල් පාලනය කරන රජකම් ඇමැතිකම් ලැබූ වාර ගණන් සීමාවක් නොමැත.

මෙතරම් අනුසස් රාශියක් උත්තර මහරහතන් වහන්සේ සසරදී ලැබුවේ මල් තුනක්පූජා කිරීමේ ආනිසංසයෙනි. අවසානයේ දී උත්තර කුමරුවා මේ බුදු සසුනේ පැවිදි වී සිව්පිළිසිඹියා ඥාණ, ඡට් අභිඥා, ත්‍රිවිද්‍යා ලබා උතුම් අර්හත්භවයට පත් වූ සේක. අරහත්වය දක්වාම එම පිංකම උත්තර මහ රහතන් වහන්සේට හේතු උපනිශ්‍රය විය.

ඕනෑම පිංකමක් කරනු ලබන පිනැත්තන් හෝ පිනැත්තියන් විසින් ඉතා ගෞරවයෙන් ශ්‍රද්ධාවෙන් කර්මය සහ කර්ම ඵලය විශ්වාස කරමින් නිවන් සුවපතා කළ යුතුය. එයින් ජනිතවන ශක්තිය අනන්ත ජාතීන්හි අනුසස්

ලබාගැනීමට උපකාර වේ. නිවන් සුව පතා කරනු ලබන පිංකම තුළ තණ්හා දිට්ඨි මාන ආදී කෙලෙස් නොමැත. පිරිසිදු සිතින් කරනු ලබන කුසලකර්මය ත්‍රිහේතුක වේ. ත්‍රිහේතුක පිංකමකින් තමයි සාංසාරික ජීවිත පෙළ වාසනාවන්ත වන්නේ.

පූජ්‍ය රිදියගම සුධම්මාභාවංශ ස්වාමීන් වහන්සේ විසින් සකස්කරන ලද ''කර්ම විපාක'' නමැති ග්‍රන්ථය ඉතා වටිනා කාලෝචිත සැම දෙනාගේ චිත්ත ප්‍රසාදය පිණිස හේතුවන මිණිරුවනකි. විශාල පරිශ්‍රමයක් දරා දහම් පොත්පත් බලා එහි අන්තර්ගත කරුණු මෙසේ එක්තැන්කොට එළිදැක්වීමට ලැබීම ඔබ අපසැමගේ ලොකු වාසනාවකි. පිංකම් සිදුකිරීමෙන් ලැබෙන අනුසස් බිඳක් මෙහි සඳහන් වේ. පිංකමකින් ලැබෙන් අනුසස් ලියා නිමකල නොහැක. මෙහි සඳහන් දේ හොඳින් කියවා තම තමාට කළ හැකි පිංකම් කිරීමට අදිටන් කරගත යුතුය.

ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් සාසනාභිවෘධිය පිණිස මේ ධර්ම ග්‍රන්ථය සකස් කළ පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ ස්වාමීන් වහන්සේට නිරෝගී සුවය දිගාසිරි ලැබ තව තවත් ධර්ම ඥාණය වැඩි දියුණු වේවා යි මෙත් සිතින් පතමි. මෙය ඔබ අතට පත් කරන කුරුණෑගල කොළඹ පාරේ, අංකඃ 353 ඒ, නිවෙස් පදිංචි ඩී.එස්. පතිරත්න මැතිතුමා සහ එම මැතිණිය ඇතුළු ප්‍රධාන සත්පුරුෂ සැමට ද, ඒ සැමගේ දූ දරු පිරිසට ද සැමදෙනා නමින් මිය පරලෝ සැපත් සියළු ඥාතීන්ට ද, සඟමොක් සුව පිණිසම හේතු වේවා. මේ පොත කියවන ඔබ සැමටත් ධර්ම ඥාණය දියුණු වී සියලු සංසාර දුකින් අත්මිදී ලබන මහා නිවන් සුව ලබත්වායි පතමි.


මෙයට කාරුණික,

**කහගොල්ලේ සෝමවංශ හිමි**

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය

ගල්දූව - කහව

# හැඳින්වීම

## "කම්මං සත්තේ විභජති යදිදං හීනප්පණීතතායාති"

මහා කාරුණික අසරණ සරණ ශාන්ති නායක සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ වදාළ පරිදි සත්වයන් හීන ප්‍රණීත ලෙස උසස් පහත්ලෙස බෙදනු ලබන්නේ කර්මය විසිනි. කර්මය පිළිබඳ සම්බුද්ධ දහමේ දේශිත ධර්ම පාඨ බොහෝ ඇතත් මෙහි දී මා උත්සාහ ගත්තේ සරළ බසින් කථා පුවත් අනුසාරයෙන් කර්ම විපාක පැහැදිලි කිරීමටය. කරන ලද කර්මයේ විපාකයෙන් ගැලවීමට හැකි කාන්තාවක් හෝ පුරුෂයෙක් හෝ මනුෂ්‍යයෙක් හෝ අමනුෂ්‍යයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ මේ තුන් ලෝකයේම නැත. මනුලොව සිට අකනිටා බඹලොව දක්වා මේ සක්වල පුරා අබ ඇට පිරවූයේ නමුදු ඒ අබ ඇට ගණනට වඩා විශ්වයේ තවත් සත්වයන් වාසය කරන සක්වලවල් ඇතිබව ධර්මයේ සඳහන් වේ. නමුත් කර්ම විපාකයෙන් බේරීමට හැකි පුද්ගලයෙකු නම් මේ විශ්ව ලෝක ධාතුව තුළම නැත.

මෙම ධර්ම ග්‍රන්ථයේ කර්මය පිළිබඳ විස්තර ස්වල්ප නමුදු කර්ම විපාක පිළිබඳ බොහෝ විස්තර ගැබ්කොට දක්වා ඇත. මුලින්ම කර්මය යන්න පැහැදිලි කොට පසුව මෙහි කුසල කර්ම විපාක දක්වන ලදී. කුසල කර්ම විපාක නම් කුසලානිසංසයෝය. ඒ යටතේ කුසලධර්ම හැටකට ආසන්න ප්‍රමාණයක් ද කුසල විපාක හෙවත් ආනිසංස 354 ක් ද දක්වන ලදී. මේ තුළින් මා සත්පුරුෂ ඔබට කීමට බලාපොරොත්තු වූයේ පැහැදුන සිතින් නුවණ යොදා තැන්පත් මනසින් කරන ලද කුඩා නමුදු පිංකම මහත් සැප විපාක ගෙන දෙන බවය. එසේම මෙවැනි පින්කම් කරන සත්පුරුෂයන්ගෙ සිත් වලට නව ජීවයක් ලබාදීමට අපේක්ෂා කළෙමු. එය එසේම සිද්ධ වේවා.

මේ ග්‍රන්ථයෙහි දෙවනුව පෙන්වා ඇත්තේ අඳුරු විපාක පිළිබඳවේ. අඳුරු විපාක නම් අකුල කර්මයන් හේතුවෙන් ගෙන දෙන දුක් විපාක වේ. ඒ යටතේ අට මහ නිරයට යෑමට සිදුවන කර්ම හා ඉන් ගෙන

දෙන දුක් විපාක දක්වා, තිමිරපූ දුටු ඔසුපත්නිරයන් 15 ක්එහි යැමට සිදුවනහේතු සහිතව දක්වන ලදී. ඉක්බිති සංවේග දනවන සුළු වූ අසරණ ප්‍රේත ප්‍රේතියන්ගේ කථා කිහිපයක් එහි ඉපදීමට හේතු වූ කර්ම සහිතව දක්වනලදී.

මිනිස් ලොව දී විපාක දෙන ලද පූර්ව කර්ම 56 ක් දක්වන ලද්දේ අපාය දුක් නොපිළිගන්නා මෝහයෙන් මුළා වී පැටලි සිටින අසරණයන්ට මනුලොවින් කරුණු පෙන්වීමටය. ග්‍රන්ථයේ දෙවන කොටස වූ ''අඳුරු විපාක'' පිළිබඳව කළ මේ දීර්ඝ විස්තරයෙන් මා බලාපොරොත්තු වූයේ, දූෂිත සිතින් කරන ලද ඉතා කුඩා පාපය නමුදු මහත් දුක් විපාක ගෙන දෙන බව කීමට වේ. එසේම අවිදූ අඳුර හේතුවෙන් පාපයන්හි ඇලී වාසය කරන මිනිසුන් හට සංවේගය පහළ වී සුමගට යොමුවේවා යන මෛත්‍රී සිතිනි.

මින් ජනිත කුශල ශක්තිය මාගේ උපාධ්‍යන් වහන්සේ වන අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනාවංශාභිධාන ස්වාමිපාදෝත්තමයන් වහන්සේට ශත වර්ෂාධික කාලයක් නිදුක් නිරෝගී දීර්ඝායුෂ ශ්‍රී සම්පත් පිණිසත් මතු උතුම් ලොව්තුරා බුදුබව පිණිසද වේවා. එසේම අප හට අවවාද අනුශාසනා ලබාදෙමින් සතාධික දහම් ගැටළු ප්‍රමාණයක් විසඳා දෙමින් අපගේ ධර්ම විනය දැනුම ඔපවත්කළ මේ පොත සඳහා අගනා පෙරවදනක් ද සපයා දුන් අතිගරු පූජනීය සදා වන්දණීය ත්‍රිපිටකාචාර්ය කර්මස්ථානාචාර්ය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේට ද නිදුක් නිරෝගී සුව පිණිස හා මතු උතුම් ලොව්තුරා බුදුබව පිණිසම වේවා.

එසේම මා පැවිදි කොට වදාළ මාගේ ගුරු දේවෝත්තම අති පූජනීය වැලිමඩ ධම්මදස්සී මාහිමිපාණන් වහන්සේට ද, මෙයට ලිපියක් සකසා දුන් මාගේ අභිධර්මාචාර්‍ය පූජනීය කහගොල්ලේ සෝමවංස ස්වාමීන් වහන්සේට ද, ධර්ම විනය කියාදුන් සියලුම ගුරු උතුමන් වහන්සේලාට ද, මිය පරලොව ගිය මාගේ දෙමාපිය දෙපලට ද, නිවන් සුව පිණිසම වේවා, මේ සඳහා සහය දුන් ගරු තිස්සමහරාමයේ සීලදස්සනා ස්වාමීන් වහන්සේට ද, මෙය පිටපත් කරදුන් වනජීවි නිලධාරි දිනේෂ් ඉරේෂණ මහතාට දළ සෝදුපත් බලාදුන් ධම්ම වීරකෝන් මහතාට ද නිවන් සුව පිණිසම වේවා.

මින් ජනිත කුශල ශක්තිය මෙම ධර්ම ග්‍රන්ථය පළමුවර මුද්‍රණය සඳහා බර පැන යෙදූ පින්වත් ඩී. ජේ.අලහකෝන් මැතිණිය ප්‍රධාන සත්පුරුෂ සැමට ද, මෙය දෙවනවරද මුද්‍රණය කර දුන් පින්වත් ජී. ජේ. එම්. අල්විස් මැතිතුමා ප්‍රධානා සැමට ද, අමා මහ නිවන් සුව පිණිසම වේවා. මෙවර පිරිසිදු සිතින් ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කොට නොමිළේ බෙදා දෙන ඩී.එස්. පතිරත්න මැතිතුමා සහ පින්වත් මැතිණිය ඇතුළු මෙයට උපකාර කල සැමටද ඒ පවුල්වල සැමදෙනාටම නිදුක් නිරෝගි සුව අභිවර්ධනය වේවා. සියලුම ලෞකික ලෝකෝත්තර සම්‍යක් ප්‍රාර්ථනාවෝ මුදුන්පත් වේවා. ඒ සැමගෙන් නමින් මිය පරලොව ගිය සියලුම දෙමාපිය ගුරු උතුමන්ට ද, සියලු ඥාතීන්ට ද ජීවත්ව සිටින සැමට ද, වෙනස් නොවන පරම සැපත වූ සදාකාලික සැනසුම වූ ශාන්ත නිවන් සුව පිණිසම වේවා.

මෙය මනාව ක්‍රමවත්ව මුද්‍රණය කර දුන් සිකුරු පොත් ප්‍රකාශකයෝ මුද්‍රණාලයෙහි මුද්‍රණාලයාධිපති තුමා ප්‍රධාන කාර්යභාර මණ්ඩලයට ද, සෙතක් සැනසුමක් ම වේවා. බුදු පිහිටෙන් මේ උතුම් ධර්ම දානමය පින සිදුකරන බව සැමගේ ද සිත් සතන් නිවේවා. සංසිඳේවා. ශාන්තවේවා. අසීමිත බුදුගුණ බලයෙන් සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා. සැම දෙනාගේම ජීවිත තුළට තෙරුවන් පිහිට නොඅඩුව ලැබේවා. සියලු දෙනාගේම යහපත් ප්‍රාර්ථනා මුදුන්පත් වේවා. මේ අප සමැගේ සියලු උත්සාහයෝ සම්මා සම්බුද්ධ සාසනයේ චිර පැවැත්ම පිණිසම වේවා යි හෘදයාංගමවම ප්‍රාර්ථනා කරමු.

මෙයට මෙතැත

**රිදියගම සුධම්මාභිවංශ හිමි**

**නිමලව ආරණ්‍ය සේනාසනය**

**කිරින්ද - තිස්සමහාරාමය**

helaboduhavula@gmail.com

# පටුන


| | | |
|---|---|---|
| 01. | කර්මය යනු | 01 |
| 02. | විපාක දෙන අවස්ථා 04 කුසල විපාක | 02 |
| 03. | සාන්දෘෂ්ඨික දාන විපාක 04 | 03 |
| 04. | සත්පුරුෂ දාන විපාක 05 | 04 |
| 05. | ධනය හා පිරිවර ලැබෙන නොලැබෙන ක්‍රම 04 | 05 |
| 06. | මල් පූජාවේ ආනිසංස 12 සමඟ කථා 04 ක් | 06 |
| 07. | පහන් පූජාවේ ආනිසංස 03 සමඟ කථා 04 ක් | 07 |
| 08. | සුවඳ දුම් පූජාවේ ආනිසංස 10 සමඟ කථා 02 ක් | 08 |
| 09. | සුවඳ පැන් ඉසීමේ විපාක 09 ක් සමඟ කථා 02 ක් | 09 |
| 10. | ධර්මාශ්‍රවණානිසංස කථා 02 ක් | 09 |
| 11. | ආහාර පිදීමේ විපාක සමඟ කථා 04 ක් | 10 |
| 12. | ඉදිකටු පූජාවේ විපාක සහ සූචිදායක හිමි | 11 |
| 13. | වස්ත්‍ර පූජාවේ ආනිසංස 10 හා ඒකදුස්ස දායක හිමි | 11 |
| 14. | මෙට්ට පිදීමේ ආනිසංස 10 හා ඒකදුස්ස දායක හිමි සුවණ්න බිම්බෝහන හිමි | 12 |
| 15. | ඡත්‍ර දානයේ විපාක 08 සමඟ කථා 02 ක් | 12 |
| 16. | පාත්‍ර දානයේ විපාක 10 හා පත්තදායක හිමි | 13 |
| 17. | දූලිපිහියා පිදීමේ විපාක 07 | 13 |
| 18. | මහා පිහියා පිදීමේ විපාක 05 | 14 |
| 19. | නිය කපන අවි පිදීමේ විපාක 05 | 14 |
| 20. | පවන් අතු පිදීමේ විපාක 08 | 14 |
| 21. | පෙරහන්කඩ පිදීමේ විපාක 05 | 14 |
| 22. | තෙල් තබාගන්නා බඳුන් පිදීමේ විපාක 05 | 15 |
| 23. | චෛත්‍ය පිරිසිදු කිරීමේ විපාක 09 හා පහංකර හිමි | 15 |
| 24. | ඉදිකටු ගුලාපිදීමේ විපාක 03 | 15 |
| 25. | අසංකඩ පිදීමේ විපාක 03 | 16 |
| 26. | ඉනපටි පිදීමේ විපාක 06 | 16 |
| 27. | පාත්‍ර ආධාර පිදීමේ විපාක 05 | 16 28. |

28. භාජන පිදීමේ විපාක 01 හා භාජන දායක හිමි 16
29. තැටි පිදීමේ විපාක 03 17
30. බෙහෙත් ඖෂධ පිදීමේ විපාක 10 හා මෙත්තගුත්ත හිමි 17
31. පාවහන් පිදීමේ විපාක 03 සමඟ කථා 02 ක් 18
32. දිය පිස්නා වස්ත්‍ර පිදීමේ විපාක 06 18
33. සැරයටි පිදීමේ විපාක 06 හා දණ්ඩදායක හිමි 18
34. බෙහෙත් අඳුන් පිදීමේ විපාක 08 19
35. යතුරු හා යතුරු කොපු පිදීමේ විපාක 03 19
36. පටි පිදීමේ විපාක 05 19
37. බෝමලු ආදිය ඇමැදීමේ විපාක 38 සමග' කථා 02 ක් 19
38. දුම් බොන පයිප්ප පිදීමේ විපාක 03 21
39. මහ සැලි හා කරඬු පිදීමේ අනුසස් 10 21
40. අඳුන් තල පිදීමේ විපාක 04 21
41. කුඩා පිහියා හා ලොම් උදුරන අඬු පිදීමේ විපාක 02 22
42. නස්‍ය කිරීමේ උපකරණ පිදීමේ විපාක 08 22
43. පුටු පිදීමේ විපාක 12 සමඟ කථා 03 ක් 22
44. කොට්ට පිදීමේ විපාක 06 23
45. පිළුණැබිසි පිදීමේ විපාක 23
46. පාපුටු පිදීමේ විපාක 02 24
47. පාලම් ඒ දඬු ඉදිකිරීමේ විපාක 08 හා ධෝතක හිමි 24
48. ඇඟ ගල්වන තෙල් පිදීමේ විපාක 05 24
49. ගිතෙල් හා පානය කරන තෙල්පිදීමේ විපාක 05 හා සප්පිදායක හිමි 24
50. මුවපිරිසිදු කරන දැ දීමේ විපාක 25
51. දී මී පැණි නොයෙක් රස කතුරු පිදීමේ විපාක 04 25
52. සර්ව දානයෙහි විපාක 11 25
53. දෙපාවල සඳුන් ගැල්වීමේ විපාක 08 හා තෝදෙය්‍ය හිමි 26
54. මල්රේණු මල්වියන් ආදිය පිදීමේ විපාක හා කථා 03 ක් 26

helaboduhavula@gmail.com

55. කුටි පූජාවේ විපාක 05 ක් සමඟ කථා 03 ක් 27
56. ධර්ම දානයේ විපාක 27
57. තිසරණ සමාදානයේ වටිනාකම ගැන කථා 02 ක් 29
58. සුභ නම් තරුණයා ඇසූ ප්‍රශ්න 14 හා පිළිතුරු දෙසුම 31
59. පන්සිල් රැකීමේ විපාක 32
අඳුරු විපාක 33
01. නිරා දුක් 33
02. අට මහා නිරය හා 33
03. නිමි රජු දුටු නිරයන් හා එහි යෑමට සිදුවන කර්ම 35
04. ප්‍රේත ලෝක දොළහ 46
05. ප්‍රේත වස්තු පසළොසක් 47
06. මසුරු ධර්ම පහෙහි අඳුරු විපාක 54
**මිනිස් ලොව දී විපාක දුන් පූර්ව කර්ම**
01. ඛුජ්ජුත්තරාව දාසියක් වීමට හේතු 55
02. ඛුජ්ජුත්තරාව කුදු වීමට හේතු 56
03. චුල්ලපන්ථක හිමිට සිව්මසකින්ද 56
ගාථාවක් පාඩම් නොවීමට හේතු
04. චක්ඛුපාල හිමියන්ගේ දෙනෙත් අන්ධවීමට හේතුව 57
05. බිම්බිසාර රජුගේ කකුල් පලා ලුණු දැමීමට හේතු 57
06. කසල ගොඩකට දමන ලද 57
අසරණ දරු ජීවිතයක ශෝකාකුල කථාව
07. දෙමාපියන් විසින් අතහැර ගිය දරුවෙක් 58
08. සාමාවතිය ඇතුලු 500 ක්
ස්ත්‍රීන් ගිනිගෙන මැරෙන්න හේතුව 58
09. පූතිගත්තතිස්ස හිමිගේ ශරීරය කුණු වී දුක් විඳීමට හේතු 59
10. සෝරෙය්‍යක සිටුගේ අද්භූත කර්මය 59
11. සප්පදාය හිමිට නාගය දෂ්ට නොකළ හේතුව 59
13. නාවිකයාගේ බිරිඳට මුහුදේ ගිලී මැරෙන්න සිදුවූයේ ඇයි 60
14. ගිනිගෙන දැවුන කපුටාගේ කර්මය 60

| | | |
|---|---|---|
| 15. | භික්ෂූන් හත්නමක් ගල් ලෙනක හිරවී දුක්විඳි කථාව | 61 |
| 16. | ලද සම්පත් පරිභෝග කිරීමට වාසනාව නැති අපුත්තක සිටු | 61 |
| 17. | පිනට පහළවුන උක්ගස් දඬුවම් දුන් කථාව | 62 |
| 18. | කුසගිනි දුක් විඳි ලෝසක හිමි | 62 |
| 19. | අවුරුදු 20000 ක් මහණදම් පිරූ හිමි නාගයකු වූ කථාව | 63 |
| 20. | දරුවන් නැති සිටුවරයෙකුගේ කථාවක් | 64 |
| 21. | සුප්පබුද්ධ කුෂ්ඨ රෝගියා | 64 |
| 22. | බෝධිරාජ කුමාරයාට දරුවන් නැති හේතුව | 64 |
| 23. | මල්ලිකා දේවිය දින හතක් අපායට යාමට හේතුව | 65 |
| 24. | රෝහිණී කුමරියගේ කුෂ්ඨ රෝගයට හේතුව | 65 |
| 25. | කුණ්ඩදාන හිමි පසුපස කාන්තාවක් ඒමට හේතුව | 66 |
| 26. | කපිල මත්ස්‍යයාගේකථාව | 66 |
| 27. | මහාකාල උපාසක ගුටි කා මැරුම්කෑමට හේතුව | 67 |
| 28. | සසර පුරුදු ඉදිරියට යන බව | 67 |
| 29. | පනස් පස් වසරක් අසූචි කා ජීවත් වූ මිනිසෙක් | 68 |
| 30. | ලකුණ්ඨක භද්දිය හිමි මිටි වීමට හේතුව | 69 |
| 31. | මුගලන් හිමි සොරුන්ගෙන් මැරුම් කෑමට හේතුව | 70 |
| 32. | සීවලී හිමි මව්කුස දුක්විඳි කර්මය | 70 |
| 33. | සුචිලෝම යක්ෂයා වූ භික්ෂුව | 71 |
| 34. | ඛරලෝම යක්ෂයා වූ උපාසක තුමා | 71 |
| 35. | උත්තර ස්වාමීන් වහන්සේ උල තැබීමට හේතුව | 71 |
| 36. | පත්මාවතී දේවියට විපාක දුන් කර්මය | 72 |
| 37. | නිග්‍රෝධ හිමියන් සැඩොල් ගමක අනාථව ඉපදීමට හේතුව | 73 |
| 38. | ස්වර්ණ තිලකාව සැඩොල් කුලයක ඉපදීමට හේතුව | 74 |
| 39. | කැළණිතිස්ස තෙරුන්ගේ කර්මය | 74 |
| 40. | අසෝක මාලාව සැඩොල් කතක් වීමට හේතුව | 75 |
| 41. | දාසක හිමි දාසියකගේ කුස ඉපදුනේ ඇයි | 75 |
| 42. | අඩ්ඪකාසිය ගණිකාවක් වීමට හේතුව | 76 |


helaboduhavula@gmail.com

43. යක්ෂයන් වූ ත්‍රිපිටකාධාරි භික්ෂු දෙනම 76
44. මුවින් දුගඳ පිටවන රූමතිය 77
45. සුප්පිය රහතන් වහන්සේ පහත් කුලයක ඉපදීමට හේතුව 78
46. සමිති ගුත්ත හිමිගේ ශරීරය කුණුවීමට හේතුව 78
47. ආනන්ද ස්වාමීන් වහන්සේ
පෙර ජාතියක දී කාන්තාවක් වී ඉපදීමට හේතුව 79
48. සත්ව ඝාතනයේ ආදීනව 79
49. බීජක නම් දාසයාගේ පූර්ව කර්මය 80
50. සාම කුමරුගේ මව්පිය දෙපලගේ
දෙනෙත් අන්ධවීමට හේතුව 80
51. මහා පිණැති පුණ්ණාව දාසියක් වීමට හේතු 81
52. මෛත්‍රී බුදුන් රජුන්ගේ
ශ්‍රී හස්තයෙහි ගෙඩියක් ඒමට හේතුව 81
53. උපාලි හිමි කරණවෑමියෙක් වීමට හේතුව 82
54. අම්බපාලිය වෛශ්‍යාවක් වීමට හේතුව 83
55. බොහෝ ස්වාමිපුත්‍රයන්ට ද නිඟමනේ ගොස් 83

ජීවත් වූ මිනිසාට ද එපා වූ අහිංසකාවිය 84
56. අසරණ සුනිතගේ පූර්ව කර්මය
57. මෝසරාජ හිමිගේ මහා කුෂ්ඨ රෝගයට හේතුව 85
58. අමූලික චෝදනාලත් දබ්බමල්ල පුත්ත හිමි 85
59. මහවැලි ගඟෙහි කිඹුලෙකු වූ මහා වාවකාල උපාසක තුමා 86
60. ආදරයේ වසඟත්වයට ගොස් නැට්ටුක්කාරයෙකු වූ 87
උග්ගසේන සිටු පුත්‍රයා
61. උපන්දාම ගඟේ පා කර දමූ 88
කිරිකැටි බිළිදෙකුගේ අභිමානවත් කථාව
62. අනන්තගුණ ඇති මහා ප්‍රාඥා 91
සම්මා සම්බුදුරජාණන් වහනසේට ද විපාක දුන් කර්ම 12

''නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස''

**"කම්මස්සකෝම්හි කම්ම දායාදෝ කම්ම යෝනි කම්ම බන්ධු කම්ම පටිසරණෝ යං කම්මං කරිස්සාමි කලයානං වා පාපකං වා තස්ස දායාදෝ භවිස්සාමීති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසේන වා ගහට්ඨේන වා පබ්බජිතේන වා ති"**

(ඨාන සූත්‍රය හෙවත් අභිණ්හ පච්ච වෙක්ඛන සූත්‍රය)

අනන්ත අපරිමාණ අසීමිත අචින්තෙය්‍යය ගුණයෙන් යුක්ත වූ සකල ලෝකානන්ද කරවූ සත්වහිත විධායක වූ කරුණා නිධාන වූ මහා කාරුණික සම්මා සම්බුදු රජාණන් වහන්සේට අප සමැගේම නමස්කාරය වේවා. පින්වතුනි, මේ මාතෘකා කළේ ''අභින්හ පච්චවෙක්ඛන'' සූතයෙ එන සූත්‍ර පාඨයකි. ඒ නිවන් රසයෙන් රසවත් ව ධර්ම පාඨයට අනුව සියලු සත්වයෝම කර්මය ස්වකීය කොට ඇත්තෝය. කර්මය දායාදාකොට ඇත්තෝය. කර්මය සැප දුක් වේදනා ගෙන දෙන මූල හේතුව කොට ඇත්තේය. එසේම කර්මය ඥාතිකොට ඇත්තෝය. කර්මය පිහිට පිළිසරණ කොට ඇත්තෝය. ඉදින් යහපත් හෝ අයහපත් හෝ යම් කර්මයක් කරන්නේ නම් ඔහු විසින් ඒ කළා වූ කර්මයාගේ විපාක ද ඔහුට ම දායාද වන්නේය, කියන ආත්මෝපදේශාත්මක නිර්වාණ ධර්මය කාන්තාවක් හෝ පුරුෂයෙකු

විසින් හෝ ගිහියෙකු විසින් හෝ පැවිද්දෙකු විසින් නිරන්තරයෙන් සිහිකළ යුතු යැයි තථාගත සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ වදාරන්නට යෙදුනාහ.

මේ අනුව අපි බැලිය යුතු, අවධානය යොමු කළ යුතු,කරුණු කිහිපයක්වේ.

01. කර්මය යනු කුමක්ද?
02. යහපත් අයහපත් කර්ම මොනවාද?
03. එම කර්මයෝ අපට දායාද වන්නේ කෙසේද? කියාය

01. සම්බුද්ධ දහමේ කර්මය යනු චේතනාව වේ. ඒ බව මෙසේ දක්වේ. ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' මහණෙනි, මම චේතනාව කර්මය යැයි වදාරමි කියාය. මේ අනුව සිතන චේතනාව අනුව සිදු කරන කර්මය ද යහපත් හෝ අයහපත් විය හැකිය. ඒ අනුව ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා, දස කුසල ධර්ම, දස පාරමී ධර්ම, සම සතලිස් කර්මස්ථාන ආදී පින් කටයුතු යහපත් කර්ම ගණයටද, පස්පව්, දස අකුසල්, අධර්ම වෙළදාම් අයහපත් කර්ම සංඛ්‍යාවට ද වැටෙනු ලැබේ. එසේම යහපත් කර්ම හේතුවෙන් සැපදායක සැනසුම් එලවන යහපත් විපාක ද, අයහපත් කර්ම හේතුවෙන් දෙනෙත් කඳුලින් තෙත් කරවන දුක් විපාක ද ගෙන දෙනු ලැබේ. යහපත් කර්ම වලට ගෙන දෙන සැප විපාක ආනිසංස නමින් ද දක්වා ඇත. අයහපත් කර්මයන්ගේ දායාදය ද එයමවේ.

**02. කුසල අකුසල කර්ම වලට විපාක ගෙන දෙන අවස්ථා හතරක් ධර්මයෙහි සඳහන්වේ.**

01. දිට්ඨධම්ම වේදනීය
02. උපපජ්ජ වේදනීය
03. අපරාපරිය වේදනීය
04. අහෝසි කර්ම කියාය.

තමන් කරන හොඳ හෝ නරක කර්ම වල කොටසකට මෙලොව විපාක ලැබේ. (එම අවස්ථාවේ වැඩකල චිත්ත වීතියෙහි පළමු ජවනයේ ශක්තියෙනි) නිදර්ශන ලෙස පුණ්ණ නම් දුගියා, චිංචිමානවිකාව, සුප්පබුද්ධ රජු ආදී අය දැක්විය හැකිය. මේවා දිට්ඨධම්ම වේදනීය විපාක යැයි කෙටියෙන් දතයුතු.

එසේම අප කරන කුසල අකුසලකර්ම වලට මතු ජීවිතයේ කොටසක් විපාක දෙනු ලැබේ. (එහි දී පහළ වූ චිත්ත වීථියෙහි සත්වන ජවනයාගේ ශක්තියෙනි) මේ උපපජ්ජ වේදනීය කර්ම යයි කියනු ලැබේ. නිදර්ශන ලෙස දෙව්දත් තෙරුන් අපාගත වීම, සැරියුත් මහරහතන් වහන්සේ ට පහර දුන් නන්ද යක්ෂයාගේ අපාගතවීම, මහ ගුණැති උප්පලවණ්ණා මෙහෙණිය දූෂණය කළ නන්ද මානවකයා අපාගත වීම, ඉන්දික දුගියා අනුරුද්ධ මහ රහතන් වහන්සේට එක් දන්හැන්දක් දී දෙව්ලොව ඉපදීම, බණ අසමින් සිටි මැඩියා දෙව්ලොව ඉපදීම ආදිය දැක්විය හැකිය.

අපරාපරිය වේදනීය නම් මේ ජීවිතය ද මතු මීලඟ ජීවිතය හැරුනු කල මේ දිගු සසර දී විපාක දෙන කර්ම වේ. (එම අවස්ථාවේ පහළ වූ චිත්ත වීථියෙහි ජවන් හතෙන් මැද ජවන් පහ වේ. එනම් 2, 3, 4, 5, 6 යන ජවන 05 වේ) නිදර්ශන ලෙස චක්ඛුපාල හිමිගේ දෙනෙත් අන්ධවීම, මුගලන් මහ රහතන් වහන්සේට සොරු පහරදීම, අපුත්තක සිටුවරයාට ධනය ලැබීම උප්පලවණ්ණා රහත් මෙහෙණියට විශිෂ්ඨ රූ සම්පත් ලැබීම දැක්විය හැකිය.

මෙලොව විපාක දිය යුතු කොටස මෙලොව විපාක දෙන්නට අවස්ථාවක් නොලැබුණොත් මතු විපාක නොදෙනු ලැබේ. ඒ විපාක කොටස අහෝසි වී යයි. පරලොව දිය යුතු විපාක එසේ දීමට අවස්ථාවක් නොපැමිණියහොත් අහෝසි වී යයි. උදා: දෙව්දත්තෙර අවුරුදු 36 ක් හොඳින් පැවැදි දිවිය ගත කර ඇත. ඒ අනුව හොඳ කර්මයනගෙන් හොඳ විපාක කොටසක් මතු දිවියේ ලැබිය යුතුව ඇත. නමුත් ඔහු අපාගත වූ බැවින් ඒ හොඳ සැප විපාක ඒ ස්ථානයේ නොදිය හැකි බැවින් එම මතු ජීවිතයට ලැබීමට තිබූ සැප විපාක කොටස ද අහෝසි වී යනු ලැබේ. නමුදු පිරූ මහණදම අපතේ නොයන්නේය. මතු කුසල බලය අපරාපරිය වේදනීය ලෙස මතු වී සට්ඨීස්සර නමින් පසේ බුදු බව ලබන්නේ වේ. යමෙක් බුදු පසේ බුදු මහරහතන් යන තත්වයකට පත් වුවහොත් සියලු කර්මඉන් එහා දී විපාක දීම් නැති වන්නේය. උදා: අංගුලිමාල මහ රහතන් වහන්සේ දැක්විය හැකිය.

## 1 කුසල විපාක

සත්පුරුෂ පින්වතුනි, අප මෙහි දී බලාපොරොත්තු වන්නේ ඉහත දක් වූ මූලසූත්‍ර පාඨයම විග්‍රහ කිරීමට නොවන අතර,

"කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදෝ භවිස්සාමීති" ධර්ම පාඨය විස්තර කිරීමට වේ. ඒ අනුව,

01. යහපත් කර්ම වලට ලැබෙන යහපත් විපාක ද
02. අයහපත් කර්මවලට ලැබෙන අයහපත් විපාක ද

පෙන්වනු ලැබේ. අප විසින් මුල දී යහපත් කර්ම මොනවාද කියන බව පැහැදිළි කරන්නට යෙදුනි. දැන් අපි ඒ ඒ කර්මයන්ගේ විපාක ම දක්වන්නෙමු. යහපත් කර්ම අතර මුලින්ම සඳහන් කළේ ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා ධර්ම වේ. ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා ධර්ම නම් දාන සීල භාවනා වේ. ඒ අනුව අපි පළමුවම දාන විපාක දක්වන්නෙමු. අංනි. පඤ්චක නිපාතයෙහි සීහසේනාපති සූත්‍රයෙහි.

03. සාන්දෘෂ්ඨික (මෙලොවම තමා විසින් දැකගත හැකි දානානිසංස හතරක් දක්වා ඇත.)

01. දායකතෙමේ බොහෝ දෙනාට ප්‍රියමනාප කෙනෙක් වේ.
02. දායකතුමා පිළිබඳව යහපත් කීර්ති රාවයක් පැතිරේ.
03. ඕනෑම පිරිසක් කරා විශාරදව එළඹීමේ ශක්තියක් ලැබේ.
04. මතුදුගී වීමකට තෙද රහිත වීමකටද පත්නොවේ.
05. යහපත් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබේ. එසේම දනානිසංස සූත්‍රයට අනුව
06. ගිහි ධර්මයන්ගෙන් නොපිරිහුන කෙනෙක් වනබව දක්වා ඇත. අඛණ්ඩව පන්සිල් ආදී ගුණ රකින්නෙකු යනාර්ථයි.
07. තවද මරණින් මතු සුගති ලෝකයක ඉපදීමට ද මෙම දානමය පිංකම හේතුවන බව පෙන්වා දී ඇත.

පින්වතුනි, තවද සත්පුරුෂ දාන පහක් ඇති අතර එහි විශේෂ විපාක සප්පුරිස දාන සූත්‍රයට අනුව මෙසේය.

### 04. සත් පුරුෂ දාන විපාක පහ

01. ශ්‍රද්ධාවෙන් දන්දීම හේතුයෙන් විශිෂ්ඨ රූප සම්පත් ලැබේ. එබැවින් ශ්‍රද්ධාවෙන්ම දන් දෙත්වා.

02. සකස්කොට දීම හේතුවෙන් කීකරු දූ පුතුන් අඹු දරුවන් ස්වාමි පුත්‍රයන් දාසි දස්සන් ලැබේ. (එබැවින් දෙන දෑ සකස්කොට දීමට පුරුදු වන්න.)

03. ආගන්තුක දාන, ගමික දාන, දුර්භික්ෂ දාන ආදී සුදුසු කල්හි දන්දීම හේතුවෙන් තරුණ වයසේදී බොහෝ සැප සම්පත් ලැබේ.

04. ලෝභයකින් තොරව දන්දීම හේතුවෙන් හොඳ ආහාර පාන, යාන වාහන, ගේ දොර ආදිය පරිභෝග කිරීමට සිත නැමෙනු ඇත. ලැබෙන දෑ පරිභෝග කිරීමට සිත නැමෙනුයේ ලෝභයෙන් තොරව දන්දීම හේතුවෙනි.

05. තමාද අන් අයද වෙහෙසට පත් නොකොට ධාර්මික වස්තුවෙන් දන්දීම හේතුයෙන් මතු ලැබෙන සම්පත් ගින්නෙන් ජලයෙන් සොර සතුරන්ගෙන් අකීකරු දුදනන්ගෙන් විනාශ වී තමාට අහිමි නොවේ. ලැබෙන සම්පත් සුරක්ෂිත වේ කියාය.

**05. සත්පුරුෂ පින්වතුනි,**

**තවත් දාන හතරක විපාක ධර්මයෙහි මෙසේ සඳහන් වේ.**

(ධම්ම පදට්ඨකතා 46 පිටුව)

01. තමන්ගේ ධනයෙන් දන්දෙන අතර අන්‍යන් ඊට සහභාගි කර නොගනී.ඒ හේතුයෙන් ඒ අයට මතු භෝග සම්පත් ලැබෙන අතර පරිවාර සම්පත් නොලැබී යයි.

02. තම ධනය වියදම් නොකොට බොහෝ පිරිස් එකතු කරගෙන ඒ අයගේ ධනයෙන් දන්දීමේ හේතුයෙන් මතු ධන සම්පත් නොලැබෙන අතර පිරිවර සම්පත් ලැබෙනු ඇත.

03. තමා ද දන් නොදෙන අතර දෙන දානයට ද සහභාගී නොවීම හේතුයෙන් මතු ධන සම්පත් ද පිරිවර සම්පත් ද යන දෙකම නොලැබේ.

04. තම ධනය යොදා අන් අයට ද ඊට සහභාගි කරගෙන දෙන දානය හේතුයෙන් මතු ධන සම්පත් පිරිවර සම්පත් ද දෙකම ලැබෙනු ඇත.

ශ්‍රද්ධාව අවදිකරගෙන නුවණින් යුක්තව එකඟ වූ නොවිසුරුන සිතින් දෙන පුංචි දෙයක් වුවද මහත්ඵල වන බව පෙන්වීමට අපදාන පාලියට අනුව කරුණු පෙන්වා දෙමි.

## 06. මල් පූජාවේ ආනිසංස

පදුම හිමි පෙර ජීවිතයක දී පදුමුත්තර බුදුරජාණන් වහනසේ ප්‍රමුඛ මහ සංඝරත්නයට එක් පියුමක් ගෙන පූජාකළ පිනෙන් මල්පෙති ගණනට සක්විති රජව ඉපදුනාහ. හත්සිය වතාවක් පෘථිවි රාජ්‍ය කළා. අවසානයේ නිවන් සුව ලැබීමට ඒ පින හේතු වූ බව පෙන්වා ඇත.

(අපදාන පාලි බුඃවඃ193පිට)

තිළප්පල මාලිය හිමි විපස්සී බුදුරජුට උපුල් මල් තුනක් පුදා කල්ප 91 ක් දුගතියට නොයන ලදී. මේ පිනෙන් තුන්සිය වතාවක් සක්දෙව් රජ වී ඉපදුනාහ. පන්සිය වතාවක් සක්විති රජ වුණා. අවසානයේ නිවන් දැකීමට ද මේ පින උපනිශ්‍රය වුනා. බලන්න සත්පුරුෂයෙනි, හැදුන සිතකින් පින්කම් කිරීමේ අගය.

(අපදාන පාලිය - 342 අපදානය)

සත්තුප්පලමාලක ථෙරණිය පෙර ජීවිතයක සිඛී බුදුරජාණන් වහන්සේට මහනෙල් මල් සතක් එකග සිතින් නුවණ යොදා පිදූ පිනෙන් වාර හැත්තෑ හතක් දෙදෙවුලොවට අධිපති සක්දෙවිඳු ගේ බිරිඳ වී උපන්නාහ. ඒ මලේ පාට හා සුවඳ ඇයට හැම දිවියකම ලැබුණු අතර අවසානයේ නිවනට ද මේ පින උපනිශ්‍රය විය.

(ථෙරීඃඅපදානය - 8)

තිකණිකාර පුප්ඵිය හිමි සුමේධ බුදු රජාණන් වහන්සේට කිණිහිරියා මල් තුනක් පැහැදුන සිතින් නුවණ යොදා පූජා කළ පිනෙන් තුන්සිය වතාවක් සක්විති රජ විය. පන්සිය වතවක් සකදෙව් තනතුරද හැම ජීවිතයකදීම පහත සඳහන් විපාක ලැබුණා හ.

01. මහත් බෝගසම්පත් ඇත්තෙකු වුණා.
02. පහත් කුලවල නොඉපිද උසස් කුලවලම ඉපදුණා
03. කැමති කැමති යාන වාහන ලැබුණා.
04. බොහෝ රූමත් ස්ත්‍රීන් හා දාසි දාස්සන ලැබුණා.
05. බොහෝ අගනා වස්ත්‍රාභාරණයන්ට ලාභි වුණා.
06. සැම කල්හි අන් අයගේ ගෞරවයට පාත්‍ර වුණා.
07. උසස් කීර්තියක් ඇත්තෙක් වුණා.

08. සැමකල්හි බොහෝ පිරිවර ජනයා ඇත්තෙක් වුණා.
09. තම පිරිස කිසිවෙකුට භේද කළනොහැකි වුණා.
10. ඥාතීන් අතර උසස් (උතුම්) ශ්‍රේෂ්ඨයෙකු වුණා.
11. ශීත උෂ්ණවලින් පීඩාවක්වුණේ නෑ
12. කායික දාහ මානසික දාහ නැති උතුමෙක් වුණා.

අවසානයේ නිවන් සුව අවබෝධයට ද ඒ උතුම් පින උපනිශ්‍රය වුණා.
(අපදාන පාලිඃ 501 වන අපදානය)

## 07. පහන් පූජාවේ (විපාක) ආනිසංස

අජිත ස්වාමීන් වහන්සේ පියුමතුරා බුදුරජුන්ට එක් මීතෙල් පහනක් පිදූ පිනෙන් කල්ප හැටදාහක් දෙවුලොව සැප විඳ දහස් වතාවක් සක් දෙව් වුණා. වාර සත්සියයක් ප්‍රදේශ රජ වුණා. අවසානයේ නිවන දැකීමට ද ඒ කුසලයම උපනිශ්‍රය වූ බව දැක්වේ.
(අපදාන පාලිඃ 400 වන අපදානය)

පඤ්චදීපිකා ථෙරණින් වහන්සේ පෙර බුදු සසුනක කළුවර රැයක බෝධීන් වහන්සේට පහන් පහක් පිදූ පිනෙන් අසූ වාරයක් දෙව් ලොවට අධිපති සක්දෙවිඳුගේ බිරිඳ වී උපන්නාය. දහස් ගණන් සක්විති රජ දරුවන්ට අග මෙහෙසිය වුණාය. අප බුදුසසුනේ දී සත් අවුරුදු වියේ දී නිවන් දැකීමට ඒ පින උපනිශ්‍රය වී ඇත.
(9 වන ථේරී අපදානය)

සකුලා ථෙරණිය කාශ්‍යප බුදුරජුන් පිරිනිවීමෙන් පසු උන් වහන්සේගේ චෛත්‍යයට එක් රැයක් එක් පහනක් පුදා පහන සඳහන් ආනිසංස ලැබුණු බව ථේරී අපදානයේ දක්වා ඇත්තේය.

01. හැමතැනම ප්‍රදීප දැල්වේ
02. දිවැස් ලැබේ.
03. තීක්ෂණ නුවණ ලැබේ
04. යසසින් දිලිසෙත්
05. ශ්‍රද්ධාව හා ප්‍රඥාව මනාව පිහිටත්
06. උසස් කුල සම්පත් ඇත්තෙකු වේ.

ඒකදීපිය හිමි සිද්ධාර්ථ බුදුරජුන්ගේ චිතකයට එක් පහනක් පුදා එක්තිස් වරක් සක්දෙවිඳු විය. විසි අට වතාවක් සක්විති රජ බවද ලැබුවා. තවත් විශේෂ අනුසස් දෙකක් ලැබුවා.

07. විෂම ස්ථාන වලට යන විට සම වෙන්නාහ
08. විනිවිද පෙනන දෙනෙත් ඇත්තෙක් විය.

(416 වන ථේරී අපදානය)

පින්වතුනි, පහන් සුවාසූ දහසක් විසුරුණු කැළැඹුණු සිතින් පිදූවත් මේ පමණ අනුසස් ගෙන නොදෙන අතර, පැහැදුනු සිතින් එකඟ සිතින් බුද්ධිමත්ව එක් පහනක් පිදූවත් මහ අනුසස් ලැබෙන බව වටහාගනිත්වා.

## 08. සුවඳ දුම් පූජාවේ ආනිසංස

ධූපදායක හිමි පැහැදුනු එකඟ වූ සිතින් බුද්ධිය යොදා සිද්ධාර්ථ බුදුරජුන්ගේ ගඳ කිළිය සුවඳවත් කළ පිනෙන් කල්ප 94 ක් අපායට නොගොස් නිවන් දැකීමට එම කුසලය උපනිශ්‍රය වී ඇත.

(අපදාන පාලි 26 වන අපදානය)

පිළින්දිවච්ඡ මහ රහතන් වහන්සේට සුවඳ දුම් පිදූ පිනෙන් අනුසස් දහයක් ලැබුණු බව දක්වා ඇත.

(අපදාන පාලිය පිළින්දිවච්ඡ අපදානය)

01. සුවඳවත් සිරුරක් ඇත්තෙකු වේ.
02. කීර්තිමත් ජීවිතයක් ලැබේ.
03. යසස් ඇත්තෙකු වේ.
04. වහා වැටහෙන නුවණ ලැබේ.
05. තීක්ෂණ නුවණ ලැබේ.
06. භූරි පඤ්ඤ යන නුවණ ලැබේ.
07. හාසු පඤ්ඤ යන නුවණ ලැබේ.
08. ගැඹුරු නුවණ ඇත්තෙකු වේ.
09. විපුල වූ නුවණක් ලැබේ.
10. ජවන ප්‍රඥාව ලැබේ.

එබැවින් සත්පුරුෂයෝ තැන්පත් සිතින් යුතුව කුසල කර්ම කෙරෙත්වා.

## 09. සුවඳ පැන් ඉසීමේ අනුසස්

ඵුසිත කම්පිය හිමි විපස්සී බුදුරජාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නය වඩින විට වනුක් මල් මිටක් තම්බා ගත් සුවඳ පැන් ටිකක් ගෙන ඉස්ස පිනෙන් දෙදහස් පන්සිය වතාවක් සක්විති රජ විය. දෙදහස් පන්සිය වතාවක් දෙව්ලොව අධිපති සක්දෙවිඳු වී උපන්නේය. එසේම උපනූපන් ජීවිතයෙහි

01. හැම ආත්මයකදීම ඵුසිත යන නම ද
02. සැමදා බඹයක් පමණ සුවඳ වැසි පොද වසියි
03. සැතපුම් භාගයක් දුරට ඇඟෙන් සුවඳ විහිදේ
04. තම අතට ගත් සියල්ල සුවඳවත් වූහ.

කල්ප ලක්ෂයක් සැප විඳ එම කාලය පාරමී ද පුරාගෙන නිවන් සුවයද අවබෝධ කරගත් බව අපදාන පාලියෙහි සඳහන් වේ.

ගන්ධෝකීය හිමි පෙර ආත්මයක දී පියුමතුරා බුදුරජුන් පිට දුන් බෝධීන් වහන්සේට මහ වර්ෂාවේ නමුදු සුවඳ පැන් කලයක් පිදූ පිනෙන් දෙව්ලොව දිව්‍යාංගනාවන් පිරිවරාගෙන උසස් විමාන ලබා මනු ලොව දී ආබාධයෙන් තොරව, ශෝකයෙන් තොරව, ලතැවීමෙන් තොරව, පාරමී පුරාගෙන නිවන්දැකීමට ද ඒ පින උපනිශ්‍රය විය.

(අපදාන පාලි 54 වන අපදානය)

## 10. ධර්මශ්‍රවණානිසංස

ඒකධම්ම සවනීය හිමි පියුමතුරා බුදුසසුනේදී එක් ධර්ම දේශනයක් ශ්‍රවණය කළ පිනෙන් තිස් එක් වාරයක් සක්දෙවිඳු විය. විසි එක් වතාවක් සක්විතිරජ විය.

(අපදාන පාලි 427 වන අපදානය)

ධම්ම සවනීය හිමි පෙර තැම්පත් සමාධි ගත සිතින් නුවණ යොදා අනිච්ච සඤ්ඤා පටිසංයුක්ත එක් ධර්ම දේශනයක් ශ්‍රවණය කළ පිනෙන්

01. කල්ප තිස් දෙදහසක් දෙව් සැප වින්දේය
02. පනස් එක් වතාවක් දිව්‍ය රාජ්‍ය ලැබුවේය.
03. හැත්තෑ එක් වාරයක් සක්විති රජ විය

අප බුදු සසුනේදී ඒ පින උපනිශ්‍රය වී සත්හැවිරිදි වියේදීම රහත් බව ලැබුවේය.

(අපදාන 339 වන අපදානය)

එබැවින් තැන්පත් සිතකින් ධර්මය ශ්‍රවණය කරත්වා

## 11 ආහාර පිදීමේ අනුසස් විපාක

මෝසරාජ හිමි පෙර අත්ථදස්සී බුදුරජුන්ට තැන්පත් සිතින් නුවණ යොදා දඬුවැල් බෑයක් පූජා කළ පිනෙන් දාහතර වතාවක් සක්දෙවිඳු වුණා. පන්සිය වාරයක් සත්විති රජ වුණා. අටවිසි වතාවක් පෘථිවි රාජ්‍ය ලැබුවේය. අවසානයේ මේ පින නිවනට ද උපනිශ්‍රය වුණේය.

(අපදාන පාලි 35 වන අපදානය)

අධිමුත්ත හිමි අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ ප්‍රධාන මහ සංඝරත්නයට උක්ගස් දානයක් දුන් පිනෙන් කල්ප එක්දාස් අටසීයක් දුගතිගාමී නොවූ බව අපදාන පාලියෙහි සඳහන් වේ.

(අපාදන පාල 36 වන අපදානය)

කටච්ඡුභික්ඛා දායිකා ථෙරණිය පෙර එක් ජීවිතයක තිස්ස බුදුරජුන්ට එක් දත් හැන්දක් පිදූ පිනෙන් තිස්හය වාරයක් සක් දෙවිඳු ගේ මෙහෙසිය වූවාය. පනස් වතාවක් සක්විති රජුට අගමෙහෙසිය වූවාය.

(7 වෙනි ථේරී අපදානය)

උප්පල දායිකා ථෙරණිය පියුමතුරා බුදු සමයෙහි එක් භික්ෂුවකට පිණ්ඩපාත දානයක් හා වස්ත්‍රයක් පුදා දාස් වතාවක් සක් දෙවිඳුගේ මෙහෙසිය වූ අතර දහස් වතාවක් සක්විති මෙහෙසිය වූවාය. එසේම භික්ෂා දානය හේතුවෙන් එතුමියට සසර දීමෙම විපාකයන් ලැබී ඇත්තාහ.

(අපදාන පාලි උප්පල දායිකා අපදානය)

01. පැහැපත් වී ඉපදේ
02. විශිෂ්ඨ රූප සම්පත් ලැබේ
03. දකුම්කළු කෙනෙක් වේ
04. උසස් කුලවල උපදියි
05. සර්වාංග සම්පන්න ශෝභමාන රූප සම්පත් ලැබේ

ඒ වගේම ආයුෂ, වර්ණ, සැපය, බලය, නුවණ, යසස් භාවය යන ආනිසංස ලැබෙන බව ධර්මයෙහි සඳහන්කොට ඇත්තේය.

## 12. ඉදිකටු පූජාවේ විපාක

සුචිදායක හිමි විපස්සී බුදුරජුන්ට ඉදිකටු පූජාකළ පිනෙන් හත් වරක් සක්විති රජ විය. (94 වන අපදානය) පිළිඳිවච්ඡ අපදානයට අනුව මේ විපාක ලැබෙන්නාහ.

01. කුකුස් සිඳලීමේ ශක්තිය ලැබේ.
02. විශිෂ්ඨ රූප සම්පත් ලැබේ.
03. බොහෝ භෝග සම්පත් ලැබේ
04. තීක්ෂණ නුවණක් ලැබේ
05. ගැඹුරු වූ සියුම් ධර්ම කාරණා වහා වටහා ගැනීමේ ශක්තියක් ඇත්තෙකු වන්නේය.

## 13. වස්ත්‍ර පූජාවේ ආනිසංස

ඒකදුස්ස දායක හිමි පැහැදුනු සිතින් නුවණ යොදා පියුමතුරා බුදුරජුන්ට එක්වස්ත්‍රයක් පිදූ පිනෙන් තිස්හය වතාවක් සක්දෙවිඳු විය. තිස් තුන්වතාවක් රජවුණේය. මනුලොව දී සඳහන් අනුසස් ලැබී ඇත්තාහ.

01. රූමත් පුද්ගලයෙකු විය.
02. ගුණවන්තයෙකුවේ.
03. සතුරන්ට නොමැඩිය හැකිය
04. බොහෝ වස්ත්‍ර ලැබෙත්.
05. බොහෝ භෝග සම්පත් ලබති.
06. උඩු වියන් ලැබේ.
07. රන්වන්පාට ශරීරයක් ලැබේ.

මීට අමතරව පිළිඳිවච්ච අපදානයට අනුව මේ ආනිසංස ද ලැබෙන්නාහ.

08. දූවිලි නොඇලෙන සමක් ඇත්තෙකු වීම
09. කාන්තිමත් ශරීරයක් ලැබේ.
10. සිනිඳු ශරීරයක් ලැබේ

## 14. මෙට්ට පිදීමේ විපාක

සුවණ්ණ බිම්බෝහන හිමි ට පෙර මෙට්ටයක් පිදීමේ පිනෙන් සක්විති සැපත ඇතුළු බොහෝ සැප ලැබී ඇති බව අපාදන පාලියේ 271 වන අපදානයේ සඳහන් කොට ඇත. මෙට්ට පිදීමේ හේතුවෙන් පිලින්දිවච්ඡ හිමිට ප්‍රධාන අනුසස් සයක් ලැබී ඇත්තාහ.

01. සම වූ සිරුර ඇත්තෙක් වේ.
02. ගරු කරන ලද්දෙක් වේ.
03. මෘදු ශරීර ඇත්තෙක් වේ.
04. මනා දකුම් ඇති ශරීර ඇත්තෙක් වේ.
05. ඥානය ලැබේ.
06. පරිවාර සම්පත් ලැබේ.

## 15. ඡත්‍ර දානයේ විපාක

ඡත්‍ර දයක හිමි පෙර ජීවිතයක තම පුතා පැවදිව රහත් ව පිරිනිවය. සෑය දක වැඳ සුදු රෙදි කැල්ලක් සෑයට කුඩයක් කොට නැංවූ පිනෙන් කල්ප අනූහතරක් සැප විපාක ලැබුණ අතර ඒ පිනෙන් තෙවරක් සක්විති රජ විය.

ඒත ඥත්ත හිමි පෙර අත්ථදස්සී බුදු හිමිට සුදු කුඩයක් දරා සිටි පිනෙන් කල්ප හැත්තෑ හතක් සැප ලැබී ඇත. එසේම එම කුසල බලයෙන් හැත්තෑහත් වතාවක් සක් දෙවිඳු වූ අතර දහස් වතාවක් සක්විති රජ විය.

(412 වන අපදානය)

පිලින්දිවච්ඡ හිමිට ඡත්‍ර දානයේ අනුසස් අටක් ලැබී ඇත.

01. ශීතලෙන් පීඩා නොලැබේ.
02. තම ශරීරයෙහි කුණු නොඇලෙයි
03. උපද්‍රව නැත්තෙක් වේ.
04. හැම කල්හි අන්‍යයන් විසින් ගරු කරන ලද්දෙක් වේ
05. සියුම් වූ සමක් ඇත්තෙක් වේ
06. සිත පිරිසිදු වේ
07. උෂ්ණයෙන් පීඩා නොලැබේ
08. බොහෝ විචිත්‍ර කුඩ ලැබේ.

## 16. පාත්‍ර දානයේ විපාක

පත්තදායක හිමි සිද්ධාර්ථ බුදු හිමිට පාත්‍රයක් පූජා කොට කල්ප අනූහතරක් දුගතියකටනොගිය බව සඳහන් වේ.

(246 වන අපදානය)

පිළින්දිවච්ච හිමිට පාත්‍ර පිදූ පිනෙන් අනුසස් දහයක් ලැබී ඇත්තාහ

01. බොහෝ වටිනා රන් රිදී තැලි ලැබේ
02. උපද්‍රව නැත්තෙක් වේ
03. අනතුරු නැත්තෙක් වේ
04. අන්‍යයන්ගේ ගෞරවයට පාත්‍ර වේ
05. ආහාර පාන, වස්ත්‍ර, සයනාසන, පහසුවෙන් ලැබේ
06. ලැබෙන සම්පත් අකාලයේ විනාශ නොවේ
07. ස්ථිර සිත් ඇත්තෙකු වේ
08. හැම කල්හිම ධර්මයට කැමති වේ.
09. කෙලෙස් අඩු කෙනෙක්වේ
10. ආශ්‍රව ද රහිත වෙත්.

## 17. දැලි පිහියා පිදීමේ විපාක

01. හැම කල්හිම ශූරයෙක් වේ.
02. තැන්පත් සිත් ඇත්තෙක් වේ
03. විශාරද පුද්ගලයෙකු වේ
04. ධෛර්ය වන්තයෙක් වේ
05. වීර්ය වන්තයෙක් වේ
06. ඔසවා ගන්නා ලද සිත් ඇත්තෙක්වේ
07. තීක්ෂණ නුවණ ලැබේ

වාසිදායක හිමි මීට කල්ප අනූ හතරකට පෙර පිහියක් දුන්පිනෙන් කල්ප අනූහතරක් යන තුරුම අපාගත වී නැත.

(අපදාන පාලි 240 වන අපදානය)

## 18. මහ පිහියා පිදීමේ විපාක පහ

01. යහපත් සිත් ඇත්තෙක් වේ
02. වීර්ය වන්තයෙක් වේ
03. ක්‍ෂාන්තිවාදී පුද්ගලයෙක් වේ.
04. මෛත්‍රී නමැති ආයුධය ලැබේ
05. කෙලෙස් සිඳලන අනුත්තර වූ නුවණ ලැබේ

(පිළින්දිවච්ඡ අපදානයට අනුවය)

## 19. නිය කපන අවි පිදීමේ විපාක පහ

01. බොහෝ දැසි දස්සන් ලැබේ
02. ගව අශ්ව සම්පත් ලැබේ
03. ආරක්ෂක මෙහෙකරුවන් ලැබේ
04. කෙස් රැවුල් කපන්නන් ලැබේ
05. බත් පිසින්නන් ලැබේ

(පිළින්දිවච්ඡ අපදානයට අනුව)

## 20. පවන් අතු පිදීමේ විපාක අට

01. ශීතලෙන් හා උෂ්ණයෙන් පීඩා නොලැබේ
02. ශරීර දාහ නැත්තෙකු වේ
03. මානසික දාහ නැත්තෙකු වේ
04. රාග ගිනි නිවීමේ ශක්තිය ලැබේ
05. ද්වේශ ගිනි නිවීමේ ශක්තිය ලැබේ
06. මෝහ ගිනි නිවීමේ ශක්තිය ලැබේ
07. මාන ගිනි නිවීමේ ශක්තිය ලැබේ
08. මිසදිටු ගිනි නිවීමේ ශක්තිය ලැබේ.

(පිළින්දිවච්ඡ අපදානය)

## 21. පෙරහන්කඩ පිදීමේ විපාක පහ

01. දීර්ඝායුෂ ලැබේ
02. සොර සතුරන්ට හිංසා කළ නොහැක්කෙකු වේ
03. අවි ආයුධ වලින් පීඩා නොලබයි
04. වස විස වලින් හිංසා නොවෙයි
05. අතුරු මරණයකට පත් නොවෙයි.

(පිළින්දිවච්ඡ අපදානය)

## 22. තෙල් ලබාගන්නා බඳුන් පිදීමේ විපාක

01. මනා රූ ඇත්තෙක්වේ
02. මනා වචන ඇත්තෙක් වේ
03. උසස් සිත් ඇත්තෙක් වේ
04. අවික්ෂිප්ත සිත් ඇත්තෙක් වේ
05. සකලාරක්‍ෂාවෙන් ආරක්ෂිත වූයේ ද වේ.

## 23. චෛත්‍යය පිරිසිදු කිරීමේ විපාක

පභංකර හිමි පෙර ජීවිතයක වන කාර්මිකයෙකු ලෙස සිටි මෙතුමා කැලේ යන විට පියුමතුරා බුදු සම්දුගේ ධාතු නිදන් කොට සාදා ඇති චෛත්‍යයෙහි කැලේ වැවී වන ග්‍රහණයට හසුව තිබෙනවා දැක පිරිසිදු කොට අට වරක් චෛත්‍යයට වැඳ පිටු නොපා ගිය කුසලයෙන් තව්තිසා දෙව්ලොව ඉපදුනි. මහ රන් විමනක්ද පහල වුනි. තුන්සිය වතාවක් සකදෙව්ඳු වී උපන්නේය. විසිපස් වතාවක් සක්විති රජ විය. මනුලොව දී මේ විපාක ලැබුනාහ.

01. මහත් භෝග සම්පත් හැම විටම ලැබීම
02. වනයට ගියේ ද ඒ වනය තමටා පිහිට ලෙස පැවතීම
03. වනයේ කුණු, කටු ආදිය මාර්ගයෙන් ඉවත්වීම
04. කුෂ්ඨ රෝගයද, ගණ්ඩ, කිලෙස, මී මැස්මොර, විතච්ඡිතානම් කුෂ්ඨ රෝග ද, දද කැසිලි ආදිය ද නොවීම
05. ස්වල්ප මාත්‍ර ද පිළිකාවක් ශරීරයේ හට නොගැනීම
06. රන් පැහැපත් සිරුරක් ලැබීම
07. අකමැති දෑ බැහැර වේ. කැමති දෑ එළඹේ.
08. සිත එකඟ වේ. මනාව සමාධි වේ
09. කල්ප ලක්ෂයක් තුළ දුගතියට නොවැටෙයි

අවසානයේ ශාන්ත නිවන් සුව ලැබීමට ද මේ පින උපනිශ්‍රය වී ඇති බව 336 වන අපදානයේ දැක්වේ.

## 24. ඉදිකටු ගුලා පිදීමේ විපාක තුන

01. චිත්ත සුඛය ලැබේ.
02. කායික සුඛයට ලාභීවේ
03. සැප ඉරියව් ඇත්තෙක් වේ.

(පිළින්දිවච්ඡ අපදානය)

## 25. අංස කඩ පිදීමේ විපාක තුනකි

01. පරසිත් දන්නා නුවණ ලැබේ.
02. පෙර ජීවිත සිහිකරන නුවණ ලැබේ.
03. මනා සවි ඇත්තෙක් වේ.

## 26. ඉන පටි පිදීමේ විපාක සය

01. සමාධීන්හි කම්පා නොවේ
02. සමාධියෙහි හුරු පුරුදු බව ඇත්තේවේ.
03. නොබිඳෙන පිරිස් ඇත්තේ වේ
04. ඇදහිය යුතු වචන ඇත්තෙක් වේ
05. එළඹ සිටි සිහිය ඇත්තේ වේ
06. බය ඇති හැඟීම නොවේ.

## 27. පාත්‍ර තබන ආධාර පිදීමේ විපාක

පාත්‍ර ආධාර හිමි පෙර සිඛී බුදු හිමිට පාත්‍ර ආධාරකයක් පුදා සමන්තවර්ණ නම් සක්විති රජ විය.

ඛුජ්ජුත්තරාව මහා ධර්ම කථික උවැසියක් වුණේ ද පෙර පසේ බුදුන්ට තම අතේ දාගෙන සිටි වළලු අට ගලවා පාත්‍ර ආධාර ලෙස පිදූ පින හේතුවෙනි. පාත්‍රය නොවැටී දරා සිටීමට මෙය උපකාර වුණා වගේම ඇයට ද ධර්මය දරා සිටීමේ ශක්තිය ඇති විය.

(මනෝරථ පූරණී අටුවාව 238 පිටුව)

පිළින්දිවච්ඡ හිමිට පාත්‍ර ආධාර පුදා අනුසස් පහක් ලැබුණි.

01. කිසිවකින් කම්පා නොවන සිතක් ලැබේ.
02. මනාව සිහිය පිහිටත්.
03. ධර්මය දරා ගැනීමට නුවණ ලැබේ.
04. දරාගත් ධර්මය අමතක නොවෙත් - 1
05. මනාව ධර්මය නිශ්චිත ලෙස වැටහෙනු ලැබේ.

## 28. භාජන පිදීමේ විපාක

භාජනදායක හිමි පෙර කුඹල්කරුවෙක් වී සිටිය දී භික්ෂූන්ට භාජන දුන් පිනෙන් සක්විති රජ ද වී කල්ප අනූ එකක් සැපවිඳ අවසානයේ නිවන් සැප ද ලැබීමට එය උපනිශ්‍රය වී ඇත.

(අපදාන පාලි 232 වන අපදානය)

පිළින්දිවච්ඡ හිමිට භාජන දන්දීමෙන් විපාක තුනක් ලැබුණාහ.

01. හැමකල්හි වටිනා භාජනම පරිභෝනයට ලැබේ.

02. පතිවත ඇත්තාවූ භාර්යාවන් ද, දාසි දස්සන්ද යාන වාහන ද ලැබෙන්නාහ.

03. විද්‍යා ද, මන්ත්‍රයන් ද, නානා ආගමින්ද, සියලු ශිල්ප ද ඉගෙන ගැනීමේ ශක්තිය ද ලැබේ.

## 29. තැටි පිදීමේ විපාක තුන

තැටි යනු පිඟන් ආදී නොගැඹුරු බඳුන් වේ. ඒවා පිදීමෙන්

01. නොයෙක් ආකාර විසිතුරු තලි ලැබේ.

02. වතෙහි ද ගුණයෙහි ද ප්‍රතිපත්තියෙහි ද මැනවින් පවතින්නෙක් වේ.

03. පිරිසිදු ආචාර ඇත්තෙකු වේ.

(පි.අප.අනුව)

## 30. බෙහෙත් ඖෂධ පිදීමේ විපාක

මෙත්ත ගුත්ත හිමි සුමේධ බුදු රජුන්ට ගිතෙල් පිදූ පිනෙන් අට වරක් සක්දෙවිඳු වුණේය. පනස් එක්වරක් සක්විති රජකම ලැබුවා. එසේම හැම ජීවිතයකම පාහේ අප්‍රමාණ භෝග සම්පත් ලැබුවා හ. අවසානයේ ඒ පින නිවනට ද උපනිශ්‍රය වූ බව 403 වන අපදානයේ පෙන්වා ඇත.

පිළින්දිවච්ඡ හිමිට බෙහෙත් පිදීමෙන් අනුසස් දහයක් ලැබුණාහ.

01. දීර්ඝායුෂ ලැබේ.
02. බලවන්තයෙකු වේ.
03. වීර්යය වන්තයෙකු වේ.
04. වර්ණ සම්පතක් ලැබේ.
05. යසස් ඇත්තෙක් වේ.
06. සැප ඇත්තෙක් වේ.
07. උපද්‍රව නැත්තෙක් වේ.
08. අන්තරා නැත්තෙක් වේ.
09. හැම කල්හි ගරු කරන ලද්දෙක් වේ.
10. ප්‍රිය විප්පයෝග දුක් නොලැබේ.

helaboduhavula@gmail.com

## 31. පාවහන් පිදීමේ විපාක

උපාහනදායක හිමි චන්දන නම් ශ්‍රාවකයන් වහන්සේට එකඟ වූ සිතින් නුවණ යොදා පාවහන් යුවලක් පිදූ පිනෙන් කල්ප අනූ එකක් දුගතියට නොගියේය.

පනාධිදායක හිමි අනෝමදස්සී බුදුරජාණන් වහන්සේට පයේ දා සිට පාවහන් යුවලපුදා පනස් පස් වතාවක් දෙදෙව්ලොවටඅධිපති සක්දෙව්ඳු ව උපන්නේය. දහස් වරක් සක්විති රජ විය. ඒ පිනෙන් සසර ගමනේ දී

01. වේගයෙන් යා හැකි වාහන ලැබුණා.
02. ප්‍රසාද, රන්සිවිකා, වටිනා ඇතුන්, අසුන් ද ලැබුණාහ.
03. අග්‍ර ගණයේ පාවහන් ද ලැබී ඇත.

(අපදාන පාලි 479 වන අපදානය)

## 32. දියපිස්නා වස්ත්‍ර පිදීමේ විපාක

01. රන්වන් පැහැ ඇත්තෙකු වේ.
02. රජස් නැත්තේ වේ.
03. ශරීරයෙන් නික්මෙන රැස් ඇත්තෙක් වීම
04. තේජස් ඇත්තේ වේ.
05. සිනිඳු සිරුරක් ඇත්තේ වේ.
06. සිරුරේ කුණු නොඇලේ

(පිළින්දිවච්ඡ අපදානය)

## 33. සැරයටි පිදීමේ විපාක

දණ්ඩදායකහිමි මහා සංඝරත්නයට උණලීයකින් හැරමිටියක් කොට දීමේ පිනෙන් කල්ප අනූ හතරක් දුගතියට නොගිය අතර දෙව් මිනිස් සැපම ලැබුවේය.

පිළින්දිවච්ඡ හිමිට සැරයටි පිදීමෙන් අනුසස් හයක් ලැබුණාහ.

01. බොහෝ පුත්‍රයන් ඇත්තේ වේ.
02. තැති ගැනීම් නොවේ.
03. හැම කල්හි අනුන් විසින් පීඩා නොකළ හැක්කේ වේ.
04. සකලාරක්ෂාවෙන් ආරක්ෂාව ලැබේ.

05. වැරදි නැත්තෙකු වේ.
06. චිත්ත පීඩා ඇති නොවේ.

## 34. බෙහෙත් අඳුන් පිදීමේ විපාක අට

01. මහත නෙත් ඇත්තෙක් වේ. 2, 3, 4, ඇසේ සුදු කළු රතු පැහැයන් මනාකොට ඇත්තේ වේ.
05. නොකැඩුනා වූ ප්‍රසාද ජනක ඇස් ඇත්තෙක් වේ.
06. සියලු රෝගයන්ගෙන්ම මිදුනෙක් වේ.
07. දිවැස් ලැබීම
08. අනුත්තර වූ ප්‍රඥා චක්ෂුසය ලැබේ.

(පිළින්දිවච්ඡ අපදානය)

## 35. යතුරු හා කොපු පිදීමේ විපාක

01. යතුරු පිදූ පිනෙන් ධර්ම ද්වාරය විවෘත කරගන්නා ඥානය නමැති යතුර ලැබේ.
02. යතුරු කොපු දීමෙන් ක්‍රෝධය මද වේ.
03. වෙහෙස නැත්තේ වේ.

(පිළින්දිවච්ඡ අපදානය)

## 36. පටි පිදීමේ විපාක පහ

01. නොසැලෙන සමාධිය ඇත්තේ වේ.
02. සමාධියේ වශීභාවය ඇත්තෙක් වේ.
03. නොබිඳෙන පිරිස් ඇත්තේ වේ.
04. හැම කල්හිම විශ්වාස කරන කතා ඇත්තෙක් වේ.
05. මහත් භෝග සම්පත් ඇත්තෙක් වේ.

(පිළින්දිවච්ඡ අපදානය)

## 37. බෝමලු ආදිය ඇමදීමේ විපාක

සකංසම්මජ්ජක හිමි විපස්සී බුදු රජුන් බුදුවීමට පිට දුන් පළොල් බෝධි මලුව ඇමදීමේ පිනෙන් පහත සඳහන් අනුසස් ලැබූහ.

01. නිශ්චල වූ සමාධිගත සිත් ඇත්තෙකු වේ.
02. පිරිසිදු පුද්ගලයෙකු වේ.
03. වැරදි නැති නිර්මල පුද්ගලයෙකු වේ.

04. ශෝක නොදනේ
05. චිත්තපීඩා දුවිලි නොවේ.
06. කුෂ්ඨ රෝග නොසෑදේ.
07. ගෙඩි රෝග නොසෑදේ.
08. කැසිලිරෝග නොසෑදේ
09. මී මැස් මොර නොසෑදේ
10. විතච්ජිකා නම් වූ සම ගැලවී යන කුෂ්ඨ රෝග නොසෑදේ
11. දද රෝග නොසෑදේ
12. කසා සැරව ගලන රෝග නොසෑදේ
13. වැලපීම් නැත්තෙක් වේ.
14. තැති නොගනිත්
15. ඍජු සිත් ඇත්තෙක් වේ.
16. පැහැදිලි සිත් ඇත්තෙක් වේ.
17. කැමති කැමති සමාධීන් ලැබීමේ ශක්තිය ලැබේ.

(අපදානපාලි 421 වන අපදානය)

බෝධි සම්මජ්ජක හිමි ට පෙර ජීවිතයක දී බෝමළුවේ ගොඩගැසුණු බෝපත් දක එයගෙන බැහැරට දමූ පිනෙන් අනුසස් විස්සක් ලැබී ඇත. ඒ අනුව බැලූ කල ශ්‍රද්ධාවෙන් තෑන්පත් සිතින් නුවණ යොදා බෝ මලුව ඇමැද්දත් පහත සඳහන් විපාක ලැබේ.

18. දුගතියට නොවැටී දෙව් මිනිස් සැප ලැබේ.
19. උසස් කුලයකම ඉපදේ
20. මනා ඇඟ පසඟ ඇත්තෙක් වේ.
21. ආරෝහ පරිණාහ දේහයක් ලැබේ.
22. පිරිපුන් අවයව ඇත්තෙක් වේ.
23. විශිෂ්ඨ රූප සම්පත්තියක් ලැබේ.
24. රන්වන් පාට දේහයක් ලැබේ.
25. මෘදු මොලොක් සිවියක් ඇත්තෙක් වේ.
26. සිනිඳු සියුමැලි ජීවිතයක් ලැබේ.
27. සිරුරේ දූලි කුණු නොතැවරේ.
28. අවු සුළං වලින් පීඩා නොවෙයි.
29. සිරුරින් දහඩිය නොවැගිරෙයි
30. කායික මානසික රෝගාබාධ නැත්තෙක් වේ.
31. සතුරන් නැත්තෙක්වේ.

helaboduhavula@gmail.com

32. නොඅඩු වූ භෝග සම්පත් ලැබේ.
33. ගින්නෙන් ජලයෙන් රජුන්ගෙන් සොරුන්ගෙන් බියක් නොවේ.
34. තමාගේ සිත නොරිදවන සේවක සේවිකාවන් ලැබේ.
35. අකල් මරණයන්ට පත් නොවෙයි.
36. සියල්ලෝම තමාට සැප කැමැත්තෝම වෙත්
37. මහා යසස් ඇත්තේ වේ.

අවසානයේ මේ පින නිවනට ද උපනිශ්‍රය වී නිවන් සැප ද ගෙන දෙන්නාහ. (අපදාන පාලි 528 වන අපදානය)

## 38. දුම්බොන පයිප්ප පිදීමේ විපාක තුන

නාසිකාවේ මස්දලු ආදිය සෑදී ඇති ගිලන් භික්ෂූන්ට දුම්පානය කළාට වරදක් නොවේ. එවැනි භික්ෂූන්ට දුම්බොන පයිප්ප පිදීමෙන්

01. සිහිය සෘජුවේ.
02. නහර මනා කොට සම්බන්ධ ඇත්තවුන් වන්නාහ
03. දිව්‍ය නේත්‍ර ලැබෙන්නාහ යැයි දක්වා ඇත

(පිළින්දිවච්ඡ අපදානය)

## 39. මහ සැලි හා කරඬු පිදීමේ අනුසස් දහය

01. සැම කල්හිම ආරක්ෂාව ඇත්තේ වේ.
02. සැපයෙන් යුක්ත වේ
03. මහත් යසස් ඇත්තේ වේ
04. සියුමැලි වේ
05. සියළු අනතුරු වලින් මිදුනේ වේ
06. මහා ගුණවන්තයෙකු වේ
07. විචිත්‍ර වූ මහත් සැලි හා කරඬු ලැබේ
08. ඇත්, අස්, රථයන්ට ලාභී වේ
09. බිය නැත්තේ වේ
10. නොනැසෙන භෝග සම්පත් ඇත්තේ වේ

(පිළින්දිවච්ඡ අපදානය)

## 40. අඳුන් නල පිදීමේ විපාක හතර

01. සර්ව ලක්ෂණයෙන් යුක්ත ජීවිතයක් ලැබේ.
02. දීර්ඝායුෂ ලැබේ.

03. නුවණැත්තෙක් වේ.
04. සකලායාසයෙන්ම මිදුනෙක් වේ

## 41. කුඩා පිහියා හා ලොම් උදුරන අඬු දීමේ විපාක

පිහියා පිදීම නිසා අතුල්‍ය වූ පාර්ශුද්ධ වූ කෙලෙස් සිඳිනා නුවණ ලැබේ. අඬු පිදීමෙන් කෙලෙස් උදුරන නුවණ ලැබෙන බව අපදාන පාළියේ පිළින්දිවච්ඡ අපදානයේ දක්වා ඇත.

## 42. නස්‍ය උපකරණ පිදමේ විපාක අට

එනම් ගුණ ධර්ම අටකින් යුක්ත වීමේ ශක්තිය ලැබෙන බව පිළින්දිවච්ඡ අපදානයේ සඳහන් වේ. ඒ ගුණ ධර්ම නම්,

01. ශ්‍රද්ධාව
02. ශීලය
03. පව් කිරීමට ලැජ්ජා ඇති බව
04. පව් කිරීමට බිය ඇති බව
05. බහුශ්‍රැත බව
06. ත්‍යාගවන්ත බව
07. ඉවසීම, ප්‍රඥාව යන මේවාය.

## 43. පුටු පිදීමේ විපාක

හේමක හිමි පියදස්සී බුදුරජාණන් වහන්සේට සෘධිබලයෙන් රන් පුටුවක් මවා දුන්පිනෙන් හැත්තෑපස් වතාවක් සක්විති රජ විය. දෙතිස් වතාවක් දෙදෙව් ලොවට අධිපති සක්දෙවිඳු විය.

ඒකාසනදායක හිමි පියුමතුරා බුදුරජුන්ට දඬු මැස්ස මත ආසනයක් පනවා දුන් පිනෙන් පනස් වතාවක් ශක්‍ර දේවේන්ද්‍ර සම්පත් ලැබුවේය. අසූවතාවක් සක්විති රජ විය.

(අපදාන පාලි 423 වන අපදානය)

ඒකාසනදායිකා තෙරණිය පෙර එක් ජීවිතයක දී පැහැදුන සිතින් තැන්පත් සිතින්, නුවණින් යුක්තව එක් හිමිනමකට වැඩසිටීමට අසුනක් පනවා දුන් පිනෙන් අසූවතාවක් සක් සෙව්ඳුගේ බිරිඳ වී උපන්නාය. හැත්තෑහත් වතාවක් සක්විති රජුගේ මෙහෙසි වූණාය. මනුලොව දී පහත සඳහන් අනුසස් ලැබී ඇත.

helaboduhavula@gmail.com

01. හිඳ ගැනීමට රන් රිදී අසුන් පහලවේ.
02. චිත්තපීඩා ඇතිනොවේ
03. මෙට්ට පලස් ආදිය බොහෝ ලැබේ
04. බොහෝ භෝග සම්පත් ලැබේ
05. උසස් කුල සම්පත් ලැබේ
06. චෛතසික වේදනාවන්ට පත් නොවේ.
07. ලස්සන වී උපදියි
08. තමා නාවන්න, කවන්න, පොවන්න, සතුටු කරන්න, සුවඳගල්වන්න බොහෝ පිරිවර ලැබේ.

අවසානයේ මේ උතුම් පින නිවනටද උපනිශ්‍රය වී ඇත.

(ඒකාසදායිකා ථෙරී අපදානය)

මීට අමරතව පිළින්දිවච්ඡ අපදානයේ මේ විපාක ද පෙන්වා ඇත.

09. සියල්ලන්ගේම ගෞරවයට පාත්‍ර වේ
10. බොහෝ කීර්ති ඇත්තෙක් වේ.
11. දීමෙන් ඇලුණු සිත් ඇත්තෙක් වේ.
12. බොහෝ පුටු සසරදී ලැබේ යනුවෙනි.

## 44.කොට්ට පිදීමේ විපාක සය

01. වටිනා කොට්ට ලැබේ.
02. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි හිත එළවා විසීමට ශක්තිය ලැබේ
03. ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත වේ
04. සිත සමාධි කරගත හැකිවේ
05. වත් පිළිවෙත් ආචාර සමාචාර ගුණවලින් යුත් උතුමෙකුවේ.
06. බෝධිපාක්ෂික ධර්මයන් හා ත්‍රී ශික්ෂාවන් අනුගමනය කිරීමට ශක්තිය ලැබේ.

(පිළින්දිවච්ඡ අපදානය)

## 45. පිදුරු බිසි පිදීමේ විපාක

මෙහි විපාක ලෙස බොහෝ උසස් වටිනා පයඑංක ලැබෙන බව පිළින්දිවච්ඡ අපදානයේ දක්වේ.

## 46. පා පුටු පිදීමේ විපාක දෙක

01. බොහෝ යාන වාහන ලැබීම

02. භාර්යාවෝ ද දාසි දස්සන් ද කම්කරුවන් ද තමාට මැනැවින් උපස්ථාන කරන්නාහ.

## 47. පාලම් ඒ දඬු ඉදිකිරීමේ විපාක

ධෝතක හිමි පියුමතුරා බුදුරජානණ් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නයට පාලමක් ඉදිකර පූජා කළ පිනෙන් පහතසඳහන් විපාක ලැබී ඇති බව අපදානයේ දක්වා ඇත.

01. පර්වතයකින් හෝ ගසකින් වැටෙන්නට ගියේද පිහිට ලබයි.
02. සතුරන්ට මැඩලිය නොහැක්කේ වේ.
03. ලැබෙන වස්තුව සොරු පැහැර නොගනිත්.
04. අන් අය අවමන් නොකරත්.
05. සතුරු බලවේග ජයගත හැකිවේ.
06. එළිමහනේ ගියේ ද දැඩි අවුවෙන් තැවනේ ද දුක් වේදනා නොදැනේ.
07. දෙව් මිනිස් දෙගතියෙහි කැමැති පරිදි ඇත් වාහන පහළවේ.

අවසානයේ නිවනට දමේ පින උපනිශ්‍රය වන්නේය.

## 48. ඇඟ ගල්වන තෙල් පිදීමේ විපාක පහ

01. නීරෝගි බව ලැබේ.
02. රූප සම්පත් ලැබේ.
03. වහා ධර්මය දැනගැනීමට සමත් වේ.
04. බොහෝ ආහාර පාන ලැබෙත්
05. දීර්ඝායුෂ ලැබෙත්

(පිළිඳිවච්ඡ අපදානය)

## 49. ගිතෙල් හා තෙල් (පානය කරන) පිදීමේ විපාක

සප්පදායක හිමි ඵුස්ස බුදුරජාණන් වහන්සේට ගිතෙල් ටිකක් පිදූ පිනෙන් සක්විති රජ වී ඇත.

(අපදාන පාළි 166 වන අපදානය)

පිළින්දිවච්ඡ හිමිට ගිතෙල් හා තෙල් පිදූ පිනෙන් අනුසස් පහක් ලැබී ඇත්තාහ.

01. බලවන්තයෙක් වේ.
02. රූප සම්පත් ලැබේ.
03. සිත් සතුටු කරන දරුවන් ලැබේ.
04. රෝග පීඩා නැත්තේ වේ
05. පිරිසිදු ජීවිතයක් ලැබේ.

## 50. මුව පිරිසිදු කරන දැ දීමේ විපාක පහ

01. පිරිසිදු උගුර ඇත්තේ වේ.
02. මිහිරි හඬ ඇත්තේ වේ.
03. කාශරෝග නැත්තේ වේ.
04. ස්වාසරෝග නැත්තේ වේ.
05. දුගඳ නොහමන, සුවඳ හමන මුව මඩලක් ලැබේ.

(පිළිවන්දිවච්ඡ - අපදානය)

## 51. දී ආදිය පිදීමේ විපාක

දී පිදීමෙන් කායගතා සති භාවනාව වැඩීමට මහත් දිරියක් ලැබේ. මී පැණි පූජා කිරීම අතුල්‍ය වූ අනුපම වූ විමුක්ති රසය ලැබ ගැනීමට හේතු වේ. නොයෙක් රස වර්ග පිදීමේ හේතුවෙන් සතර ශ්‍රමණ ඵල රස විඳ ගැනීමේ ශක්තිය ලැබේ. කතුරු පිදීමේ හේතුවෙන් කෙලෙස් සිඳලන නුවණ ලැබේ.

## 52. සර්ව දානයෙහි විපාක

ඇත්, අස්, රථ පාබල යන සිවුරඟ සේනාව නිතර හෙතෙම පිරිවරත් තව ද සියළු ආභරණයෙන් සරසන ලද හැට දහසක් රථයෝ හැම ජීවිතයකම පාපේ ලැබෙත්. එසේම හැට දහසක් තුරඟයෝ ද මැනවින් අලංකාර කරන ලද හේරිනු ද තමාට සතුට ගෙන දෙන්නෝය. මැනවින් අලංකාර කරන ලද සයාසු දහසක් ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහු පළඳින මිණි කොඩොල් ඇත්තාහු දිගඇසිපිය ඇත්තාහු සිනා සහති වූවා හු මනා වූ ශරීරාවයව ඇත්තාහු සිහින් කටි ප්‍රදේශ ඇත්තාහු නිරන්තරයෙන්ම හෙතෙම පිරිවරන්නාහුය. මෙය සර්ව දානයෙහි විපාක වේ. කල්ප තිස්දහසක් දෙව්ලොව සැප ලැබේ. දහස් වතාවක් දෙදෙව් ලොව අධිපති සක්දෙවිඳු වන්නේය. දහස් වතාවක්

සක්විති රජව උපදින්නේය. මෙසේ වන්නේ හිත තැන්පත්කරගෙන ශ්‍රද්ධාව උපදවාගෙන නුවණ යොදා සියල්ල පිදීමෙන් බව අවධාරණය දත යුතුය.

## 53. දෙපාවල සඳුන් ගැල්වීමේ විපාක

තෝදෙය්‍ය හිමි සුමේධ බුදුරජාණන් වහන්සේගේ දෙපාවල සඳුන් ගැල්වූ පිනෙන් බොහෝ ආනිසංස ලබා ඇත.

01. සියල්ලන් විසින් පිළිගන්නා ලද වචන ඇත්තෙක් වේ.
02. ශ්‍රේෂ්ඨ වූයේ වේ.
03. සෘජු සිත් ඇත්තේ වේ.
04. එසේම කල්ප විසිපහක් ඇඟෙන් ප්‍රභා විහිදී ඇත.
05. ඒ පිනෙන් කල්ප දෙදහස් හයසියයක් දෙව්ලොව සැප විඳින්න ලැබුණා.
06. දහස්වරක් සක්විති රජවිය.
07. බොහෝ වාර ප්‍රදේශ රාජ්‍යයන්ද ලැබුණා.

අවසානයේ අප බුදු සසුනේ නිවන් සුවය ද අවබෝධ කරගැනීමට ඒ පින උපනිශ්‍රය වූ බව 408 වන අපදානයේ දැක්වේ.

## 54. මල් රේණු, මල්වියන් ආදිය පිදීමේ විපාක

රේණු පූජක හිමි විපස්සී බුදුරජුන්ට නාමල් රේණු පිදූ පිනෙන් රේණු නම් සක්විති රජ බවට පත්වුණා. අවසානයේ නිවන් සැපයට ද එය උපනිශ්‍රය වුණා.

(110 වන අපදානය)

තිණසුලක හිමි තිස්ස බුදුරජාණන් වහන්සේට බෝලිද්ද මල් පුදා විසිපස් වතාවක් සක්දෙවිඳුව උපන්නාහ. හැත්තෑපස් වතාවක් සක්විති රජව උපන්නාහ. අවසානයේ නිවන් සුවය ලබාගත්තා.

(413 වන අපදානය)

අතිඡත්තිය හිමි අත්ථදස්සී බුදුරජාණන් වහන්සේගේ ධාතු නිදන්කොට හැදූ චෛත්‍යයට මල් වියනක් පුද කල්ප එක්දහස් හත්සියයක් අපාගත නොවීය. එතරම් කාලයක් දිව්‍ය රාජ්‍යද කරන්න ලැබුණු බව 141 වන අපදානයේ දක්වා ඇත.

## 55. කුටි පූජාවේ විපාක

නළ කුටිදායක හිමි පෙර නාරද බුදුරජාණන් වහන්සේට බට දඬු වලින් කුටියක් කොට පූජාකළපිනෙන් තිස්හතර වතාවක් සක්විති රජ විය. අවසානයේ නිවන් සැපද ලැබූනාහ.

(අපදාන පාලි 499 වන අපදානය)

නළාගාරික හිමි නාරද බුදු හිමිට බට කිලියක් කොට ඒ මත තෘණ අතුරා පිදූ පිනෙන් කල්ප දාහතරක් දෙව්ලොව සැප වින්දා. හැත්තෑ හතර වතාවක් සක්විති රජ විය. අවසානයේ සිව්පිළිසිඹියාලාභීව රහත් වීමට ද ඒ පින උපනිශ්‍රය විය.

(අපදාන පාලි 345 අපදානය)

තිණකුයිදායක හිමි මීට කල්ප අනූ එකකට පෙර දාසයෙක්ව ඉපිදි සිටියදී දිනක් කැලයට ගිය විටක දී ලී කැලි හයක් ගෙන දෙක දෙක කතිර සිටිනු ලෙස බැද ඒ මත තෘණ අතුරා කුටියක්කොට මහ සංඝරත්නයට පිදූ පිනෙන්,

01. තව්තිසා දෙව්ලොව දෙව් විමනක් පහල වුණා
02. උපතුපන් තැන තම සිතේ හැටියට ප්‍රාසාද පහළ වුණා
03. බිය, තැති ගැනීම්, ලොමු දෑහැ ගැනීම්, නැත්තෙක් වේ.
04. සිංහ, ව්‍යාඝ්‍ර, වලස් වෘක, කරබානා වලස් ආදී වන සතුන්තමා යනවිට පාරෙන් ඉවත්වේ.
05. සර්පයන්, භූතයන්, නාගයන්, කුම්භාණ්ඩයන්, රකුසන් තමා යන විට මාර්ගයෙන් ඉවත් වේ.

අවසානයේ අප බුදු සසුනේ දී ශාන්ත නිවන් සුවයට පත්වීමට ඒ පින හේතු වුණා.

(අපදාන පාලි 337 වන අපදානය)

ආවාසයක් කොට පූජා කිරීම සියල්ල දුන්නා වේයයි කිදද සූත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ වදාරා තිබේ.

## 56. ධර්ම දානයේ විපාක

තිලොවක තිලක වූ සම්මා සම්බුදු රජාණන් වහනසේ "සබ්බ දානං ධම්ම දානං ජිනාති" යයි වදාරා ඇති පරිදි ධර්ම දානමය පින සියළුම දානමය පින්කම් අභිභවනය කරන බව දත යුතුය. එහි ඇති අගය මෙසේ දත යුතුය.

"සබ්බෙපි හිම චක්කාල ගබ්භෙහ් යාව බ්‍රහ්ම ලෝකා
නිරන්තරං කත්වා චීවරානි දදෙය්‍ය තස්මිං සමාගමේ
චතුප්පදිකාය ගාථාය කථානු මෝදනාව සෙට්ඨා"
(ධම්මපදට්ඨ කතා 760 පිටුව)

මෙහි සරල අර්ථය නම් ඉදින් චනාහි සක්වල ගැබ සිට නේවසඤ්ඤා නාසඤ්ඤායතන අරූපි බඹලොව දක්වා අතරක් නැතිව සිටින සේ වඩා හිඳවූ බුදු පසේ බුදු මහරහතන් වහනසේලාට කෙසෙල් බඩ (ගොබ) මෙන් අතිශයින්ම දුහුල් සිනිඳු සිවුරු දෙන්නේ වේද, ඒ චීවර දානමය පින්කමට ද වඩා එහි සතර පද ගාථාවකින් හෝ කරන ලද අනුමෝදනාවම ශ්‍රේෂ්ඨ වේ කියාය. තවද, "තං හි දානං තස්සා ගාථාය සෝලසිං කලං නාග්ඝතී" යයි එහි වදාරා ඇති පරිදිත් සක්වල ගලේ සිට භවාග්‍රය දක්වා අතරක් නැතිව බුදු පසේ බුදු මහරහතන් වඩා හිඳුවා දුන් දානයෙහි විපාකය, සතර පද ගාථාවකින් අනුමෝදනා බණ කියා ලද විපාකයෙන් සොළොස් කලාවකුදු (දහසයෙන් කොටසකුදු) නොවටී යනුවෙන් දක්වා ඇත. මෙසේ බුදු බණ පදයක් නමුදු දේශනා කිරීමට ශ්‍රවණය කිරීම මහත් ඵල ගෙන දේ යයි වාදාර ඇත. තව දුරටත් මෙය විග්‍රහ කරන ධම්මපදට්ඨ කතාව මෙසේ කියා ඇත.

"තථාරූපාය ඒව පරිසාය පණීත පිණ්ඩපාතස්ස පත්තේ පූරෙත්වා දින්න දානතෝපි. සප්පිතේලා දීනං පත්තේ පූරෙත්වා දින්න භේසජ්ජ දනතෝපි. මහා විහාර සදිසානං විහාරානඤ්ච ලෝහ පාසාද සදිසානඤ්ච පාසාදනං අනේකානා සත සහස්සාන කාරෙත්වා දින්න සේනාසන දානතෝපි අනාත පණ්ඩිකාදීහි විහාරං ආරබ්භ කත පරිච්ඡාගතො පි අන්තමසෝ චතුප්පදිකාය ගාථාය අනුමෝදනා වසේනාපි පවත්තිතං ධම්මදානමේව වරං සෙට්ඨං"

ඉහත කී සේ සක්වල ගැබ සිට භවාග්‍රය දක්වා අතරක් නැතිව බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා වඩා හිඳුවා දෙන ලද ප්‍රනීත පිණ්ඩපාත දානයට ද වඩා ධර්ම දානමය පින්කම ශ්‍රේෂ්ඨ වේ. එසේම වඩා හිඳුවා පාත්‍ර පුරවා දෙන ලද ගිතෙල් ආදී බෙහෙත් දානයට ද වඩා ධර්ම දානමය පිනම ශ්‍රේෂ්ඨ වේ. එසේම මහා විහාරයන්ට සමාන විහාරද එසේම ලෝවාමපාය වැනි ප්‍රාසාදයන් නොයෙක් සිය දහස් ගණන් කරවා දෙන ලද සේනාසන දානයට ද වඩා ධර්ම දානමය පිනම උතුම් වේ.

අනාත පිණ්ඩික සිටුතුමා දෙව්රම් වෙහෙර සඳහා වැය කළ 54 කෝටියක ධනපරිත්‍යාග චේතනාවට ද වඩා යටත් පිරිසෙයින් සතර පද ගාථාවකිනුදු අනුමෝදනා ධර්ම දේශනයක් සිදු කෙරේ, නම් ධර්ම දානමය පිංකමක් සිදුකෙරේ නම් ඒ ධර්ම දානමය පිංකම ම දානමය පිංකම් අතර අග්‍ර වේ. ශ්‍රේෂ්ඨ වේ උතුම් වේ යයි දක්වා ඇත.

එයට හේතුව නම් ඉහත කී සිවුරු පිදීම පිණ්ඩපාත දාන සෙනසුන් ඉදිකිරීම ආදී පුණ්‍ය කර්ම කරණුයේ ධර්මය අසා දැනගත් බැවිනි. ධර්මය දැන කියා ගැනීමට නොලැබිණි නම් කැඳ සරුළුවකු ද බත් හැන්දකුදු නොදෙන බව ධර්මයේ පෙන්වා දී ඇත. මේ කරුණින්ද ධර්ම දානමය පිංකම සියළු දන් පරදවන බව දත යුතු තවද රහත් බෝධියෙන් නිවන් දුටු පිරිස අතර අග තැන්පත් සැරියුත් ස්වාමීන් වහන්සේට කල්පයක් මුළුල්ලේ වසින වර්ෂාවේ දී දිය බිඳු ප්‍රමාණය කිරීමට තරම් මහා නුවණක් ඇත්තේය. මෙතරම් නුවණක් ඇති සැරියුත් හිමිට ද බණ පදයක් දැනගැනීමට නොලැබිණ නම් නිවන් දැකීමට නොහැකි වන්නේය. මේ හේතුවෙන් ධර්ම දානමය පිනම සියළු දානමය පිංකම් වලට වඩා ශ්‍රේෂ්ඨ වන බව අග්‍ර වන බව තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සක් දෙවිඳුට වදාරන්නට යෙදුනේය.

එබැවින් සත්පුරුෂයෙනි, මෙය කියවා බැලූ ඔබ වඩ වඩාත් ධර්ම ප්‍රචාරක වැඩ කටයුතු වලනිරත වෙත්වා. බණ කීම ධර්ම ග්‍රන්ථ පත්‍රිකා මුද්‍රණය කොට බෙදාදීම් ආදී පිංකම් වල නුවණින් යෙදෙත්වා.

## 57. තිසරණ සමාදානයේ වටිනාකම

සරණ ගමනිය හිමි අනෝම දස්සී බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි තිසඟ තෙරුන්ගේ තිසරණ සමාදන් විය. ඒ හිත පහදා ගෙන තැන්පත් සිතින් තිසරණගත් පිනෙන් අසූවාරයක් සක්දෙවිඳුව උපන්නේය. හැත්තෑපස් වාරයක් සක්විති රජකම ලැබුණේය. මේ බුදු සසුනේදී හත් අවුරුදු වියේදීම රහත් වීමට ද ඒ පින උපකාර විය.

(අපදාන පාලියේ 23 වන අපදානය)

පඤ්ච සීල සමාදනීය හිමි පෙර ඒ තිසඟ හිමිගෙන් පන්සිල් සමාදන් වූ පිනෙන් තිස් වතාවක් සක්දෙවිඳු විය. හැත්තෑපස් වතාවක් සක්විති රජකම ලැබුණාහ. අප බුදු සසුනේ දී විශාලා මහනුවර දී පන්සිල් ගැනීමේ දී ම රහත් වීමට ද ඒ පෙර පිනද උපනිශ්‍රය වී ඇත.

(අපදාන පාලි 24 වන අපදානය)

යමෙක් පැහැදුනු සිතින් බුදුන් දහම් සඟුන් සරණ කොට, පිහිට කොට වාසය කරයි නම් ඒ අය අපායට නොයන බව මෙසේ දක්වා ඇත.

''මානුසං දේහං දේවකායං පරිපූරෙස්සන්ති''

මෙයින් දක්වා තිබෙන්නේ බුදුන් සරණ යන අය අපායට නොයන බව ඒ වගේම තමයි. ධර්මය ද සංඝයාද යමෙක් පිහිට කොට සරණකොට වාසයකරයි නම් ඒ අයද සුගති පරායනය වේ. එසේම එක තිරිසන් සතෙකුට දානයක් දෙන ලද්දේ නම් ආත්ම සියයක් ආයුෂ, වර්ණ සැප, බල, ප්‍රඥාවන් ගෙන දේ. එසේම මසුන් මරණ, අනුන්ට පීඩා කර ජීවත්වෙන, දුස්සීල පුහුදුන් පුද්ගලයෙකුට දානයක් දෙන ලද්දේ නම් ආත්මභාව දාහක් ආයුෂ,වර්ණ සැප බල ප්‍රඥාවන් ගෙන දේ. එසේම ඇති අගුණ වහන ස්වභාව නැති, නැතිගුණ පෙන්වන ස්වභාව නැති අනුන් නොපෙලා දැහැමින් සෙමින් කෘෂි වෙළඳ ආදී කර්මාන්ත වල යෙදී ජීවත්වන පුහුදුන් සිල්වතෙකුට දුන් දානයේ විපාක ආත්මභාව ලක්ෂයක් ආයු වර්ණ සැප බල ප්‍රඥාවන් ගෙන දේ. තවද කර්ම ඵල විශ්වාස කරන කර්ම වාදී කිරිය වාදී කාමයන් කෙරෙහි විතරාගී සිත් ඇති ලෞකික පඤ්ච අභිඥාවන් ඇති බාහිර තාපසයෙකුට දෙනදානයේ විපාක ආත්ම භාව කෝටි ලක්ෂයක් ආයුෂ වර්ණ සැප බල ප්‍රඥාවන් ගෙන් දෙන්නාහ.

තිසරණ උපාසක කෙනෙකුට දෙන දානයේ විපාක මෙපමණය කියා කිය නොහැකිය. අසංඛෙය්‍ය අප්පමෙය්‍ය වශයෙන් මජ්ඣිම නිකා අටුවාවේ දක්වා ඇත. එයට වඩා පංචසීලයෙහි පිහිටියෙකුට දෙන ලද දානය මහත් ඵලවේ. ඊටත් වඩා දස සීළයක් පිහිටියෙකුට දෙන දන මහත් ඵල වේ. ඊට වඩා සාමණේර හිමි නමකට දෙන දානයද මහත් ඵලවේ. ඊටත් වඩා උපසම්පන්න භික්ෂුවකට දෙන දානය මහත් ඵලවේ. ඊටත් වඩා ව්‍යක්ත සම්පන්න භික්ෂුවකට දෙන දානය මහත් ඵලය. ඊටත් වඩා විදර්ශනා වඩන භික්ෂුවකට දෙන දානය මහත් ඵලය. එයටද වඩා අරඹන ලද විදර්ශනා ඇති භික්ෂුවකට දෙන ලද දානය මහත්ඵල වේ. සෝවාන් උතුමෙකුට දෙන දානයට වඩා අරඹන ලද විදර්ශනා ඇති උතුමෙකුට දෙන දානය මහත් ඵල වෙන බව දක්ඛිණා විභංග අටුවාවේ දක්වා ඇත.

තවද, වෙලාම සූත්‍රයට අනුව සෝවාන් පුද්ගලයන් සියයකට

දෙන දානයට සකෘකාගාමි කෙනෙකුට ද සකෘදාගාමී සියදෙනෙකුට දෙන දානයකට වඩා එක් අනාගාමී උතුමෙකුට දෙන දානය ද අනාගාමී උතුමන් සියදෙනෙකුට දෙන දානයට වඩා එක් රහතන් වහන්සේ නමකට දෙන දානය ද රහතන් වහන්සේලා සියක් නමකට දෙන දානයට වඩා එක් පසේ බුදු කෙනෙකුට දෙන දානයේ විපාක සත සහස්ස ගුණයෙන් වැඩිවන්නාහ. ඒ වගේම පසේ බුදුන් සියයකට දෙන දානයට වඩා එක් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකට දෙන දානය මහත් ඵල මහානිසංසවේ. එයටත් වඩා බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට දෙනදානය මහත් ඵල මහානිසංස වන්නාහ.

එයට ද වඩා සතර දිගින් වඩිනා මහ සංඝයා උදෙසා විහාරයක් කරවන්නේ නම් එය මහත්ඵල මහානිසංස වන්නාහ. එයට ද වඩා යමෙක් ප්‍රසන්න සිතින් බුද්ධ ධම්ම සංඝ යන රත්නත්‍රය සරණ යා නම් මහත් ඵල වේ. එයට ද වඩා යමෙක් පැහැදුනු සිතින් තිසරණ සහිත පන්සිල සමාදන් වන්නේ නම් මහත්ඵල මහානිසංස වන්නාහ. එයට ද වඩා යමෙක් සුවඳක් ආඝ්‍රහනය කරන තරම් සුළු කාලයක් නමුදු මෙත් සිත පතුරවන්නේ නම් එය මහත්ඵල මහානිසංස වන බව දත යුතුය.

මෙයට ද වඩා අසුරු ක්ෂණයක් තරම් කාලයක් නමුදු අනිත්‍ය සංඥාව වඩයි නම් මහත්ඵල මහානිසංස වන බව වෙලාම සූත්‍රයේ දක්වා ඇත.

## 58 සුභ නම් තරුණයා ඇසූ ප්‍රශ්න 14 හා පිළිතුරු දෙසුම

පින්වතුනි! දිනක් සුභ කියන තරුණයා බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්න 14 ක් අසා සිටියා. එහි දී මහා කාරුණික බුදුරජාණන් වහන්සේ එය පහදා වදාලා. ඒ අනුව තවත් කර්ම විපාක 14 ක් මෙසේ දතයුතු වෙනවා.

01. සත්ව ඝාතනය හේතුවෙන් මතු ජීවිත වල දී අඩු වයසින් මරණයට පත්වන්නේය
02. සතුන් නොමැරීම හේතුවෙන් දීර්ඝායුෂ ලැබේ.
03. සතුන්ට හිංසා පීඩා කිරීම හේතුවෙන් මතුජීවිත වල දී නිතර ලෙඩදුක් වලින් පෙලෙන්නෙක් වේ.
04. සතුන්ට හිංසා පීඩා නොකිරීමෙන් නිරෝගී ජීවිත ලැබේ.

helaboduhavula@gmail.com

05. ක්‍රෝධ කරන අය අවලස්සන වී උපදින්නාහ.
06. ක්‍රෝධ නොකරන අය ලස්සන වී උපදින්නාහ.
07. ඊර්ෂ්‍යා කිරීම හේතුවෙන් අප්‍රසිද්ධ ජීවිත ලැබේ.
08. ඊර්ෂ්‍යා නොකිරීම හේතුවෙන් ප්‍රසිද්ධ ජීවිත ලැබේ.
09. දන් නොදීමේ හේතුවෙන් දිළින්දන් වී උපදිත්
10. දන්දීම හේතුවෙන් පොහොසත් තැන් වල උපදිත්
11. මානය හේතුවෙන් පහත කුල වල ඉපදේ.
(බොහෝ මානය ඇති අය සුනඛයන් වේ. තරමක මානය ඇති අය වඳුරන් වී ඉපදේ. ''මානෝ මක්කටෝ අති මානෝ කුක්කුරෝ''
12. නිහතමානී අය උසස් කුල වල ඉපදේ
13. ධර්මය දැන කියා නොගෙන ජීවත්වන්නා අනුවන වී ඉපදේ
14. ධර්මය දැන කියාගෙන ජීවත් වෙන අය නුවනැත්තන් වී ඉපදේ

(චූල්ලකම්ම විභංග සූත්‍රය)

## 59. පන්සිල් රැකීමේ විපාක

සිල් රකින පින්වතුන්ට ලැබෙන අනුසස් බොහෝ පවතී. සතුන් මැරීමෙන් වැලකී සිටින්නාට විශේෂ ආනිසංස විසිතුනක් ලැබේ. සොරකම් කිරීමෙන් වැළකී සිටින්නාට විශේෂ විපාක එකොළහක් ලැබෙන්නාහ. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී සිටින්නාට ආනිසංස දහනවයක් ලැබේ. බොරු කීමෙන් වැළකී සිටින්නාට විශේෂ ආනිසංස දාහතරක් ලැබේ. මත්පැන් පානයෙන් වැලකී සිටින්නාට විශේෂ ආනිසංස තිහක් ලැබේ. පන්සිල් රැකීමෙන්ම ආනිසංස අනුහතක් ලැබෙන්නාහ. එම අනුහස් මොනවාද කියා අප විසින් මුද්‍රණය කොට බෙදා දෙන ලද පංචසීලානිසංස පත්‍රිකාවලින් බලා දැනගනිත්වා.

භාවානානිසංශ කීමට බොහෝ ඇත්තේ නමුදු ග්‍රන්ථය දීර්ඝ වන බැවින් ඒවා නොලියමි. දන් දීමෙන් මෙපමණ අනුසස් ගෙන දේ නම් බුදු සසුනේ කළහැකි ඉහළම පිංකම වූ භාවනාවන් සිදු කළොත් මොන තරම් ආනිසංස ලබාගත හැක්කේ දැයි නුවණින් සිතා සතුටින් මේ උතුම් කුසල ධර්ම වල යෙදෙත්වා. පින්වතුනි, මා මෙතෙක් ලියූ දීර්ඝ විස්තරයෙන් ඔබට කියන්නට බලාපොරොත්තු වුණේ හිත හදාගෙන සිදුකරන කුඩා නමුදු පිකංම මහත් සැප විපාකගෙන දෙන බවය.

එබැවින් මේ ධර්ම ග්‍රන්ථය සත්පුරුෂයින් පැහැදුනු සිතින්ම පින්කම් කෙරෙත්වා.

## II අඳුරු විපාක

පින්වතුනි, දැන් අපි විස්තර කරන්න යන්නේ සිත දූෂිත කරගෙන සිදුකරනු ලබන කුඩා අකුසලයක් නමුදු ගෙන දෙන විපාකයක් අතිශයින් ඝෝර වූ කටුක වූ අමිහිරි වූ විපාකයන් බවය. වැරදි කරන අය මැරී ගොස් උපදින දුක් වැඩිම සැප අඩුම තැන සතර අපාය ලෙස හඳුන්වන අතර එයින් ද නරකාදියේම දුක් අධික වන්නාහ. එම නිරයද කොටස් එකසිය තිස් හයකට බෙදා පෙන්වා ඇත. ඒ එක නිරයක වත් අසුරුසනක් ගහනතරම් කාලයක් වත් සැපතක් නැත.

## 01. නිරා දුක

එහි ඇත්තා වූ අට මහ නරකයන්ගේ විස්තර මෙසේය. එහි නිර සත්වයන් ගින්නෙන් දවනු ලැබේ. වෑ පොරෝ ආදියෙන් ශරීරය කපනු ලැබේ. ගිනියම් වූ යම පොළොවට තබා යකඩ උල් ගසනු ලැබේ. ගිනියම් වූ යකඩ ගුලි ගිල්වනු ලැබේ. පෙරලෙන පර්වත වලින් යට කොට මරනු ලැබේ. ලෝහ තුඩු ඇති කපුටන් හා ගිජුලිහිණියන් ආදී සතුන් විසින් ඇඟ මස් කඩ කඩා කනු ලැබේ. එසේම සමරාක්ෂයන් විසින් මුගුරු වලින් තලනු ලැබේ. තවද ගවයන් මෙන් කරත්ත බැඳ බර අද්දවනු ලැබේ. දැලිපිහියා මෙන් කැපෙන තෘණ හා කඩු මෙන් කැපෙන කොල ඇති ගස් තිබෙන ප්‍රදේශයන් හි මුළු සිරුරම කැපෙන තුරු ඒ මේ අත දුවවනු ලැබේ. සිරුර කැපී මස් කැබල්ලක මෙන් වූ කල්හි කරදිය ගංගාවලට ඇද දමනු ලැබේ. තවද පුවක්ගස්, පොල් ගස්, කිතුල්ගස් පමණ තුඩුවලින් නිරි සතුනගේ ඇඟ විදගෙන කන ලෝහ තුඩු ඇති මහා පණුවන් වෙසෙන කැකෑරෙන අසූචි වලවල් වලට ඇද දමනු ලැබේ. මෙලෙස එහි ඇති දුක් බොහෝ වේ.

නිරයන් 136 තිබෙන අතර ඉන් අටක් ප්‍රධාන නිරයන් වේ.

## 02. අටමහ නිරය හා එහි යෑමට සිදුවන කර්ම

එහි විස්තර ඇති පූජනීය රේරුකානේ චන්දවිමල මහා ස්වාමීන් වහන්සේගේ බෞද්ධයාගේ අත්පොත නම් ග්‍රන්ථයට අනුව මෙසේය.

**සංජීව නරකයඃ** යමපල්ලන් විසින් එහි උපන් සත්වයන් ගිනියම් වූ පොළෙවෙහි පෙරලා කැලි කොට කපද්දීත් ඒ සත්වයන් කර්ම බලයෙන් නැවත ජීවත් වන බැවින් ඒ නිරය සංජීවය නම් වේ. අධික ක්‍රෝධයෙන් හා මානයෙන් අනුන් හා කෝළාහල කළෝ ද, දුබලයන් පෙලූ රජවරුන් හා නිලධාරීහු ද මැරයෝ ද සතුරන් මරන්නෝ ද මෙහි උපදින්නාහ.

**කාලසූත්‍ර නරකයඃ** මෙහි උපන් සත්වයින් ගිනියම් වූ යම පොළෙවේ පෙරලා දලිනූල් ගසා සහින්නා වූ බැවින් කාලසූත්‍ර නරකය නම වේ.

මා පියන්ට හා මිතුරන්ට ද ගුණවත් මහණ බමුණන්ට අපරාධ කළවුන් එහි දුක් විඳින්නාහ.

**සංඝාත නරකයඃ** මේ නිරයේ සත්වයින් නව යොදුන් ඝනකම පොළවෙහි එරී නිශ්චලව සිටිති. එහි අහස ගුගුරන්නාක් මෙන් මහ හඬ නංවමින් එරී සිටින නිර සතුන් අඹරමින් පර්වතයෝ ඒ මේ අත පෙරළෙති. ඒවාට යට වී සත්වයෝ සුණු විසුණු වෙති. ඇත්, අශ්, ගව ආදී සතුන්ට වද දෙමින් වැඩ කරන්නෝද සතුන් මැරුවෝද එහි උපදිති.

**රෞරව නරකයඃ** මේ නිරයෙහි සත්වයන්ගේ ශරීර තුළට වැද ඇතුලත දවන්නා වූ තපුරු දුමක් ඇත්තේය. ඇතුලත පිටත දෙකම දවනු ලැබීමෙන් හඬනු ලබන නිර සතුන්ගේ හඬ නිරතුරුව එහි ඇසෙන බැවින් එම නරකයට රෞරව නරකයැයි කිනු ලැබේ.

**මහා රෞරව නරකයඃ** අතිශයින් රෞද්‍ර වු ගින්නෙන් හා දුමෙන් තවනු ලබන සත්වයනගේ නිරන්තරයෙන් පවත්නා මහා හඬ ඇති නිසා ද නිර සතුන්ගේ ශරීරවලින් ගලන ලෙයින් පිරී තිබෙන නිසා ද ඒ නරකය මහා රෞරව නම් වේ. තුණුරුවන්ට අයත් වුද මාපියන්ට අයත් වූද වස්තුව පැහැර ගන්නෝ ද විනාශ කළ අයද එහි උපදිති.

**තාප නරකයඃ** මේ නිරයේ යම පල්ලන් විසින් ගිනියම් වූ පොළොවෙහි ගිනියම් වූ යහුල් වල අමුණන ලද සත්වයෝ ගින්නෙන් දැවෙමින් දුක් විඳිති. සතුන් පණ පිටින් දවා මැරුවෝද අනුන්ගේ ගෙවල ගිණි තැබුවෝද එහි උපදිති.

**ප්‍රතාප නරකයඃ** මෙහි ද තාප නරකයෙහි නිරිසතුන් පැසෙන අයුරින් දීර්ඝ කාලයක් සත්වයෝ පැසෙති. මරණින් මතු ඉපදීමක් නැත යැයි කියා මිත්‍යා දෘෂ්ඨි ගෙන පව්කම් කළ අය එහි උපදිති.

අවීචි මහා නරකාදියː මේ නරකයෙහි එක් බිත්තියකින් නැගෙන ගින්න අනෙක් බිත්තිය දක්වා ගමන්කරන්නේය. පොළොවෙන් නැගෙන ගිණි ජාලාව උඩ පියත්පත දක්වා ද උඩ පියන් පතෙන් නික්මෙන ගිණි ජාලාව පොළොව දක්වා ද ගමන්කරන්නේය. සත්වයෝ නිතරම එම සදිසාවෙන්ම එන ගිණි දූල් වලින් වෙලී දූවෙන්නහ. අතරක් නැතිව එහි සත්වයෝ වෙසෙති. ගිණිදැල් වලින් හා දුක් වලින් ද සත්වයන්ගෙන් ද අතරක් නැති බැවින් ඒ නරකය අවීචිය නම් වේ.

මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, සංඝ භේදය, බුදුන්ගේ ඇඟේ ලේ සෙලවීම, යන පංචානන්තරීය පාප කර්ම කළවුන්ද බෝසතාණන් වහන්සේලාගේ ජීවිත නැසුවෝ ද, ගුණවතුන්ගේ ජීවිත නැසුවෝද, චෛත්‍යය බිඳින්නෝද, බෝගස් විනාශ කළවුන්ද, රත්නත්‍රයට අයත් වස්තුව පැහැරගන්න වුන්ද, මිත්‍ර ද්‍රෝහීහු ද, භාර්යාවන්ට අපරාධ කළෝද, බොරු කීවෝ ද, සුරා පානය කළවුන්ද, මිසදිටු ගැත්තෝ ද, එහි උපදිති.

තවද අපායන් ගැන හා එහි යෑමට හේතුවනකර්ම පෙන්වීමට නිමි ජාතකය ද දක්වන්නෙමු.

## 03. නිමි රජු දුටු නිරයන් හා එහි යෑමට හේතුවන කර්ම

අතීතයේ අප මහා බෝසතාණන් වහන්සේ නිමි මහා රජුව ඉපදී සිටිය දී මාතලී දෙව්පුත් පැමිණ සක්දෙව්දුගේ අණින් නිමි මහා රජු වෛජයන්ත නම් රථයෙහි නත්වාගෙන දෙව්ලොව බලා යන්නට වූහ. ඒ යන ගමනේ දී අපායේ දුක් විඳින සත්වයන් ද දෙව්ලොව දෙව් විමන් වල සැප විඳින සත්වයන් ද මාතලී නම් දිව්‍ය රථාචාර්යා විසින් නිමි මහ රජතුමාට පෙන්නුවේය.

ඒ අතර මුලින්ම පෙන්නුවේ අපායේ දුක් විඳින සත්වයෝය. එම නිරයන් අතරින් ද මුලින්ම පෙන්නුවේ වේතරණී නම් ඔසුපත් නරකයයි. කැකෑරෙමින් පැසෙන රත් වූ ගිණිසිළු බඳු පැහැ ඇති යා නොහැකි ලෝ දියෙහි පැසෙන නිරි සතුන් දැක බියට තැතිගැනීමට පත් නිමි මහරජතුමා කුමන පව් කම් කළවුන් වේතරණී නරකයෙහි වැටෙත් දැයි මාතලී දිව්‍ය පුත්‍රයාගෙන් ඇසුවේය.

එවිට මාතලී දිව්‍ය පුත්‍රයා මෙසේ කීවේය

"යේ දුබ්බලේ බලවන්තෝ ජීවලෝකේ
හිංසෙන්ති රෝසෙන්ති ජීවලෝකේ
තේ ලුද්ද කම්මා පසවෙත්වා පාපං
තේ වේ ජයා වේතරණිං පතන්ති"

(ජා.පා. 4779)

මේ ලෝකයෙහි බැනීමෙන් හා අත් පා වලින් පහර දීමෙන් ද අක්‍රොෂ පරිභව කිරීමෙන් ද දුබලයන්ට හිංසා කරන්නාවූ බලවත්හු ඒ පව් සාහසික ක්‍රියා හේතුවෙන් ඒකාන්තයෙන් වේතරණී නම් නරකයට පැමිණෙන්නේ යැයි මාතලී දෙව්පුත් තෙමේ කීවේය.

ඉක්බිති මාතලී දෙව්පුත් වෙන නරකයන් කෙරෙහි රථය පදවා එහි දුක් විඳින නිරි සතුන් රජතුමාට පෙන්වීය. එහි ගව් තුනක් පමණ ශරීර ඇත්තා වූ නිරි සතුන් මහා ඇතුන් පමණ විශාල රතු වර්ණ හා කබර වර්ණ ඇති බල්ලන් විසින් එළවාගෙන ගොස් කෙණ්ඩා මාංසය හපා යම පොළොවේ පෙරළා ඇට පමණක් ඉතිරි වනසේ ඉර ඉරා කනු ලැබේ. තවද කරත්ත පමණ ශරීර ඇති ලෝහ තුඩු ඇති ගිජුලිහිණියෝ ඒ ලෝහ තුඩු වලින් නිරසතුන්ගේ ඇට බිඳ බිඳ ඇට මිදුලු කති. තවද ලෝහ තුඩු ඇති අතිශයින්ම භයානක කපුටු රෑන් දුටුතැන එළව එළවා කොටා කති. මේ විඳින දුක් දුටු නිමි රජතුමා කුමන පව් කළහුමේ නරකයෙහි වැටේ දැයි මාතලී දිව්‍ය පුත්‍රයාගෙන් ඇසුවේය. හෙතෙම මෙසේ පිළිතුරු දුන්නේය.

"යේ කේචිමේ මච්ඡරිනෝ කදරියා
පරි භාසකා සමණබ්‍රාහ්මණානං
හිංසෙන්ති රෝසෙන්ති සුපාප ධම්මා
තේ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තයිමං ජනං කාකෝළා අදෙන් තී'ති (ජා.පා. 4780)

මේ අනුව යම් කිසිවෙක් මසුරුකමින් අනුනට කිසිවක් නොදෙන්නාහු ද අනුනට දෙන දේත් වලක්වන කදරිය ස්වභාව ඇත්තෝ ද මහණ බමුණන්ට නින්දා කරත් ද හිංසා ආක්‍රෝෂ කෙරෙත් ද ඔවුහු පව් රැස්කොට නිරයට යති. ඒ මේ නිරසතුන්ගේ මස් කවුඩෝ අනුභව කරතියි මාතලී දෙව් පුත් කීවේය.

helaboduhavula@gmail.com

ඉන් පසු වෙනත් නරකයක් කරා රථය පදවා එහි දුක් විඳින සත්වයන් නිමි මහ රජතුමාට දැක්වීය. ඒ නරකයේ භයංකර මුහුණ ඇති යමපල්ලන් විසින් තල්කඳන් විතර ප්‍රමාණ ඇති දැවෙන යකඩ කඳන් වලින් නිරසතුන්ගේ කකුල් වලට පහරදී ගිනියම් වූ යම පොළොව හෙළා එම දැල්වෙන යකඩ කඳන් වලින් නිරසතුන්ගේ ඇඟ සුණු විසුණු කරති. මෙය දුටු නිමි රජතුමා බියට පත් වී කුමන පව් කළවුන් මේ නිරයේ වැටේ දැයි මාතලී දිව්‍ය පුත්‍රයාගෙන් ඇසීය. ඔහු මෙසේ පැවසීය.

"යේ ජීව ලොකස්මිං සූපාය ධම්මිතො
නරඤ්ච නාරිඤ්ච අපාය ධම්මං
හිංසන්ති රෝසෙන්ති සුපාප ධම්මා
තේ ලුද්ද කම්මා පසවෙත්වා පාපං
තේ මේ ජනා ඛන්ධහතා සයන්ති"

(ජා. පාලි 4785)

ඒ අනුව මිනිස් ලොව සීලෝදි ගුණ සම්පත්ති යහපත් ආචාර පැවතුම් ඇති නිවැරදි පුරුෂයෙකුට හෝ ස්ත්‍රියකට හිංසා කරන බණින පව්කාරයෝ අකුසල් රැස්කොට මේ නිරයට වැටෙන බව මේ ගාථාවෙන් කියැවේ.

ඉන්පසු මාතලී දෙව් පුත් අන් නිරයන් කරා රථය පදවාගෙන ගොස් එහි දුක්විඳින සත්වයන් නිමි රජුට දැක්වීය. එහි යමපල්ලෝ වටකරගෙන ගිනිගෙන දිලිසෙන ආයුධ වලින් කොටමින් ගවයන් ගාලකට එළවන්නාක් මෙන් අඟුරු වලට පන්නති. එහි වැටුනා වූ නිරිසතුන් තුනටිය දක්වා ගිනි අගුරු වලෙහි එරෙති. යමපල්ලෝ මහත් වූ කුඩා වලින් ගිනි අඟුරු ගෙන නිරසතුන්ගේ මත්තෙහි හලති. නිරසතුන් වේදනාවෙන් විලාප දෙති. ඇතැම් නිර සතුන් සිහි මුලාවෙන් තමාම දෝතින් ගිනි අඟුරු ගෙන හිස ලාගනිති. මෙය දැක නිමි රජු බියට පත් වී කිනම් පව් කළ වුන් මේ නිරයෙහි වැටෙත්දැයි ඇසීය. එහිදී මාතලී තෙමේ මෙසේ කීවේය

යේ කේචි පූගායතනස්ස හේතු
සක්ඛිං කරිත්වා ඉණං ජාපයන්ති
තේ ජාපයිත්වා ජනතං ජනින්ද
තේ ලුද්දකම්මා පසවෙත්යා පාපං
තේ මේ ජනා අංගාර කාසුං වුනන්ත'ති

(ජා.පාලි 4788 ගාථාව)

අවස්ථාවක් ලද කල දානයක් හෝ දෙන්නෙමු. පූජාවක් හෝ පවත්වන්නෙමු. විහාරයක් හෝ කරවමුයි යයි පිරිස් එකතුව මහජනයාගෙන් මුදල් සම්මාදම් කොට සමූහයාගේ ප්‍රධානියාට අල්ලස් දී අසවල් තැන වැඩ සඳහා මෙපමණ වියදම් ගියේය. අසවල් තැන කටයුතු සඳහා අප විසින් මෙපමණ දෙන ලද්දේ යැයි බොරු සාක්ෂි දී, ඒ මුදල් කා දමා ජනයා රැවටූ හොර සම්මාදම් කාරයෝ මේ නිරයට වැටෙති. ඔහු අඟුරු වලට වැටීමෙන් කම්පා වෙති යයි අටුවාවට ද අනුව අර්ථ දත යුතුය.

ඉක්බිති මාතලී තෙමේ රථය අන් නරකයක් වෙත පැදවීය. එහි ඇවිලගත් ගිනිදැල් සහිත මහත් ලෝහ සැළියක් පෙනේ. එහි ලෝදිය පිරී පවතී. එහි උපන් නිරසත්වයෝ යමපල්ලන් විසින් අල්ලාගෙන පා උඩට හිස යට කොට ඒ ලෝදිය සැළියට දමනුලැබෙත්. නිරසත්තු එහි පෙණ දම දමා පුපුරා පැසෙති. මෙය දැක බිය පත් වූ නිමි මහ රජතුමා මාතලීය. මොවුන් කුමන පව් කළාහු දැයි විචාලේය. එහි දී මාතලී තෙමේ මෙසේ කීවේය.

**යේ සීලවං සමණං බ්‍රාහ්මණං වා**
**හිංසෙන්ති රෝසෙන්ති සුපාය ධම්මිනෝ**
**තේ ලුද්දකම්මා පසවෙත්වා පාපං**
**තේ මේ ජනා (අවංසිරා) ලෝහ කුම්භිංපත්තී**

(ජා.පාලි 4791 ගාථාව)

සිල්වත් වූ යහපත් වූ ආචාර ගුණ ඇති මහණ බමුණන්ට හිංසා කෙරෙත් ද එසේ කළ පාපකාරී හූ හිස පහලට වැටෙන සේ මේ ලෝහ කුඹු නිරයෙහි වැටී පැසෙත් යැයි අටුවාවට ද අනුව සරළව තේරුම් ගත යුතු.

ඉක්බිති මාතලී දෙව් පුත් තෙමේ ඒ දිව්‍ය රථය අන් නරකයක් කරා පදවන ලදී. එහි යමපල්ලන් විසින් තුන් ගව් පමණ ශරීර ඇති නිරසතුන් ගේ බෙල්ලට ගිනිගෙන දිළිසෙන ලෝහ යොත් දමා ඉදිරියට නමා හිස කපා ගිනියම් වූ ලෝහ දණ්ඩකින් ගෙන ගොස් ලෝහ කුඹු නිරයෙහි දමා එය බලමින් යම පල්ලෝ සතුටු වෙති. කර්ම බලයෙන් ඒ නිර සතුන්ට නැවත නැවත බෙල්ල සහිත හිස් පහළ වෙති. සමපල්ලෝ ද නැවත නැවතත් පෙර සේම දුක් දෙති. මෙය දුටු නිමි රජු බියට පත්ව කිනම් පව් කළවුන් මෙහි ඉපිදි මෙසේ දුක් විඳින්නාහු දැයි මාතලීගෙන් ඇසීය. එහි දී හෙතෙම මෙසේ කීවේය.

යේ ජීව ලෝකස්මිං සූපාප ධම්මිනෝ
පක්ඛී ගහෙත්වාන විහෙඨයන්ති
තේ හේඨයිත්වා සකුණං ජනින්ද
තේ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තේ මේ ජනා ලූත්තරසිරා සයන්ත

(ජා. පාලි 4794 ගාථාව)

මහරජ මේ ලෝකයෙහි යමෙක් පක්ෂීන් අල්ලාගෙන අත්තටු සිඳ පිහාටු ගලවා ගෙළ සිඳ මරා කන්නේ හෝ වේද විකුණන්නේ හෝ වේද ඔවුහු මේ නරකයට වැටී සුන් වූ හිස් ඇතිව සයනය කෙරෙත් යැයි අටුවාවට ද අනුව අර්ථ තේරුම් ගත යුතුය.

ඉක්බිති මාතලී දෙව් පුත් රථය අන් නරකයක් කරා පදවන ලදී. එහි නොගැඹුරු කොට ඇති රමණීය ගංගාවක් ගලා බසිති. ගිනි රස්මි රත් වූ නිරසතුන් ගිනි පොළව පාගමින් පැන් බිමේ අදහසින් ඒ ගඟට බසින්නාහ. එකෙනහිම ගං ඉවුර ගිනිගනී. එහි ගලාගිය වතුර ගිනියම් වූ බොල් වී බවට පතවෙයි. පිපාසය ඉවසාගත නොහැකි වූ නිරසත්වයෝ ඒ ගිනි ගල් බොල් වී කන්නාහ. ඒ ගිනියම් වූ බොල් වී ඔවුන්ගේ සකල ශරීරයම දවාගෙන අධෝමාර්ගයෙන් නික්මෙයි. ඔවුහු දුක ඉවසාගතනොහැකිව දෙඅත හිසේ බදාගෙන හඬයි. මෙය දැක නිමි රජු කිනම් පව්කම් කළවුන් දැයි මාතලීගෙන් ඇසීය. මාතලී තෙමේ මෙසේ කීවේය.

යේ සුද්ධ ධඤ්ඤං පලපේන මිස්සං
අසුද්ධ කම්මා කයිනෝ දදන්ති
සම්මාභිතත්තානං පිපාසිතානං
පිවතඤ්ච තේසං භුසංහෝති පාණී

(ජා. පාලි 4798 ගාථාව)

ඒ අනුව වී ආදී සප්ත විධ ධාන්‍යයෙන් කිසියම් ධාන්‍යයක් මිලට ගන්නා තැනැත්තෙක් හට බොල් හා මිශ්‍ර කොට දෙයි ද, අර්ථයක් නැති දෙයක් හා මිශ්‍ර කොට දෙයි ද, වැලි මැටි ආදිය සමඟ මිශ්‍රකොට දෙයි ද, මෙසේ ජනයා රවටා විකුණූ සොරහු මෙහි ඉපිදී ගිනියම් වූ බොල් ගිලින්නාහ යැයි කීවේය.

ඉත්බිති මාතලී දෙව්පුත් දිව්‍ය රථය අන් නරකයක් කරා පදවන ලදී. එහි රෞද්‍ර වූ යමපල්ලෝ දුනු ඊ ආදී නා නා ආයුධ ගෙන වනයෙහි මුව වැද්දන් මෙන් නිරසතුන් වටකොට දෙපසින් විදිති. ඒ නිර සතුනගේ ශරීර හැම තැනම සිදුර වී පණුවන් කෑ කොළ මෙන් වෙති. මෙය දුටු නිමි රජු මේ සතුන් පෙර මෙහි ඉපදීමට කිනම් පව් කළාහු දැයි ඇසීය. එහි දී මාතලී රියැදුරු තෙමේ මෙසේ කීවේය.

යේ ජීවලොකස්මිං අසාධු කම්මිනෝ
අදින්නනමාදාය කරොන්ති ජීවිකං
ධඤ්ඤං ධනං රජතං ජාතරූපං
අජේළකං වාපි පසුං මහිසං
තේ ලුද්ද කම්මා පසවෙත්වා පාපං
තේ මේ ජනා සත්තිහතා සයන්ති

(ජා.පාලි 4801 ගාථාව)

ඒ අනුව යමෙක් ධන ධාන්‍ය රන් රිදී බැටළු ගව ආදී හිමියන් විසින් නොදුන් අවිඤ්ඤාණක සවිඤ්ඤාණක යමක් සොර සිතින් අරගෙන ජීවත් වෙත් ද, ගෙවල් (වලසාධි) බිඳීම් ආදිය කොට හෝ වංචා ප්‍රයෝගයකින් හෝ අනුන් සතු නොදුන් දෙය සොර සිතින් ගෙන දිවි පවැත්වූ අය මෙහි ඉපිද ආයුධ වලින් නැසී හොවිත් යැයි කී බව අටුවාවට අනුව අර්ථ දත යුතුය.

ඉක්බිති මාතලී දෙවු පුත් දිව්‍ය රථය අන් නරකයක් කරා පදවන ලදී. එහිඋපන් ඇතැම් නිරසතුන් යම පල්ලන් විසින් කපා මස් ගොඩවල් බවට පත්කරති. එහි උපන් ඇතැම් නිරසතුන් යම පල්ලන් විසින් බෙල්ලට ලෝහ කඹ දා යම පොළව මත පෙරලා නා නා ආයුධ වලින් කපා කොටා කැලි කැලි වලට වෙන් කරන ලදී. මෙය දුටු නිමි රජු බියට පත්ව මොවුන් පෙර කුමන පව්කම් කළාහුදැයි මාතලී රියැදුරාගෙන් ඇසීය. එහි දී මාතලී දෙවු පුත් තෙමේ මෙසේ කීවේය.

ඕරබ්භිකා සූකරිකාච මච්ඡිරිකා
පසුං මහිසඤ්ච අජේළකඤ්ච
හන්‍වාන සූනෙසු පසාරයිංසු
තේ ලුද්ද කම්මා පසවෙත්වා පාපං
තේ මේ ජනා ඛිලකතා සයන්තීති

(ජා.පාලි 4804 ගාථාව)

ඒ අනුව මිනිස්ලොව ගවයන් මීයන්, මීහරකුන්, එළුවන්, බැටළුවන්, ඌරන් මරා මස්කොට ජීවත් වන්නෝද, මසුන් මරන්නෝද මොවුනගේ මස් මස්ලොඹු වල (මස් විකුණන ලැලිවල) විකිණීමට කොටස් වශයෙන් තැඹුවාහු ද තවත් නොයෙක් සතුන් මරා මස් විකුණා දිවි පවත්වන්නෝ ද මේ නිරයේ ඉපිද, නිර පල්ලන් විසින් කොටස් කළ මස් ගොඩවල් බවට පත්වී හොවිති යැයි මාතලී දෙවු පුත් කී බව අටුවා විස්තරයට අනුව අර්ථ දතයුතු.

ඉක්බිති මාතලී දෙව්පුත් නිමි මහ රජතුමාට අන් නරකයක් දක්වන ලදී. එහි ඇති මළමුත්‍ර පිරුණු අතිශයින් දුර්ගන්ධ වූ අසූචි වල ගිනිගෙන දුම් දමින් පැසෙන්නේය. සා දුකින් පෙළෙන නිර සත්වයෝ ඒ කුසගිනි වේදනාව ඉවසාගත නොහැකිව දුම් දමමින් පැසෙමින් ඒ අසූචි ගුලි ලෙස පිඩුකොටගෙන අනුභවකරති. මෙය දුටු නිමි රජු මේසත්වයන් මනු ලොව දී කිනම් පව් කළාහුදැයි මාතලී දිව්‍ය රියදුරුගෙන් විමසීය. හෙතෙම මෙසේ කීවේය.

යේ කේචි මේ කරණික විරෝසකා
පරේසං හිංසාය සදා නිවිට්ඨා
තේ ලුද්ද කම්මා පසවෙත්වා පාපං
මිත්තද්දුනෝ මීළ්හමදෙන්ති බාලා
රහදෝ අයං ලෝහිත පුබ්බ පූරෝ
දුග්ගන්ධරූපෝ අසූචි පූති වායති

(ජා. පාලි 4810 ගාථාව)

ඒ අනුව යම් සත්වයෙක් අත්පා කැපීම් ආදී වශයෙන් මිනිසුන්ට දරුණු වධ දෙන්නෝ ද මිතුරන් වෙහෙසෙන්නෝද අනුනට හිංසා පීඩා කරන්නෝ ද අනුන්ගෙන් ආහාර පාන අනුභවකොට පනවන ලද අසුන්වලම නිදා පසුව ඒ උපකාර කළ මිතුරන්ගෙ ධනය පැහැරගන්නා වූ ඔවුන්ගෙන් අල්ලස් ගන්නා වූ මිත්‍ර ද්‍රෝහී හු ද, මේ නිරයෙහි ඉපිද ගිනියම් වූ අසූචි අනුභව කරත් යැයි මාතලී දෙව්පුත් කියා ඇති බව අටුවාවට ද අනුව අර්ථ දත යුතු.

ඉක්බිති නිමි රජතුමාට අන් නරකයක් පෙන්වන ලදී.එහි කුණු වූ ලේ සැරව පිරුණු අතිශයින් දුර්ගන්ධ වහනය වන අපවිත්‍ර විලක් ඇත. ගිනි රශ්මියෙන් අතිශයින්ම පෙළෙන නිර සතුන් ඉන් පිපාසිතව බීමට පැන් නැතිව මේ කුණු වූ අපවිත්‍ර ලේ සැරව පානය කරති. මෙය දුටු

නිමි රජු මොවුන් කිනම් පව්කම් කළාහු දැයි විමසීය. එහි දී මාතලී දෙව්පුත් ඒ කරුණ මෙසේ පහදා දෙන ලදී.

යේ මාතරං වා පිතරං වා ජීවලෝකේ
පරාජිකා අරහත්තේ හනන්ති
තේ ලුද්ද කම්මා පසවෙත්වා පාපං
තේමේ ජනා ලෝහිත පුබ්බ භක්ඛා

(ජා. පාළි 4810 ගාථාව)

ඒ අනුව යමෙක් මව හෝ පියා රහතුන් හෝ මරා ගිහි පාරාජිකාවන්ට පත්වූවෝ ද පූජා සත්කාරයට සුදුසු වූ සිල්වත් ගුණවත් බුද්ධ ශ්‍රාවකයෝ නැසූ පව්කාරයෝ ද මෙහි ඉපිදි ලේ සැරව අනුභව කරන්නෝ වෙති යැයි මාතලී දෙව්පුත් කී බව අටුවාව ට ද අනුව අර්ථ දතයුතු.

ඉක්බිති නිමි මහරජතුමාට අන් නරකයක් පෙන්වන ලදී. එහි යමපල්ලන් විසින් එහි උපන් නිරසතුන්ගේ දිව ගිනියම් වූ බිලීකොකු වලින් අමුණා ඇද ගිනියම් වූ යම පොළවෙහි හෙලාතව හමක් ඇද උල්ගසන්නාක් මෙන් උල් ගසත්. නිරසත්වයෝ ගොඩ දැමූ මසුන් මෙන් දුක් ඉවසාගත නොහැකිව හඬමින් කෙළ වගුරුවත් මෙය දුටු නිමි රජු බියපත් වී කිනම් පව්කළාහු මෙහි වැටී දුක් විඳිත් දැයි මාතලී රියැදුරු ගෙන් අසන ලදී. එහි දී මාතලී දෙව්පුත් මෙසේ කීවේය.

යේ කේචි සණ්ඨානගතා මනුස්සා
අග්සේන අග්සං කයං භාපයන්ති
කුටේන කුටං ධනලෝභ හේතු
ඡන්නං යථා වාරිචරං වධාය
නහී කුට කාරිස්ස භවන්ති තාණා
සකේහි කම්මේහි පුරක්ඛතස්ස
තේ ලුද්දකම්මා පසවෙත්වා පාපං
තේ මේ ජනා වංකඝස්ථා සයන්තී

(ජා. පාළි 4814, 4815 ගාථාව)

ඒ අනුව බඩු මිළ නියම කරන ස්ථානයෙහි ඒ ඒ භාණ්ඩයේ අගය නියම කිරීම වශයෙන් හෙවත් මිළ ප්‍රමාණය කිරීම වශයෙන් නියුතුව සිටින පුද්ගලයෙක් භාණ්ඩ ගන්නට සිටින පුද්ගලයන්ගෙන්

අල්ලස් ගෙන වටිනා භාණ්ඩයේ මිළ පහත හෙළන කෙරාටිකයෝ ද, ඇමෙන් වැසූ බිලීකොක්ක රැගෙන මසකු මරන්නා සේ හොර කිරුම් මිනුම් ආදී කූට ක්‍රියා කරන නීච වෙළෙන්දෝ ද මෙහි ඉපිද ගිනියම් වූ යබිලි අමුණන ලදුව ගිනියම් වූ යම පොළවෙහි නිදත් යැයි පවසන ලද බව අටුවාවට ද අනුව අර්ථ දතයුතු.

ඉක්බිති මාතලී දෙව්පුත් තෙමේ නිමි මහ රජතුමාට අන් නරකක් පෙන්වන ලදී. එහි යම පල්ලන් විසින් කැපූ ශරීර ඇති පිළිකුල් ඒ ස්ත්‍රීහු හිස අත බැඳගෙන හඬති. ගෙල සිඳි ගවයන් මෙන් ලේ සැරව තැවරුණු ශරීර ඇතිව ගිනියම් වූ යම පොළොවේ ඉඟටිය තෙක් එරී සිටුවන ලද කණු මෙන් සිටිති. එහි දී එක් එක් දිශාවලින් ගිනියම් වූ යකඩ පර්වත හෙණගහන්නාක් මෙන් ශබ්ද නංවමින් නැගී අවුත් ඔවුන්ගේ ශරීර සුනු විසුනු කරත්. එකෙනෙහිම කර්ම බලයෙන් නැවත ශරීරය තිබූ අයුරින්ම පහළ වෙත්. ගිනියම් වූ පර්වත ද නැවත නැවත ඔවුන්ගේ ශරීර සුනු විසුන් කරුත්මය. විටෙක ගිනියම් වූ පර්වත දෙකක් දෙපසින් විත් උක්ගස් අඹරන්නාක් මෙන් පෙළත් ඉතා රත් වූ ලේ වැගිරෙති. කිසියම් විටෙක පර්වත තුන හතරක් ද විත් මෙසේම පෙළත්. මෙය දුටු රජු බියට පත් මාතලිය කිනම්පව් කලාහු දැයි විචාළේය. එහි දී මාතලී දෙව්පුත් මෙසේ කීවේය.

කෝලිනියායෝ ඉධ ජීවලෝකේ
අසුද්ධ කම්මා අසතං අචාරුං
තා දිත්ත රූපා පතිවිප්පහාය
අඤ්ඤං අචාරුං රතිඛිඩ්ඩහේතු
තා ජීව ලෝකස්මිං රමාපයිත්වා
ඛන්ධාතිවත්තන්ති සජෝතිභූතා

(ජා.රිාලි 4819 ගාථාව)

ඒ අනුව පිරිසිදු ක්‍රියා ඇති සමහර කුලස්ත්‍රීහු අසංයත ධූර්තිකාවන් මෙන් ආහාරපාන වස්ත්‍රාභරණ සපයා දීමෙන් තමන් පෝෂණය කරන හිමියන් හැර පරපුරුෂයන් සතුටු කරවන්නා වූ ඔවුන් හා සිත් පරිදි කම් රතියෙහි හැසිරෙන පාප ස්ත්‍රීහු මේ නිරයට පැමිණ ගිනියම් වූ යමපොළොවෙහි ගිනිදල් සහිත පර්වත වලින් ඇඹරෙති යැයි කියා ඇති බව අටුවාවද අනුව අර්ථ දත යුතු.

helaboduhavula@gmail.com

ඉත්බිති මාතලී දෙව්පුත් තෙමේ නිමි මහරජතුමාට අන් නරකයක් පෙන්වන ලදී. එහි දිලිසෙන බියකරු ගිනි අඟුරු පිරුණු සම නරවලකි. එය දැක නිරසතුන් එහි පිවිසීමට බියව සිටින විට ගාලට නොපිවිසෙන හරකුන්ට මෙන් යමපල්ලන් විසින් නොයක් ආයුධ ගෙන විදිමින් තලමින් ඒ අඟුරු වල කරා ගෙන ගොස් නිරසතුන්ගේ පාවලින් ගෙන හිස යටිකුරු සිටින සේ ඒ බියකරු ගිනි අඟුරු වලේ හෙළත්. එහි ගිලෙන්නා වූ නිරසතුන් දුටු නිමි මහරජතුමා බියපත්ව මොවුන් මේතාක් මහත් දුකට පත්වන්නට කිනම් පව්කම් කළාහුද්‍යි විචාලේය. එහිදී මාතලී තෙමේ මෙසේ කීවේය.

යේ ජීවලෝකස්මිං අසාධු කම්මිනෝ
පරස්ස දාරනි අතික්කමන්ති
තේ තාදිසා උත්තම භණ්ඩථේනා
තේ මේ ජනා අවංසිරා නරකේ පාතයන්ති

(ජා.පාලි 4822 ගාථාව)

ඒ අනුව මිනිස්ලොව මිනිසුන්ගේ උත්තම භාණ්ඩයන් වූ ඉතාම ඇලුම් කරන ප්‍රිය භාර්යාවන් හා යම් පුරුෂයෙක් පරදාර සේවනයේ යෙදෙද්දී ඒ පාපී පුරුෂයෝ මෙහි දී දෙපා වලින් ගෙන හිස පහළට සේ අඟුරු වළට හෙලනු ලැබතේ යැයි කී බව කෙටියෙන් දත යුතු.

ඉක්බිති නිමි මහ රජතුමාට මාතලී දෙව්පුත් විසින් අන් නරකයක් පෙන්වන ලදී. ඒ නිරයෙහි කුඩා මහත් කම් කටොලු ඇති අතර (යමපල්ලන් බිම පෙරළ උල් ගැසීම, හරස් කියතින් ශරිය කැපීම, වෑයෙන් කැපීම, ලෝ දිය පෙවීම, ලෝහ ගුලි කැවීම ආදී අනේක දුක් දෙයි. (චත්තාළාසාකාර මහා විපස්සනා භාවනාව යන ධර්ම ග්‍රන්ථයෙහි දක්වා ඇත.) මෙහි නිරසතුන් තියුණු රළු කටුක දුක් වේදනා විදිති. නිමි රජු මෙය දැක බියපත්ව මොවුහු කිනම් පව් කළාහු දැයි මාතලී රියැදුරුගෙන් විමසීය. හෙතෙම මෙසේ කීවේය.

යේ ජීවලෝකස්මිං සුපාපදිට්ඨිනෝ
විස්සාකම්මානි කරොන්ති මෝහා
පරඤ්ච දිට්ඨීසු සමාදපෙන්ති
තේ පාපදිට්ඨී පසවෙත්වා පාපං
තේ මේ ජනා අධිමත්තා දුක්ඛා තිබ්බා
ඛරා කටුකා වේදනා වේදයන්ති

(ජා. පාලි 4826 ගාථාව)

ඒ අනුව මෙලොවක් නැත. පරලොවක් නැත. පිනෙහි විපාක නැත. මව්පියන්ට උපස්ථාන කළාට වැඩක් නැත. යනාදී ලෙස කර්මඵල විශ්වාස නොකරමින් මිසදිටු තමාද මෝහයෙන් නොයෙක් පව්කම් කොට අන්‍යයන්ට මිසදිටු දී ඔවුන් ද මුළාකරන අධම පව්කාරයන් මෙහි ඉපිද තියුණු රළුකටුක වේදනා විඳිත් යැයි කියා ඇති බව දත යුතු.

මේ අතර දෙව්ලොව දෙවියෝ ද සුධර්මා දෙව් සභාවේ රැස්ව නිමි මහ රජ මාතලී රථාචාර්යයා හා පැමිණෙන තුරු මග බලා සිටිති. සක්දෙවිඳු මාතලී දෙව්පුත් ප්‍රමාද කුමක් නිසාද කියා බලනුයේ මේ කරුණ දැක මෙසේ සිතුවේය. මාතලී දෙව්පුත් නිමි රජුට අසවල් කර්මය කොට අසවල් නිරයෙහි පැසෙත් යැයි කියමින් නරකයන් දක්වමින් හැසිරෙයි. "නිමම්ි රඤ්ඤො පණ ආයු බීයේථනනිරස දස්සනස්ස පරියන්තං ගච්ඡෙය්‍යාති" ඉදින් නිමි රජුගේ ආයුෂ ගෙවුණේ නමුත් නිරයන් දැකීම කෙළවරකට නම් නොයන්නේ යැයි රජුන් සමඟ වහා එන්න යැයි දිව්‍ය පුත්‍රයෙක් අත පණිවිඩයක් යැවීය. එය ඇසූ මාතලී දෙව්පුත් (ගුවනට නැංවූ අහස් යානයක සිට නගරයක් සිරි නරඹන්නාක් මෙන්) එක පාරටම සතර දිශාව බොහෝ නිරයෝ දක්වා මෙසේ කීවේය.

විදිතානි තේ මාහාරාජ ආවාසං පාපකම්මිනං
ඨානානි ලුද්ද කම්මානි දුස්සීලානඤ්ච යා ගතී
උය්‍යාහිදානි රාජිසි දේවරාජස්ස සන්තිකේති

(ජා.පාලි 4827 ගාථාව)

මහරජ පව්කම් කළත් සතුන්වසන තැන් ද දරුණු පව්කම් කළ සතුන්ගේ උප්පත්ති ස්ථානයෝ ද දුශ්ශීල සේවනයේ උපදාන ස්ථානයෝ ද, ඔබවිසින් දක්නා ලදහ. දේවයන් වහන්ස දැන් සක්දෙව් රජුගේ දිව්‍ය සම්පත් දක්නා පිණිස යනු මැනවි යැයි මාතලී දෙව්පුත් කීවේය. පසුව මෙසේම එහි දෙව් විමන් බලමින් ගිය බව නිමි ජාතකයේ දක්වේ.

මේ ඉහත දැක්වූ නිරයන්හි ඉපදීමට හේතුවන යම් පවක් කළේ නම් එය චුතවන මොහොතේ සිහිවුව හොත් එම නියරන් හි ඉපදී දුක් විඳීමට වේ. පසුව එයින් මිදී තිරිසන් සතුන් වී ඉපිද අපමණ දුක් ගැහැට විඳීමට සිදුවේ. තිරිසන් ලෝකයේ ඇති දුක ටිකක් හෝ ඔබට පෙණෙන බැවින් මෙහි එය විස්තර නොකරන්නෙමු. ඉන්පසු සේසකර්ම විපාකලෙස ප්‍රේත ලෝකවල ද ඉපදී අපමණ දුක් විඳීමට සිදුවේ. එම ප්‍රේත ලෝක කිහිපයක් මෙහි දක්වන්නෙමි.

## 04. ප්‍රේත ලෝක දොළහ

01. සෙම සොටු ආහාර කොට ඇති වත්තාස නම් ප්‍රේත ලෝකය
02. මිනිසුන්ගේ හා සතුන්ගේ මළකුණු ආහාර කොට ඇති කුණපාස නම් ප්‍රේත ලෝකය
03. අසූචි ආහාර කොට ඇති ගුථඛාදක නම් ප්‍රේත ලෝකය.
04. කටින් නික්මෙන්නා වූ ගිනිදැල් ඇති අග්ගිජාල මුඛ නම් ප්‍රේත ලෝකය
05. ඉදිකටු මලකය පමණ වූ මුඛයක් ඇති මහා සැලියක් පමණ බඩ ඇති සුචිමුඛ ප්‍රේත ලෝකය
06. සාගින්නෙන් හා පිපාසයෙන් නිතර පෙළෙනබැවින් ආහාර පාන ආශාවෙන් පෙළෙන තණ්හාට්ටික ප්‍රේතලෝකය
07. ගින්නේ දාගිය කණුවක් මෙන්වියලී ගිය ශරීර ඇති සුනිජ්ඣාමක ප්‍රේත ලෝකය
08. ආයුධ වැනි වූ තියුණු තමාගේ ශරීරයම කැපෙන නිය ආදී ශරීර අවයව ඇති සත්‍ථංග ප්‍රේත ලෝකය
09. පරවිත නම් විශාල ශරීර ඇති පබ්බතංග ප්‍රේත ලෝකය.
10. පිඹුරන්ගෙන් ශරීර වැනි ශරීර ඇති අජහරංග ප්‍රේත ලෝකය
11. විමානවල ඉපිද සැපදුක් දෙකම කලින් කල විඳින්නා වූ වේමානික ප්‍රේතලෝකය
12. කැලෑවල වාසය කරන්නා වූ මහත් වූ සෘධි ද අති මහිංධික නම් ප්‍රේත ලෝකය

මෙහි ලෝකය යන්නෙන් අදහස කළේ කොටස, වර්ගය යන බව දතයුතුය. තවත් මස්පිඩු වැනි ශරීර ඇති ප්‍රේතයෝ, ඇට සැකිළි බඳු ශරීර ඇති ප්‍රේතයෝ, කටින් දුගඳ හමන ප්‍රතිමුඛ ප්‍රේතයෝ ආදී බොහෝ ප්‍රේතකොටස් ඇත. ලක්ඛන හිමි මෙවැනි විවිධ ප්‍රේතයන් විසිඑක් දෙනෙකු දැක ඇත. ප්‍රේත වස්තු ප්‍රකරණයේ ප්‍රේතයන්ගේ දුක්ඛර කථා පනස් එකක් දක්වා ඇත. දූෂිත සිතින් කරන කියන දෙයෙහි දුක්බර අඳුරු විපාක දක්වීමට මෙහිලා ඉන් කිහිපයක් දක්වන්නෙමි.

## 05. ප්‍රේත වස්තු කිහිපයක් (15 කි)

## පව්කල ගැහැණියකගේ දුක්බර කථාව
## (මත්තා ප්‍රේත වස්තුව)

භූත යන පුතුගේ පියාට තිස්ස හා මත්තා කියා බිරිඳන් දෙදෙනෙක් වූහ. පසු කලෙක නරක ගති පැවතුම් තිබූ මත්තා මැරී ප්‍රේතියක් ව ඉපදී දිනක් භූතගේ පියා නිවසේ නැති අතරේ නිවස අසලට ආවාය. මේ ප්‍රේතිය දුටු තිස්සාව ප්‍රේතියගෙන් තොප කවරෙක්දැයි ප්‍රශ්න කළාය. එහි දී ප්‍රේතිය තමා මේ නිවසේ සිටි මත්තා බව කීවාය. කුමන පවක් කොට ප්‍රේත ලෝකයේ උපන්නේ දැයි ඇසූ විට ප්‍රේතිය මෙසේ කීවාය.

i. චණ්ඩි ච ඵරුසා චාසිං ඉස්සුකී මච්ඡරී සඨා
තාහං දුරුත්තං වත්වාන ප්‍රේතලෝක මිතෝ ගතා
(ප්‍රේත වත්‍ථු පාලි 137 ගාථාව)

මම ක්‍රෝධ කරන,පරුස බස් කියන, ඊර්ෂ්‍යා කරන, මසුරු සිත් ඇති, කෛරාටික ගති, ඇත්තියක් වූමු. මම ඒ නපුරු වචන කථාකොට මෙලොවින් ප්‍රේත ලෝකයට ගියෙමු යැයි ප්‍රේතිය කී බව අර්ථ දත යුතුය.

ii. ඉක්බිති තිස්සාව විසින් කවර පාපකර්මයක් හේතුවෙන් පසින් ගැවසුනු සිරුරක් ඇත්තියක් වූයේ දැයි අසන ලදී. එහි දී තමා මනු ලොව දී ලස්සන ඇඳුමින් සැරසුන තිස්සාව හා ස්වාමි පුත්‍රයා කතාකරමින් සිටිනවා දැක ඊර්ෂ්‍යාවෙන් මැඩුනුසිත් ඇත්තී කෝපයෙන් පස් ගෙන එයින් තිස්සාවට ගැසූ පවින් මෙසේ වූ බව කීවාය.

iii. ඉත්බිති තිස්සාව විසින් ප්‍රේතියගෙන් කවර කර්මයක් හේතුවී නුඹ කැසීම් රෝගයකින් පෙළෙන්නී දැයි ඇසීය. එහි දී ප්‍රේතිය මනුලොව මත්තා නමින් සිටිය දී කසඹිළියා ගෙඩි ගෙනවිත් තිස්සා (තම ස්වාමියාගේ අනෙක් භාර්යාව) නිදන යහනේ ඇතුරුවා වූ පාප කර්ම බලයෙන් මෙසේ වූ බව කීවාය.

iv. ඉක්බිති තිස්සාව විසින් ප්‍රේතියගෙන් නුඹ නග්නව ඉපදීමට හේතුව කුමක්දැයි අසනු ලැබුවාය. පෙර මත්තා නමින් මනු ලොව මිනිස් කතක්ව සිටිය දී වස්ත්‍ර සොරකම් කළ පවින් මෙසේ නග්නව උපන්නේ යැයි ප්‍රේතිය කිවාය.

v ඉක්බිති තිස්සාව ප්‍රේතියගෙන් කුමක් හෙයින් (තෝ) අසූචි දුගඳ හමන්නියක් වූයේ දැයි ඇසුවාය. පෙර ජීවිතයේ දී ස්වාමි පුත්‍රයාගේ අනික් බිරිඳගේ සුවඳ වර්ග ද මල් මාලාවක් ද අගනා විලවුන් ද, අරගෙන අසූචිවළක දැමූ පවින් මෙසේ දුගඳ හමන්නියක් වූ බව ප්‍රේතිය කීවාය. පසුව තිස්සාව විසින් භික්ෂූන් අට නමක් වඩම්මා දන් දී ඇය ප්‍රේත දුකින් නිදහස් කළාය. දිව්‍ය සම්පත් අත්කර දුන්නාය.

එබැවින් පින්වතුනි මනුලොව ජීවත්වන භව දුකට හේතුවන කිළිටි කර්මනොකොට පිරිසිදු ජීවිතයක් ගතකිරීමට සිතට ගත යුතුය.

## I. රන්වන් ගතක් හා තිරිසන් මුවක් ලද සූරමුඛ ප්‍රේත වස්තුව

නාරද හිමි රන්වන් ගතක් හා ඌරු කටක් ඇති ප්‍රේතයෙක් දක්නා ලදී. ඒ ප්‍රේතයාගේ පූර්ව කර්ම විමසා බැලූ විට හෙතෙම කාශ්‍යප බුදු සසුනේ භික්ෂුවක්ව සිටිය දී කායික සංවරය ආරක්ෂා කළ පිනෙන් රන්වන් පාට සිරුරක් ඇතතෙක් විය. වචනයෙන් භික්ෂූන්ට අක්‍රෝෂ පරිභව කළ පවින් නිරයෙහි බුද්ධාන්තරයක් පැසී දැන් ඌරු කටක් ඇති ප්‍රේතයෙක් වී ඉපිද ඇති බව ප්‍රේතයා විසින්ම කීවේය.

(ප්‍රේ.ව.අ. 08 සිට)

## II. කේලාම් කීමේ බරපතල කම

නාරද හිමි දුටු පූති මුඛ ප්‍රේතයාගේ ශරීරය දෙවියකුගේ බඳු පැහැ අත්තේය. නමුදු දුගඳ හමන මුඛය පණුවෝ පිරී සිදුරුකොට කති. මෙසේ වීමට හේතුව මොහු කාශ්‍යප බුදු සසුනේ භික්ෂුවක් වී සිටිය දී කය සංවර කරගත් අතර ආවාසය ගැන ලෝභ උපදවා කේලාම් කියා එහි සිටි භික්ෂූන් දෙනම භේදකොට යවන ලදී. ඒ පවින් නොබෝ කලකින්ම ගිලන් වී මැරී නිරයේ ඉපදී බුද්ධාන්තරයක් පැසී දැන් ප්‍රේතව ඉපිද දුක් විඳින බව අටුවාවේ දක්වා ඇත.

(ප්‍රේ.ව.අ 10.පිට)

## IV. බොරු කියා දිවුරා ගැලවුන උපාසිකාව

සැවතට ආසන්න ගමක සිටියදී භික්ෂූන් අටනමක් දුටු පඤ්ච පුත්‍ර ඛාදක ප්‍රේතියගේ විස්තරය මෙසේය. ඇය නග්නය. විරූප වූ පිළිකුල් රූපයෙන් යුක්තය. සිරුරින් කුණු ගඳ හමයි. හාත්පස මැස්සන්ගෙන් පිරුණු සිරුරු ඇත්තීය. ඇය උදේ කාලයේ දරුවන්

පස්දෙනෙක් වදා සාදුකින් පෙළෙන බැවින් වැදූ පුතුන් පස් දෙනාම කනු ලැබේ. සවසද එසේම කරනු ලැබේ. හේතුව ඇය පෙර සැමියාගේ අනෙක් බිරිඳගේ ගැබ් හෙලන ලදී. එය ඇසූ කල එසේ නොකළ බව කියා කළේ නම් පෙර කී දුක් විඳින්නියක් වේවායි බොරුවට දිවුරුවේය. එබැවින් මෙසේ වූ බව දක්වා ඇත. මෙසේම ඇය ස්ත්‍රියකගේ ගැබ් හෙලා එසේ කළේ නැත යයි බොරු කියා දිවුරා උදේ සවස දරුවන් සත්දෙනා ගානේ බිහිකොට, ඒ තම දරුවන් අනුභව කරන ප්‍රේතියක් බොහෝ භික්ෂූන් විසින් දක්නා ලද බව සඳහන් වේ.

(ප්‍රේ.ව.පාළි 1-6, 1-7 වස්තුන්)

## V. සැමියාට කළ ශාපය බිරිඳට විඳවන්න වූ කථාව

එක් භික්ෂුවක් කැලේ විවේකයෙන් සිටිය දී නින්ද ගොස් මොහු සමඟ සිටි අනෙක් පිරිස කථා නොකොට අමතකවී ගියහ. සවස අවදි වූ පසු වනයේ එක් දෙවියෙක් මිනිස් වෙසින් විත් උපස්ථාන කළා. ඒ අතර අසූචි හා මූත්‍රා ද, ලේ සැරව ද, අනුභව කරන ප්‍රේතියක් විත් දිව්‍ය පුත්‍රයාගෙන් හිමියනි මට ආහාර දෙන්න වස්ත්‍ර දෙන්න යයි ඉල්ලයි. ඇයට දෙන දුහුල් දිව්‍ය සළු ලෝහ බවට පත්වෙත්. මෙය දුටු භික්ෂුව දෙව්පුතුන්ගෙන් විස්තර ඇසීය. ඇය මනුලොව දී තමාගේ බිරිඳ බව ද තමා දන් දෙන විට ඇය ලෝභයෙන් මසුරු බවින් මෙසේ අක්‍රෝෂ කළ බවද කීවේය. එනම් "මේ දානය තොපට පරලොව දී අසූචි ද මූත්‍රා ද සරුව ද වේවා. මේ දෙන වස්ත්‍ර තොපට ලෝහ වස්ත්‍ර වේවා" කියාය. තමා දන් දී දෙව් විමනක් ලද බවද බිරිඳ දන් දෙන ඔහුට මසුරුවා තමා ශාපකොට මෙසේ ප්‍රේතියක් වී ඉපදී ඇති බවද දෙව්පුත් පැවසුවේය.

(මහාපේසකාර ප්‍රේත වස්තුව)

මේ කතා පුවතින් ඔබේ ජීවිතයට ද යමක් ගෙන යහපත් ජීවිතයක්ම ගත කෙරෙත්වා.

## VI. යහපත් දරුවාට ශාප කළ අයහපත් මවට වූ විපාකය

දිනක් රේවත ස්වාමීන් වහන්සේ ගංගා නදී තීරයේ සිටිය දී ප්‍රේතියක් විත් උන් වහන්සෙගෙන් බීමට පැන් ඉල්ලීය. සිහිල් දිය ඇති මේ ගඟ මෙහි තිබෙද්දී කුමක් නිසා පැන් ඉල්ලති දැයි ඇසූ විට තමා ඒ පැන් ගන්නා විට ඒ ගඟ දිය වතුර ලේ බවට පත්වන බව කීවාය. ඊට

හේතුව මැය මනුලොව ඉපදී සිටිය දී මැයගේ උත්තර නම් පුතු කච්චායන ස්වාමීන් වහන්සේට දන්දෙන විට මසුරු කමින් පෙළුණු මෑ පුතුට මෙසේ ශාප කළේය. ''යම් සේ ඔබ මගේ අකමැත්තෙන් මෙසේ මහණුන්ට දන් දෙව් ද මේ සියල්ලම ඔබට පරලොව දී ලේ වේවා'' කියාය. එහි විපාක ඇයට මෙසේ ප්‍රේතියක් වී ගෙවන්නට වූ බව දක්වා ඇත.

(උත්තර මාතු ප්‍රේත වස්තුව)

## VII. කුට වෙළෙන්දාට හා මව්පියන්ට පහර දුන්නන්ට වන විපාක

එක් ප්‍රේතයෙක් වී / බොල් / හිස විසුරුවාගනී. එක් ප්‍රේතයෙක් මුගුරෙන් සිය හිස බිඳගනී. එක් ප්‍රේතියක් සිය මස් ලේ අනුභව කරයි. එක් ප්‍රේතියක් අසූචි අනුභව කරයි. මෙය දුටු මුගලන් මහ රහතන් වහන්සේ අසූචි කන ප්‍රේතියගෙන් තොපි කුමන පව් කොට මෙසේ දුක් විඳින්නාහු දැයි ඇසුසේක.

පෙර කුට වෙළෙන්දෙක් හැල් වී (බොල්) රත් හැල් වී සමඟ මිශ්‍ර කොට හොර මිනුම් ක්‍රම ද ඇතිව වෙළඳාම් කර කළුරිය කළපසු මේ පළමු ප්‍රේතයා වූ බව කීවාය. මේ වෙළෙන්දාගේ පුත් තෙමේ තම මව හිත මිතුරන්ට සංග්‍රහ නොකරන්නීය කියා යෝග්‍ය යමක් ගෙන මවගේ හිසට පහරක් දුන්නේය. ඔහු කළුරිය කොට මේ කියූ දෙවන ප්‍රේතයා විය. ඒ මවට ගැසූ පුතාගේ බිරිඳ හැම දෙනාටම ආහාර පිණිස තිබූ මස් හොරට කා පසුව ඇසූ කල්හි තමා එසේ නොකල බවද කියා ඉදින් මා විසින් ඒ මස කෑවේ නම් භවයත් යැයි බොරුවට සපථ කළාය. (දිවුරා ශාප කළාය) ඒ හේතුවෙන් ඇය සිය මස් ලේ අනුභව කරන තෙවන ප්‍රේතිය විය. ඒ පුතාගෙන් ගුටි කෑ මව වූ මා යම් යම් දේ ඉල්ලාගෙන ආ කල නැති බව කියා, ඉදින් තියාගෙන නැත යයි කියන්නේ නම් උප උපන් තැන අසූචි කන්නියක් වේවායි සපථ කළෙමි. (බොරුවට දිවුරා ශාප කළේය.) ඒ හේතුවෙන් තමා කළුරිය කොට විත් මෙසේ අසූචි කන ප්‍රේතියක් වූ බව ඕ තොමෝ කීවාය.

(ප්‍රේත වත්‍ථු අට්ඨ කතා - 137 පිට)

## VIII. දෙමහල්ලන්ගේ දුක්බර කථාව

සංකිච්ච හිමි උකටලී වී සිවුරු හැර යන්නට සිටි සාමණේර නමකට මේ ප්‍රේත පිරිස පෙන්වන ලදී. මුළින්ම ඇති වාහනයකින් දිව්‍ය පුත්‍රයෙක් යති. දෙවැනිව අශ්ව වාහනයකින් දිව්‍ය පුත්‍රයෙක් යති. තෙවැනිව සිවිකාවකින් දෙවඟනක් යති. ඒ හැම පසුපස ප්‍රේතයෙක් හා ප්‍රේතියක් ඵරුස වචන කියමින් ඔවුනොවුන්ගේ ඇඟ විද ලේ සැරව බොමින් අතෘප්තිමත්ව යනු ලැබේ. ඒ ගමේ ඊට ටික දිනකට පෙර උපස්ථායක පවුලක් වැසි සුළඟට ගේ බිත්ති ඇද වැටී යටවී පස්දෙනෙක් මිය යන ලදී. එනම් දෙමාපියන් හා පුතුන් දෙදෙනා ද එකම දුව ද වේ. ඒ පෙර දන් දුන් පුතුන් දෙදෙනා දිව්‍ය පුත්‍රයන් වූහ. දුව තමා ලද කොටසින් අඩක් දී දෙවඟනක් වූවාය. මේ දෙමහල්ලෝ දන්දෙන දරුවන්ට ඒ දීම ගැන අක්‍රෝෂ පරිභව කොට ප්‍රේතව උපන් බව පෙන්වා දෙන ලදී. මෙය ඇසූ සාමණේර හිමි සංවේග වී බවුන් වඩවා රහත් විය.

(ප්‍රේත වත්‍ථු පාළි නාගප්‍රේත වස්තුව)

## IX. රෑට දෙව් සැප දවල්ට අපා දුක (මිගලුද්දක ප්‍රේත වස්තුව)

මේ ප්‍රේතයාට රෑට දෙව් සැප ලැබේ. දවල්ට බොහෝ දුක් විඳින්නවේ. හේතුව මොහු මුව වැද්දෙක්ව සිටිය දී එක් උපාසකතුමෙක්ගේ වචනය අසා රෑ දඩයම් කිරීමෙන් වැලකී සිටියේය. නමුදු දවල් එහි යෙදෙන්නේය. ඔහු කළුරිය කොට වෛමානික ප්‍රේතයෙකු වී ඉපිද මෙසේ රෑට සැප ලැබෙන අතර දවල් දුක් විඳින්නෙක් වූ බව දත යුතුය.

## X. වැරදි ලෙස විනිශ්චය කිරීමේ විපාක

බිම්සර රජුගේ සේවයේ නියුතු එක් පුරුෂයෙක් එක් දිනක රාත්‍රී කාලයේ පමණක් උපෝසථ ශීලය ආරක්ෂා කොට කළුරියකළ පසු ගොස් වෛමානික ප්‍රේතයෙකු වී උපන්නේය. හෙතෙම අඩ රෑයක් සිල් රැකි පිනෙන් මහත් සම්පත් ලැබුවේය. නමුදු මනුලොව දී කේලාම් කී බැවින් ද, අල්ලස් ගෙන අධිකරණ විනිශ්චය නිවැරදි ලෙස සිදු නොකළ බැවින්ද, තමාගේම පිටෙහි මස් තමාම අනුභව කරන්නෙකු වූ බව ප්‍රේත වස්තු අට්ඨකථාවේ 150 පිටෙහි දක්වේ.

## XI. බුදුන් පුදන්නට මල් සුවඳ වැලැක්වීමේ විපාක

තවද රජගහ නුවර එක් ධනවත් පුරුෂයෙක් අප බුදුරජාණන් වහන්සේ ගේ සෑය පිදීමට තම බිරිඳ හා දුවද ලේලිය ද ගෙන යන්න හැදූ මල් සුවඳ විලවුන් වැළැක්වූ පවින් කුණු වී දුගඳ හමන පණුවන් පිරි මුහුණ බිඳගෙන කන අවි ආයුධ වලින් මුහුණ නිතර තුවාල කරගනු ලබන ප්‍රේතයෙකු වූ බව ධාතුවණ්නක ප්‍රේත වස්තුවේ දැක්වේ.

## XII. අහිප්‍රේත වස්තුව

මේ ප්‍රේතයාගේ හිස මිනිසෙකුගේ වගේය. කඳ නාගයෙකුගේ වැනිය. මුළු ඇඟම ගිනිගෙන නිතර විලාප කියමින් දුවයි. මෙය ගිජුකුලපව්වේ දී දුටු මුගලන් හිමි බුදුරජාණන් වහන්සේ හමු වී ඒ බව ප්‍රකාශකොට ඔහුගේ පූර්ව කර්මය විචාලේය. සම්බුදුරජාණන් වහන්සේ එය වලදාල සේක. පෙර මොහු පන්සලක් අසල කුඹුරක් ඇති ගොවියෙකි. ඉදින් බොහෝ මිනිසුන් කුඹුර මැඩගෙන පන්සලට එන බැවින් මෙතුමා ද මේ පන්සල නැතිනම් මගේ කුඹුර රැකේ යැයි සිතා පන්සල ගිණිබත් කළේය. මේ පවින් අවීචියේ පැසී දැන් ප්‍රේතව ඉපදී දුක් විඳින්නේ යැයි වදාළසේක. එබැවින් සත්පුරුෂයිනි පවට බිය වෙත්වා.

## XIII. විහිළුවට කළ වරදින් ගෙනදුන් විපාකය

පෙර එක් වෙළෙන්දෙකු තම කඩපිල සමීපයේ ඇති පාර අසල එක් මඩ වගුරක් මිනිසුන්ට පහසුවෙන් යන්න ලැබේවායි සිතා මැරී කල්ගිය ගොනුන්ගේ හිස්කබල් ගෙන්වා ගෙන එය ගොඩ කළේය. දිනක් තම බෑනාගේ මිත්‍රයෙක් දියෙහි බැස නාන කල්හි ඔහුගේ වස්ත්‍ර ක්‍රීඩා පිණිස විහිළුවට සැඟවුයේය. පසුව නැවත දෙන ලදී. මේ වෙළඳාගේ බෑණා කළ වරදට මොහුගේ හිස ගසා දමන ලදී. මැරීගොස් භූමාටු දෙවියෙක් විය. පොදුපාර සෑදූ පිනෙන් වේගයෙන් යා හැකි වාහනයක් ලැබුණි. ගුණවතුන්ගේ ගුණ වර්ණනා කළ කුසලයෙන් ශරීරයෙන් සුවඳ හමන්නේය. නමුත් කෙළි පිණිස වස්ත්‍ර සඟවා අනුන් වෙහස කළ අකුසලයෙන් නග්නව උපන් බව දතයුතුය. එබැවින් සත්පුරුෂයෙනි, විහිළුවටවත් අනුන්ට වෙහෙස කිරීමක් නොකෙරෙත්වා.

(අම්බ සක්බර ප්‍රේත වස්තුව ඇසුරිනි)

## XIV. අධර්මවාදීන් හා එක්වී සිල්වතුන්ට පරිභව නොකරන්න

පෙර ඊර්ෂ්‍යා කරනු සුලු වූ මසුරු බවින් යුත් පාපී භික්ෂුවකගේ කීම අසා එක් සැදැහැවැත් දායකයෙක් සිල්වත් භික්ෂුවකට නින්දා කළේය. ඔහු මැරීගොස් ප්‍රේතයෙකු වී උපන්නේය. දිනක් වැසිකිළි වලකින් මතුවන මෙම ප්‍රේතයා දැක ඔහුගෙන් මෙසේ වීමට හේතුව ඇසූවිට භික්ෂූන්ට මෙය කියන ලදී. ඒ ලාමක භික්ෂුව දැන් කොහිදැයි ඇසූ විට ඒ පාපී භික්ෂුව ද තමාගේ මෙහෙකරුවෙක් වී ශ්‍රමණ ප්‍රේතයෙකු වී සිටින බවද මා ඒ ශ්‍රමන ප්‍රේතයාගේ හිස උඩ සිටින බවද කීවේය. තවදලාමක භික්ෂුවකගේ වචන පිළිගෙන සිල්වතුන්ට නින්දා කළ දායක ප්‍රේතයා මිනිසුන්ගේ අසූචි කා ජීවත්වන අතර දායකයා නොමඟට යැවී ශ්‍රමන ප්‍රේතයා ඒ දායක ප්‍රේතයාගේ අසූචි කා ජීවත් වන්නේය.

මේ පරිද්දෙන්ම පාපී භික්ෂුවකගේ වචන අදහා සිල්වතුන්ට නිග්‍රහ කොළ ප්‍රේතියක්ව ඉපදී ඒ පව්ටු භික්ෂුව ද ප්‍රේතයෙක් වී ඉපදී ඒ ප්‍රේත දායිකාව හිසේ උඩ තබාගෙන ඇගේ අසූචි කා ජීවත්වන කථාවක් ද දක්නට ලැබේ. (ප්‍රේත වස්තු ප්‍රකරණයේ ගූථ ඛාදක, ගූථ ඛාදිකා ප්‍රෙත වත්‍ථු) එබැවින් සත්පුරුෂයෙනි, භික්ෂුවක් නමුදු ඔබට කෙනෙකු ගැන චෝදනාවක් කළ පමණින් අදහා අනුන්ට දොස් නගා අපාගත නොවෙත්වා.

## XV. බිම්බිසාර රජුගේ 8400 ඥාති ප්‍රේතයෝ වීමට හේතුව

ඵුස්ස බුදු සමයේ දී ඒ ප්‍රේතයෝ දූප්පත් මිනිසුන් වී සිටි අතර ඔවුන් රජුට සේවය පිණිස රජ නිවාසේ මහ සගරුවනට දානය සකසන්නට යෙදුනා. මේ අතර ඔවුන්ගේ අසරණ දරුවන් ආහාර ඉල්ලා අඩන්නට වුණා. මුල් කාලයේ සඟුන් වළඳා අවසන් කළ ඉතිරි වූ ආහාර දුන් නමුත් පසු කාලයේ මහා සඟරුවන සඳහා සකස් කරන භෝජනය මහ සඟරුවන වැළඳීමට පෙරදී දරුවන්ට දුන්නා. පසුව බිය සැක අඩුවී ඔවුන් ද අනුභව කළා. දාන ශාලාව ද ගිනි තැබුවා. මෙයට සම්බන්ධ සියල්ලෝම නිරයෙහි ඉපිද දුක්විඳ ඉන් චුතව ප්‍රේතව උපන්නා. පසු කාලයක බිම්බිසාර රජු දානයක් දී ඔවුන් සැපවත් කළා. බලන්න පින්වතුනි බුද්ධාන්තර හතක් දුක් දුන් කර්මයක හැටි.

සත්පුරුෂයෙනි, තව දැක්විය යුතු බොහෝ කතා ඇතත් මෙහිලා කෙටි කරමි. මසුරු බව හේතුවෙන් ප්‍රේතව ඉපිද ඇති කතා බොහෝය. එය ප්‍රේත ලෝකයේ දුක්විඳ ඉන් චුත වී සමහරු අසුර ලෝක වල

ඉපදේ. සමහරු තිරිසන් යෝනි වල ඉපදේ. අසුරයෝ කොටස් පහක් වෙයි. කෙටියෙන් ප්‍රේත ලෝක මෙන් යැයි දතයුතු.

(ධම්මපදට්ඨ කථා - සක්ක පඤ්හ වත්‍ථු)

දුක් විඳීමට වන අතර ඉත්පසු තිරිසන් ලෝකයේ ද ප්‍රේත ලෝකයේ ද ඉප දී දුක් විඳීමට හේතු වේ. මනු ලොව ඉපදුන විට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දුඃඛයන්ට මුහුණ දීමට සිදුවේ.

01. සතුන් මැරීම බහුල ලෙස කළේ නම් අල්පායුෂ්ක වේ.

02. සොරකම් බහුල ලෙස කළ පුද්ගලයෝ මනුලොව දී භෝග ව්‍යසනයට පත්වේ.

03. කාමය වරදවා හැසිරීම බහුල ලෙස කළ පුද්ගලයෝ මනුලොව දී බොහෝ සතුරන් ඇත්තෝ වන්නාහ.

04. බහුලලෙස බොරු කී පුද්ගලයෝ මිනිස් ලොව දී අභූත චෝදනා වලට ලක්වේ.

05. නිතර කේළාම් කී පුද්ගලයෝ මිනිස් ලොව දී මිතුරන් සමඟ නිතර භේද බින්න (තරහා) වන්නෝ වෙත්.

06. ඵරුෂ වචන බහුලලෙස කී පුද්ගලයන්ට මනු ලොව දී අමනාප වූ කටුක වූ කර්කශ වූ ශබ්දයෝම අසන්නට ලැබෙත්.

07. නිතර හිස් වචන බහුල ලෙස කී පුද්ගලයන්ට මනුලොව දී නොම අදහන නොපිළිගන්නා වචන ඇත්තෙක් වේ.

08. මත්පැන් බීම බහුල ලෙස කළ පුද්ගලයෝ මනුලොව උම්මත්තකයෙකු වී හෝ විසිරුණු සිත් ඇත්තෙකු හෝ දිගා විදිශාවක් තේරුම්ගත නොහැක්කෙකු වී හෝ ඉපදේ.

(අං. නි. අට්ටක නිපාතයේ දාන වර්ගයේ සංවත්තනික සූත්‍රය)

## 07. මසුරු ධර්ම පහෙහි අඳුරු විපාක

තවද පඤ්ච මච්ඡරිය (මසුරු) ධර්ම අතුරින් ආවාස මච්ඡරිය (තමා වාසය කරන තැන කෙරෙහි මසුරු වීම) හේතුවෙන් යක්ෂයෙක් හෝ ප්‍රේතයෙක් හෝ වී එම ආවාසයාගේම කසල හිසින් අරගෙන හැසිරෙන්නෙක් වේ.

කුල මච්ඡරිය (කුලය කෙරෙහි මසුරුකම) හේතුවෙන් ඒ කුලයේ මිනිසුන් විසින් අන්‍යයන්ට දානමානාදිය දෙන කල්හි දැක

"ඒකාන්තයෙන්ම දන් මේ කුලය මා කෙරෙහි බිඳෙන්නේ යැයි" සිතනුයේ ලේ හෝ මුඛයෙන් නික්මෙත් කුස විරේකයක් හෝ වෙයි. බඩවැල හෝ කැඩී කැඩී නික්මෙත්. ලාභ මසුරු කමින් සංඝයාගේ හෝ ගණයාගේ සන්තක ලාභයෙහි මසුරු බව කොට පුද්ගලික පරිභෝගයක් මෙන් පරිභෝග කොට යක්ෂයෙක් වී හෝ ප්‍රේතයෙක් වී හෝ මහා පිඹුරෙක් වී හෝ උපදිත්.

ශරීර වර්ණය හෝ ගුණවර්ණය හෝ පරියප්තිධර්මය පිළිබඳ හෝ මසුරු වී තමාගේම ගුණ කියයි. අන්‍යයන්ගේ ගුණ කියන කල්හි ඔවුන්ගේ කුමන ගුණයක් දැයි කියන යම් යම් දෝෂ කියනුයේ පරියාප්ති ධර්මය ද කිසිවක් (ඇසුවොත්) කියා නොදන්නේ වේද හෙතෙම දුර්වර්ණ වී ද දිශා විදිශා කුමන ගුණයක් දැයි කියන යම් යම් දෝෂ කියනුයේ ද පරියප්ති ධර්මය ද කිසිවක් (ඇසුවොත්) කියා නොදන්නේ වේද හෙතෙම දුර්වර්ණ වී ද දිශා විදිශා ආදී ව්‍යවහාර මාත්‍රය පවා නොදන්නා ජාති එළයෝ වී උපදියි.

තවද ආවාස මසුරු බව හේතුවෙන් ලෝහයෙන් පැසෙන්නට වේ. කුලය කෙරෙහි මසුරු බව හේතුවෙන් අල්ප ලාභ ඇත්තෙක් වේ. ලාභය කෙරෙහි මසුරු බව හේතුවෙන් ගූථ නිරයෙහි උපදියි.

වණ්ණ මච්ඡරිය හේතුවෙන් භවයෙහි උපන්නාහුට වර්ණයක් නම් නොවෙයි. ධර්ම මච්ඡරිය හේතුවෙන් කුක්කුළ නිරයෙහි උපදී යැයි අත්තසාලිනී නම් ධම්ම සංගණිප්පකාරනට්ඨ කථාවේ 317 පිටෙහි දක්වා ඇත.

පව් කළ සත්වයෝ ඉහත කී සතර අපායෙහි ඉපිද අපමණ දුක් විඳ යම් හෙයකින් පසු කලෙක මිනිසත් බවක් ලදහොත් එහි දී ද නිවන් දක පිරිනිවන් පාන තුරුම අඳුරු විපාක ගෙන දෙනු ලැබේ. මනුලොව දී එසේ කර්ම විපාක දෙන්නට යෙදුනු කථා කිහිපයක් මෙහි දක්වන්නෙමි. මේවා හොඳින් දන ඉගෙන සියළු සත්වයෝම පාපයෙන් මිදෙත්වා. කුසල ධර්මයෙහි අප්‍රමාද වෙත්වා.

## III. මිනිස් ලොව දී විපාක දුන් පූර්වකර්ම

### 01. ඛුජ්ජුත්තරාව දාසියක් වීමට හේතුව

ඛුජ්ජුත්තුරාව බොහෝම ධර්ම කථික කාන්තාවක් වුවද ඇය

උදේනි රජ නිවසේ දාසියකි. ඊට හේතුව පෙර කාශ්‍යප බුදු රජ කාලයේ දී මැය සිටු දියණියක්ව ඉපිද දිනක් නිවසට වැඩි රහත් සාමනේර තෙරණියකට දුර තිබූ රන් ආභරණ පොදිය තමා සමඟ හිතවත් බැවින් අරන් දෙන්න යැයි කියා වැඩගත් පවින් බව දතයුතුය. ඒ හේතුවෙන් ආත්ම 500 ක් ම දාසියාවක්ව ඉපදුනාය.

(මනෝරථපූරණී අටුවා - 238 පිටුව)

එබැවින් පින්වතුනි, භික්ෂු භික්ෂුණීන් කොතරම් හිතවත් වුවත් කල්පනාවෙන් ඇසුරු කළ යුතුය.

## 03. ඛුජ්ජුත්තරාව කුදු වීමට හේතුව

ඛුජ්ජුත්තරා උපාසිකාව තරමක් කුදු ශරීරයක් ඇති උවැසියකි. එසේ වුවත් උදේනි රජුගේ සාමාවතිය ඇතුළු 500 ක් බිසෝවරුන්ට ධර්මය දෙසා සෝවාන් ඵලයෙන් නිවන් සැප ලබා දුන්නාය. ඒ පිරිසට ධර්මය ඉගැන්වීම ද කළාය. ඇය කුදුව ඉපදීමට හේතුව පෙර ධනවත් පවුලක කුමාරිකාවක්ව සිටිය දී මදක් කුදු පසේ බුදුන් වහන්සේ නමක් දුක කෙලිකවට සිතින් දඟකාර කමට පසේ බුදුන් වැඩියේ මෙහෙමයි කියා අන් පරිවාර කාන්තාවට ගිය අයුරු ඇද කොට (කුදු ආකාරය) පෙන්වීය. ඒ පවින් ඇය කුදු වී උපන් බව දත යුතුය.

(අංගුත්තර නිකායට්ඨ කතා 238 පිට)

## චූල්ල පන්ථක හිමිට සිව්මසක් ගත වී ද එක් ගාථාවක් පාඩම් කරගන්නට බැරිවනු හේතුව

උන් වහන්සේ මහ පන්ථක හිමිගේ බාල සහෝදරයාය. පැවිදි වී සාරමසක් ගත වී නමුදු එක් ගාථාවකු ද පාඩම් කර ගැනීමට බැරිව අසරණ විය. ඊට හේතුව පෙර කාශ්‍යප බුදු සසුනෙහි පැවිදිව නුවණැත්තෙක් වී ගෝල පිරිසට ධර්මය කියාදෙනවිට ඉගෙන ගැනීමට අපහසු නූගත් මෝඩ භික්ෂුවට කවටකම් කළේය. ඒ භික්ෂුව එයින් ලැජ්ජාවට පත්ව ධර්මය නොම කියවා ගත්තේය. ඒ අකුසල කර්මයෙන් මේ ජීවිතයේ පැවිදි වී නමුදු නූගතෙක් විය. පසුව බුදු කරුණාව නිසා පෙර පිරූ පාරමී මතුකරගෙන රහත් වී අසූ මහා ශ්‍රාවකයන් අතර එක් නමක් විය.

(ධම්ම පදට්ඨ කථා 152 පිට)

පින්වතුනි, අදට ද සමාජයේ නූගතුන් ඇත. මේ රහත් හිමි

නමකට විහිළු කිරීමෙන් විපාක දුන් කර්මයක් නොව අර පුහුදුන් භික්ෂුවකට විහිළු කිරීමෙන් පලදුන් කර්මයක් ඇත. මේ රහත් හිමි නමකට විහිළු කිරීමෙන් විපාක දුන් කර්මයකි. එබැවින් උගත් වූ බුද්ධිමත් වූ ඔබ විහිළු තහළු කිරීමෙන් වැලකෙත්වා.

## 04. චක්ඛුපාල හිමිගේ දෙනෙත් අන්දවීමට හේතුව

මේ ස්වාමීන් වහන්සේ පෙර දක්ෂ වෛද්‍යවරයෙක්ව සිටිය දී "මාගේ දෙනෙත් සුව කළොත් මම දූ පුතුන් සමඟ ඔබගේ දාසියක්වෙමි යි" කී එක් අන්ධ කාන්තාවකට බෙහෙත් කොට දෑස සනීප කළේය. ඇය සනීප වූ පසු දාසියක් වීමට අකමැතිව ඇස් නොපෙනෙන බව වෛද්‍යවරයාට කීවාය. කරුණු වටහාගත් ඔහු කෝප වී දූෂිත සිතින් දෑස් අන්ධවන බෙහෙතක් ගැල්වීමට දුන්න්ය. එය ගැල්වූ විටඇගේ දෙනෙත් සහමුලින්ම අන්ධ විය. එම අකුසලය බොහෝ වාර ගණන් විපාක දී මේ රහත් වූ ජීවිතයේ දී ද මහාපාල හිමිගේ දෑස් අන්ධ වී චක්ඛුපාල හිමි යැයි ප්‍රසිද්ධ වූ බව දතයුතුය.

(ධම්ම පදට්ඨකථා 12 පිට)

## 05. බිම්බිසාර රජුගේ කකුල් පලා ලුණු දැමීමට හේතුව

මගධාධිපති බිම්බිසාර රජු ඔහුගේ පුත් වූ අජාසත් කුමරු විසින් සිරකරවා යටිපතුල් තෙල් ලුණු ගිල්වා ගිනි ගෙන දිලෙන කිහිරි අඟුරෙන් පිළිස්සුවේය. නොයෙක් වද දෙන ලදී. මේ සෝවාන් රජුට මෙසේ දුක් විදීමට හේතු වූයේ පෙර භවයෙක් චෛත්‍යය මළුවෙහි වහන් පයලා යෑම හා ඉඳගැනීමට එලූ පැදුරක් නොසේදූ පයින් පෑගූ බව සුමංගල විලාසිනී අටුවාවේ සාමඤ්ඤඵලසූත්‍ර වර්ණනාවේ පෙන්වා ඇත.

## 06. බිහි වූ දිනම කසල ගොඩකට දමන ලද අසරණ දරු ජීවිතයක ශෝකාකුල කථාව

මෙතුමා කිළිටි කර්ම කොට ජීවත්ව නගර සෝභිනියකගේ කුස ඉපදුනේය. ඇය දරුවා බිහිකළ දිනයේ පිරිමි දරුවකු බව අසා කෙනකු ලවා මේ කිරි කැටි බිළිඳාව සොහොනෙහි දමන ලදී. නමුදු කිසිම සතෙකුගෙන් හිංසාවක් නොවීය. දෙවියන් රැකවරණ දෙන ලදී. පසුව තථාගතයන් වහන්සේ බුදු ඇසින් දැක එහි වැඩිසේක. මිනිසුන් ද එහි රැස් වූහ. එහි දී මේ දරුවා පෙන්වා මොහුගේ අනාගත වාසනාව ද පෙන්වා මෙසේ වීමට පූර්ව කර්මය ද වදාල සේක. සැවැත් නුවර

බොහෝ උපාසක පිරිසක් එකතුව මහත් දානයක් දෙන ලදී. මෙය දුටු මසුරු පුරුෂයෙක් ''මේ මුඩු මහණුන්ට මේවා දුන්නාට වඩා මේ සියල්ල කසල ගොඩකට දැම්මේ නම් උතුම් වේ'' යැයි කියන ලදී. පසුව මවගේ කීම නිසා සමාව ගෙන දින 07 ක් මහත් කැඳ දානක් දෙන ලදී. මොහු මැරීගොස් පෙර කී සේ ගණිකාවගේ කුස ඉපිද ඇය විසින් බිහි වූ දින මොහු කසල ගොඩකට දැම්ම වූ බව දත යුතුය.

(කුමාරප්‍රේත වස්තුව 3 -5)

## 07. දෙමාපියන් විසින් අතහැරදා ගිය සෝසක සිටු

පෙර එක දිවියක සෝසක ධනවතෙකුව සිටිය දී අභිවාතක රෝගයෙන් ඒ නගරය පෙලුණු බැවින් බිරිඳ හා එකම දරුවා ද රැගෙන දිවි ගලවා ගැනීමට වෙන රටකට යෑමට පිටත් වුණා. කාන්තාරයකින් යනවිට ගෙන ගිය ආහාර පාන ද ඉවර වී දුක්විඳිමින් යද්දී පුතු වඩාගෙන යන්න බැරි බැවින් පසුව වෙනත් පුතෙක් හදාගත හැකි යැයි සිතා දරුවා අතහැර දමා ගියා. පසුව බිරිඳගේ විලාපය නිසා දරුවානැවත ගෙනාවා. නමුදු දරුවා අතහැර දා ගිය කර්ම බලයෙන් ඔහු හත්වාරයක් ම මරා දැමීමට අතහැර දැමුවා. පෙර සුනඛයෙක් ව සිටිය දී වනයේ දී බුරා වනසතුන්ගෙන් පසේ බුදු කෙනෙකුන් අභිමි වුණා. අද ද මවුපිය සෙනෙහස අහිමි දරුවන් කොතෙක් සිටිනවාද?.

(ධම්ම පදට්ඨකථා - 105 පිට)

## 08. සාමාවතිය ඇතුළු 500 ක් ස්ත්‍රීන් ගිනිගෙන මැරෙන්න හේතුව

උදේනි රජුගේ අග්‍ර මහේසිකාව වූ සාමාවතිය පරිවාර ස්ත්‍රීන් 500 ක් දෙනා ද සමඟ මාලිගය පිටින්ම ගිනිගෙන මරණයට පත්විය. මේ ගින්න ඇතිකළේ මාගන්දියා නම් බිසවගේ කීමට ඇයගේ මාමා ඇතුළු පිරිසක්ය. කෙසේ නමුදු මෙසේ අවාසනාවන්ත ලෙස මැරෙන්නට හේතුව පෙර සාමාවතිය රජ බිසවක්ව සිටිය දී මේ 500 ක් කාන්තාවන් ද පරිවාර ස්ත්‍රීන් වූවාහ. මේ හැම දෙනාම දිනක් දිය කෙළියට ගොස් හවස්වනතුරු දිය ක්‍රීඩා කොට පසුව ගිනි තැපීමට දර ආදිය බලා ගං ඉවුරේ තෘණ ලැහැබක් දැක එහි පසේ බුදු කෙනෙකුන් නොදැක ගිනි තැබුවේය. ගිනිගොඩ මැද පසේ බුදු හිමි දිස්වන විට බියට පත් වී රජු මෙය දැනගත්තොත් මහ විපත් වේ යැයි බියෙන් වධක චේතනා ඇතිවම මේ පසේ බුදුරජු හොඳටම දවමු යැයි නැවත ගිනි තැබූහ.

helaboduhavula@gmail.com

පසේ බුදුරජුන් සමවතින් සිටි බැවින් කිසිම අපහසුවකට පත් නොවී පසුව අහසින් වැඩියාහ. නමුදු දූෂිත සිතින් ගිනි තැබූ පවින් නිරයේ පැසී ශේෂ විපාක ලෙස ආත්මභාව 100 ක්ම මෙලෙසින් ගෙය තුළ හිරවී දැවී මියයන්නට වූ බව තථාගතයන් වහන්සේ වදාළ සේක. එබැවින් පින්වතුනි අකුසලයට බිය වෙත්වා.

## 09. පූතිගත්තිස්ස හිමි සිරුර කුණු වී දුක් විඳීමට හේතුව.

උන් වහන්සේ පෙර කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ කාලයෙහි පක්ෂි වැද්දෙක්ව බොහෝ පක්ෂීන් මරා විකුණමින් ජීවත් විය. එසේම පියාසර කරන්න නොහැකි සේ පක්ෂීන්ගේ කෙණ්ඩා ඇටත් පියාපත් ඇටත් කඩා ගොඩ ගසා තබයි. කුණු වී ය යයි. මෙසේ සතුන්ට දුක් දුන් පවින් සසර බොහෝ දුක් විඳ නිවන් දකින ආත්මයේ දී ද ඇට සන්ධිවලින් ගැලවී කැඩී ගත කුණු වී එක්තැන් වී දුක් විඳින්න වූයේය. එබැවින් නිවන් දකින ජාති දක්වාම මෙවන් පාපකර්ම නොකිරීමට අධිෂ්ඨාන කරගනිමු.

## 10. සෝරෙය්‍යක සිටුගේ අද්භූත කර්මය

සෝරෙය්‍යක සිටු පුත්‍රයා දෙදරු පියෙකි. දිනක් යාළුවන් සමඟ නාන්න යන විට මහා කච්චායන මහ රහතන් වහන්සේ ගේ රන්වන් පාට දේහ සම්පත්තිය දැක රාග සිත් පහළකොට මුන් වහන්සේ මාගේ බිරිඳ හෝ වන්නේ නම් මැනවි, නැත්නම් මාගේ බිරිඳගේ සිරුර හෝ මුන් වහන්සේගේ සිරුරේ පැහැය වන්නේ නම් මැනවි යැයි සිතීය. ඒ අඥාන දූෂිත සිත සමගම ඔහුගේ පුරුෂ නිමිති අතුරුදහන්වී ස්ත්‍රී නිමිති පහළ විය. පසුව ලැජ්ජාවෙන් තක්ෂිලා නුවරට පැනගොස් එහි සිටු කෙනෙකුගේ බිරිඳ වී දරු දෙන්නෙක් ද ලොවට බිහි කළාය. පසු කලෙක මහා කච්චායන මහරහතන් වහන්සේගෙන් සමාව ගෙන නැවත පුරුෂයෙක් විය. පසුව පැවිදිව රහත් විය. රහතුන් කෙරෙහි සිතන වැරදි සිතුවිල්ල ද දුකට පත්කරන බව මින් දත යුතුය.

(ධම්මපද අට්ඨකතා 201 පිට)

## 11. සප්පදාය හිමි නයෙකුගේ කටේ අතදමා නාගයා දෂ්ඨ නොකරීමට හේතුව.

මේ ස්වාමීන් වහන්සේ පැවිදි ජීවිතය ගතකිරීමට අපහසු යැයි කළකිරී සිය දිවි නැති කරගන්න සිතා භික්ෂූන් ගිනිහල් ගෙයි සිටි

නාගයෙක් කලයක දමාගෙන යන විට තමා බැහැර කරන්නන් කියා ඉල්ලාගෙන නාගයා ලවා දෂ්ඨ කරවා ගැනීමට කලයට අත දමා උගේ මුඛයේ අත දැම්ම ද දෂ්ඨ නොකළේය. භවයෙන් වැසී තිබූ නාගයා දෂ්ඨ නොකිරීමට කරුණ තථාගතයන් වහන්සේ පහදා දුන්නේය. මේ නාගයා මෙයින් තෙවන අත්භවයෙහි මේ භික්ෂුවගේ දාසයෙක් විය. ඒ බැවින් නාගයා මොහු එදා ස්වාමියා යයි දැනීගොස් දෂ්ඨ නොකළ බව වදාළ සේක. මිනිසුන්ට නොතේරෙන සමහර දෑ සතුන්ට ද වැටහේ.

(ධම්මපදට්ඨ කථා 417)

## 13. නාවිකයාගේ බිරිඳට මුහුදේ ගිලී මැරෙන්න වූයේ ඇයි

දිනක් භික්ෂූන් නැගී එන නැවක් හිටි හැටියේම මුහුද මැද නතර වූයේය. පරීක්ෂාකළේද කිසිදු යාන්ත්‍රික දෝෂයක් නොවීය. නමුත් නැව ඉදිරියට නොයන්නේය. අවසානයේ මෙහි කවුරු හෝ අවාසනාවන්තයෙකු කාලකන්නියෙකු සිටින්නේ යැයි කුසපත් ඇද බැලීය. අවාසනාවන්ත කුසපත ලැබුණේ නාවිකයාගේ බිරිඳටය. තුන් වතාවක්ම කාලකන්නි කුසපත ඇයට ලැබුණු බැවින් නාවිකයාගේ ද කැමැත්ත ඇතිව ඇයගේ බෙල්ලේ වැලිකලයක් එල්ලා මුහුදට දැම්මේය. පසුව නැව පණගන්වාගෙන ගොඩබිමට ආවේය. භික්ෂූන් මෙහි පූර්ව කර්මය තථාගතයන් වහන්සේගෙන් විමසීය.

මේ කාන්තාව මීට පෙර රූමත් කාන්තාවක් ව සිටියාය. ඊට ආත්ම තුනකට පෙර ඇයගේ ස්වාමි පුත්‍රයා ඒ තිවසේ සුනඛයෙක් විය. අහෝ සසර හැටි පූර්ව සෙනෙහස නිසා ඇය යන යන තැනට මේ සුනඛයා ද යයි. ගම්මු ඇයට මේ සුනඛයා පස්සෙන් ඒම ගැන පද හදා විහිළු කළාය. ලැජ්ජාවට පත් වූ ඇය සුනඛයාගේ ගමන වලක්වාලන්නට නොහැකිව වැලි කලයක් බෙල්ලේ බැඳ දියේ ගිල්වා බල්ලා මැරීය. මේ පවින් අපාගත වී ශේෂ කර්ම ලෙස ආත්මභව 100 ක්ම ගෙල බැඳි වැලි කලයක් ඇතිවම දියේ ගිලී මැරෙන්න සිදු වූ බව වදාළ සේක. එබැවින් සත්පුරුෂයෝ අනූවනයන්ගේ නින්දාවට බිය වී පව්කම් කොට මහත් දුකට පත්නොවේවා.

(ධම්මපද අට්ඨ කථා - 452 පිට)

## 14. ගිනිගෙන දැවෙන කපුටාගේ කථාව

දිනක් සැවැත් නුවර නිවසක් ගිනිගෙන ගිනි සහිත තෘණ හුලක් අහසට නැගුනේ පියාසර කරන කපුටකුගේ ඇඟට වැටුනි. කපුටා ඉන්

බේරීමට අසමත්ව ගිනිගෙන දැවී මැරී වැටුණේය. මෙය දුටු භික්ෂු පිරිසක් තථාගතයන් වහන්සේගෙන් මෙහි පූව කර්මය විචාළේය. මේ කපුටා පෙර ගොවියෙක්ව සිටිය දී කුඹුර මැඩවීමට සිටි ගොනා බොහෝම කම්මැලි බැවින් මෙයට කිපුණු ගොවියා පිදුරු ගොඩක් ගෙන ගවයා පිදුරු වලින් වෙලා පිදුරු වලින් යටකොට ද්වේශයෙන් ගිනි තැබුවේය. ඒ අසරණ තිරිසනා දැවී මළේය. මේ මිනිසා කළ තිරිසන් කර්මය බොහෝ අපා දුක් ගෙන දුන්නේය. අවශේෂ කර්ම ලෙස තිරිසන්ව ඉපිද මේ පස්වන වතාවට ද මෙසේ දැවී මළේ යි වදාළ සේක. එබැවින් මිනිසත් බව ලැබූ ඔබ මෙබඳු තිරිසන් කර්ම කොට දුකට පත් නොවේවා.

(ධම්ම පද අට්ඨ කථා 452 පිට)

## 15. භික්ෂූන් හත් නමක් ගල්ලෙනක සිරවී දුක්විඳි කථාව

බුද්ධ දර්ශණයට එන භික්ෂූන් හත් නමක් අතර මඟ එක් විහාරයක ගල් ලෙනක නවාතැන් ගෙන සිටිය දී රෑ ගලක් ගැලවී විත් ලෙන් දොර වැසුණේය. දින හතක් එළියට ආ නොහැකිව ආහාර පාන නොමැතිව දුකට පත්වන්නට විය. පසුව එළියට විත් ටික දිනකින් බුද්ධ දර්ශණයට ගොස් එහි දී මෙසේ වීමට පූර්ව කර්මය කුමක්දැයි ශාස්තෘන් වහන්සේගෙන් විචාළාහ. එහිදී මේ භික්ෂූන් හත් නම පෙර ගොපළු දරුවන් වී සිටිය දී තලගොයෙක් තුඹසක දින හතක් සිරකර තැබූ පවින් මෙසේ ආත්මභාව 14 ක් ම ආහාර පාන කිසිවක් නොමැතිව දින හතක් ගල්ලෙනක සිරවී දුක් විඳි බව වදාළ සේක.

(ධම්ම පදට්ඨ කතා - 453)

## 16. ලද සම්පත් පරිභෝගකිරීමට වාසනාවක් නැති අපුත්තක සිටු

සැවැත්නුවර සිටුවරයෙක් වූ මොහුට විශාල සම්පත්තියක් අයිතිව තිබුණේ ද කිසිම දිනක් හොඳ වස්ත්‍රයක් ඇන්දේ නැත. ඇන්දේ වැරහැළිය. ප්‍රණීත භෝජනයක් අනුභව කිරීමට හොඳ රථයක ගමන් කිරීමට සිත් පහළ නොවීය. අන්ත අසරණ දිළින්දකු මෙන්වාසය කොට කළුරිය කළේය. මෙසේ මෙම සිටාණන්ට තම සම්පත් පවා පරිභෝගකිරීමට සිත නොනැමුණේ පෙර මොහු සිටුවරයෙක්ව සිටිය දී තගරසිඛී නම් පසේ බුදුරජුන් දැක තම බිරිඳට උන් වහන්සේට දානය දෙන්න යැයි කියා නිවසින් බැහැරව ගොස් නැවත එන අතර මගදී බුදුහිමි මුණගැසී නිවසින් දානය ලැබුනේදැයි අසමින් පාත්‍රයට එබී බැලුවේය. තම බිරිඳ පූජා කොට ඇති ප්‍රනීත දානය දැක මසුරුකම නිසා අසතුටු විය. මොහු

දානය දෙන්න යැයි තම බිරිඳ යෙදවූපිනෙන් දෙව්ලොව සත්වරක් ඉපදුනු අතර සත්වරක් මනුලොව සිටුවරයෙක් විය. දානය දී පසුව සතුටු නොවී කළකිරුණු බැවින් පසුතැවුණු බැවින් වස්තුව ලැබුණේ ද පරිභෝග කිරීමේ පිනක් නොවීය. එබැවින් මෙය දැන ත්‍රිවිධ චේතනා පිරිසිදු කරගෙන කුසල් කෙරෙත්වා.

(සං. නි. දුතිය අපුත්තක සුත්ත)

## 17. පිනට පහල වූ උක්ගස් දඬුවම් දුන් කථාව

ලෝභී පුද්ගලයෙක් මියගොස් ප්‍රේත ලෝකයෙහි උපන්නේය. මොහුගේ පිනකට උක්වනයක් ද පහළ විය. මේ ප්‍රේතයා සා පිපාසයෙන් මිරිකී උක්දඬු කඩක් කපා අනුභව කරමියයි උක්වත්තට යයි. උක් වනයට ගිය විට එහි ඇති උක්දඬු තෙමේම නැමී ඇඹරී අවුත් මේ ප්‍රේතයට පහර දෙන්නේය. ඔහු විලාප කියමින් දුවන්නේය. දිනක් එතැනින් වැඩි හිමි නමකට මොහුගේ ඒ බැගෑපත් හඬ දිවකණට ඇසී කරුණු විමසා තතු දැන මොහුට උක්දඬු කෑමට කපාගත හැකි ක්‍රමයක් කීවේය. උක් දඬු වලට මුහුණ නොදී උක්දඬු ගන්න යයි කීවේය. එහිදී එසේ ගෙන සා පිපාසාදී දුක නිවාගත්තේය. මෙසේ වීමට හේතුව පෙර ආත්මයක උක්දඬු මිටියක් කර තියාගෙන උක් දණ්ඩක් සපමින් මාර්ගයේ යනවිට අසරණ මිනිසෙක් මෙය දැක උක් ගසක් ඉල්ලමින් පසුපස ආවේය. එවිට කෝපයෙන් උක් දණ්ඩක් ඇද නොබලාම ඔහු දෙසට විසි කළේය. මෙසේ නමුත් දීම නිසා උක් වත්තක් ලැබුණේය. නමුත් මුහුණලා ගොස් උක්දඬු ගැනීමට පින නැතැයි මේ කර්මය වදාළේය.

(ප්‍රේත වත්‍ථු පාලි - උච්ඡු ප්‍රේත වස්තුව)

## 18. රහත්වූවේද පිරිනිවෙන තුරු කුස පිරෙන්න ආහාරයක් නොලද ලෝසක හිමි

සිඟමනින් ජීවත් වූ කුඩා දරුවෙක් සැරියුත් මුගලන් වහන්සේ කරුණාවෙන් පැවිදි කළා. මොහු නමින් ලෝසක හිමිය. ඒ හිමිට කිසි දිනක කුස පිරෙන්න ආහාරයක් ලැබුණේ නැත. ඒ හිමියන් සමඟ වැඩියොත් සැරියුත් හිමියන්ට වත් දානය ලැබෙන්නේ නැත. එතරම්ම අවාසනාවන්ත වුවද පෙර පිරූ පාරමී තිබුණා. ඒ පින් බලයෙන් රහත් විය. නමුත් දානය බෙදන්න මිනිසුන් ගෙනෙන විට පාත්‍රය පිරී දානය තියෙනා වගේ පේනවා. දානය බෙදුවේ ද ඒවා වියලී යන්නේය. ජීවත්

වීමට පමණක් ස්වල්පයක් ඉතිරි වෙනවා. පිරිනිවන් පානතුරු කුස පිරෙන්න ආහාරයක් නොලැබුණේය. මෙය දැනගත් සැරියුත් හිමියෝ පිරිනිවන දිනයේ ප්‍රනීත දානයක් භික්ෂුවක්අතේ එවන්නට යෙදුනා. දානය ගෙනා භික්ෂුව එය මගදී වළඳා එය නොලැබුණි. මෙය දැනගත් විට සැරියුත් හිමියෝ සංවේග වී චතුමධුර පාත්‍රයක් ගෙන තම අතේ තියෙද්දීම ලෝසක හිමිට එය වළඳන්න දුන්නා. එදින තමයි මුළු ජීවිත කාලයේම කුස පිරෙන්න ආහාරයක් ගත් දිනය. මේ හිමියන්ගේ පූර්ව කර්මය බුදු නුවණින් දැක මෙසේ වදාළේය.

මේ ලෝසක හිමි කාශ්‍යප බුදු සසුණේ පැවිදිව හොඳින් සිල් ගුණ පුරමින් භාවන කළේ ද ලාභාශාවෙන් මැඩී රහත් හිමි නමකගේ සිව්පසය වලකිවූයේය. තම දායකයෝ රහත් හිමිට සිව්පසයෙන් සළකන විට කැමති නොවුනි. රහත් හිමිට දෙන්න යැයි දුන් කිරිබත් පාත්‍රය ද තරහා සිතින් ගිනි අඟුරෙහි ලා පුළුස්සා දැම්මේය. මේ දූෂිත කර්මයෙන් අපායෙහි ඉපිද අවුරුදු ලක්ෂ ගණනක් දුක් වින්දේය. ආත්ම පන්සියක්ම පිළිවෙලින් යක්ෂයෙක් වී ඉපදුනාහ. ඒ ජාති පන්සීයෙහිම බඩපුරා කෑයේ එකම දවසකය. කෑයේ ද ගැබ්මල ගොඩකි. එයින් පසු තවත් ආත්ම පන්සීයකම සුනඛව ඉපදුනා. එදාද කෑයේ වමනය කළ බත් අසූචියකි. මනුලොව ඉපිද බොහෝ දුක් විඳි අතර මේ අවසන් ආත්මයේ ද පිළිසිඳගත් දින පටන් මුළු ප්‍රදේශයේම කටයුතු පිරිහී ගියේය. මිනිසුන් කාලකණ්නියා කවුදැයි සොයා මේ මව ගමින් ද පන්නා දැමීය. ඕ තොමෝ ඉන්නට තැනක්, කන්නට බතක්, බොන්නට දියක්, අඳින්නට වතක් යන්නට මගක්, නොවූයෙන් දුකින් දුකටම පත්වූවාය. පසුව මොහු ලොවට බිහිකොට පයින් ඇවිදින්න හැකිවෙනකල් හදා කබලක් දී පාරේ අතහැර දැමීය. එදා සිට ඉඳුල් කා හැදුනේය. බලන් සත්පුරුෂයෙනි, එක් දිනක් රහත් හිමි නමකගේ ලාබයක් වැළැක්වූ පව බුද්ධාන්තරයක්ම දුක් දුන්නේය. එබැවින් කර්මයට බිය වෙත්වා.

(ජාතකට්ඨකතා - ලෝසක ජාතකය 209 පිට)

## 19. අවුරුදු 20,000 ක් මහණදම් කළ හිමිනමක් නාගයකු වූ කථා පුවත (ඒරක පත්ත නාගරාජ කථාව)

කාශ්‍යප බුදු සසුනේ පැවිදි වූ මෙතුමා අවුරුදු 20,000 ක් මහා සිල්වත් පැවිදි ජීවිතයක් ගත කළ අතර දිනක් අඟුලක නැඟී යනුයේ එක් තැනෙක එරු ගහක් තිබී එහි කොළයක් ඇල්ලීය. එය කැඩී අතට ආයේය. මෙහි ඇවතක් නොවූව ද ඇවතක් වුනේ යැයි විනය

නොදත්බැවින් කුකුස් කළේය. ඊට පිළියම් නොකළේය. අපවත් වනවිට මෙය සිහිවී මහා නාගරාජයෙකු වී ඉපදුනේය. නම ඒරකපත්ත වේ. අප බුදු සසුන වනතුරු බුද්ධාන්තරයක්ම මේ තිරිසන් ආත්මයේ ඉන්නවුනේ කොළයක් කැඩී පිළියම් කරගන්න බැරිවීම නිසාය. ඉඳින් ලොකු වරදක් කළේ නම් කෙසේ බේරෙන්න දැයි නුවණින් සිතන්න.

(ධම්මපද අට්ඨකථා 566 පිට)

## 20. දරුවන් නැති සිටුවරයෙකුගේ කථාවක්

එක් ජීවිතයක දී මේ සිටුතුමා ධනය කෙරෙහි තෘෂ්ණාවෙන් තම සොහොයුරාගේ එකම පුතා මරණට පත් කළේය. ඒ හේතුවෙන් ඔහු නිරයෙහි වැටී අවුරුදු ලක්ෂ ගණන් දුක් වින්දේය. මනුලොව ඉපිද තගරසිඛී නම් පසේ බුදුරජුන්ට දන් දුන් පිනෙන් සත්වරක් සිටු තනතුරු ලැබීය. නමුදු ඒ කිසිවරක ඔහුට දරුවන් නොවීය. දරුවන් නැති වස්තුව ඔහු මළ පසු රාජසන්තක විය. නැවත රෞරව නිරයෙහි ඉපදුනි. මෙසේ දරුවන් නැතිවීමට හේතුව උක්ත කරුන බව වදාළ දේක.

(සංයුත්ත නිකායෙ දුතිය අපුත්තක සූත්‍රය)

## 21. රජගහ නුවර සුප්පබුද්ධ කුෂ්ඨ රෝගියා

දිනක් මොහු බණ අසා සෝවාන් විය. බණ අසා යනවිට අතරමගදී අලුත වැදූ දෙනක් ඇන මියගිය අතර මෙය අසන්නට ලබුණු භික්ෂූන් වහන්සේලා මේ බව බුදුරජාණන් වහන්සේට මතක්කළේය. ඔහු උපන් තැනද කුෂ්ඨ රෝගය සැදීමට පූර්වකර්මය ද විචාළේය. ඔහු තව්තිසා දෙව්ලොව උපන් බව තථාගතයන් වහන්සේ වදාළ සේක. එසේම මොහු පෙර අත්භවයක දී තගරසිඛී නම් පසේ බුදුන් දැක කාරා කෙළගැසූ පවින් නරකයෙහි ඉපදී දුක් විඳ මෙලොවදී රෝගයකින් (කුෂ්ඨ) පෙලුන බව වදාළ සේක. එබැවින් මෙය බලන සත්පුරුෂයෝ පවට බිය වෙත්වා.

(ධම්මපදට්ඨ කථා 202 පිට)

## 22. බෝධිරාජ කුමාරයාට දරුවන් නැති හේතුව

මෙතුමා කොකනන්ද මී මාළිගාවක් කරවා එහි ප්‍රවේශ මංගල්ලයට බුදු පියාණන් වහන්සේට ආරාධන කළේය. ඔහු මාළිගාවේ පළමු එළිපත්තේ පටන් දිගටම ඇතිරිල්ලක එලා මෙසේ සිතුවා'' මට දරුවන් ලැබේ නම් බුදු පියාණන් වහන්සේ මෙය පාගාගෙන වඩිනා සේක්වා'' කියා. තථාගතයන් වහ්නසේ එතැනට වැඩ එය ආනන්ද හිමි ලවා

අස්කරවා වැඩිසේක. කුමරු ඒ බව විචාළ කළ ඔහුට දරු සම්පත් අහිමි බව වදාළා. ඊටහේතුව එක ජීවිතයක බිරිඳ හා නැව් නැගී යද්දී නැව මුහුදුබත් වී අසළ දූපතකට ගොඩ වුණා. එහි බොහෝ පක්ෂීන් හා කුරුළු බිත්තර තිබුණා. දිවිගෙවීමට වෙන කළයුතු යමක් නැති බැවින් මේ දෙපළ පක්ෂි බිත්තර හා කුඩා පැටවුන් මරාගෙන අනුභව කොට ජීවත් වුණා. ඒ අකුසල කර්මය නිසා දරු සම්පත් නැති වඳ මිනිසුන් වුණා. එබැවින් සත්පුරුෂයෙනි, මේ අනුව තමන් කරන කියන දේ ගැන මදක් සිතා බලන්න.

(ධම්මපදට්ඨ කථා 509 පිට)

## 23. මල්ලිකා දේවිය දින 07 ක් ආපයට යෑමට හේතුව

මෙතුමිය සැවැත්නුවර කොසොල් රජුගේ අග්‍රමහේෂිකාව වේ. ඇය බොහේ සැදෑ ඇති අතර නිතර බණ ඇසීම්, දන් දීම්, සිල් රැකීම්, ධර්මය කටපාඩම් කිරීම් ආදී පින්කම් කළාය. බුදු සසුනේ එක් වරක් පමණක් දීමට හැකි අසදෘස මහා දානය දහතරකෝටියක් වියදම් කොට දෙන ලදී. නමුදු මිය යන විට ඇය බල්ලෙකු හා සංවාසයේ යෙදීමෙන් කළ පව සිහිවී ආපගත විය. අපායේ ඉපදුන ද කළ කුසල්බොහෝ හෙයින් දින 07 ක් දුක් විඳ ඉන් චුත වී තුසිත දෙව්ලොව ඉපදී සිටින බව වදාළ සේක.

## 24. රෝහිණී කුමරියගේ කුෂ්ඨ රෝගයට හේතුව

අනුරුද්ධ හිමිගේ නැගණිය වූ රෝහිණී කුමරිය බලවත් කුෂ්ඨ රෝගයකින් පෙළෙන්නීය. එබැවින් ඇය මහත් දුකක් විඳින්නීය. පසු කලෙක මෙතුමිය අනුරුද්ධ හිමිගේ උපදෙස් පරිදි තම ආභරණ මිළකොට දෙමහල් අසුන් හලක් කොට බුදු පාමොක් මහ සඟුනට පුදා නිතර පින් කළාය. ඒ පිනෙන් ඇගේ කුෂ්ඨ රෝගය සුව විය. මේ කුෂ්ඨ රෝගයට හේතුව තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක. ඈ පෙර බරණැස් රජුගේ අග මෙහෙසිය වී සිටිය දී අන්‍ය අන්තඃපුර ස්ත්‍රියක් කෙරෙහි ක්‍රොධයෙන් කසඹිලියා පත් ගෙන්වා සුනුකොට ඇගේ නිදන ඇඳේ ද ගා තබා ඇයගේ ඇඟට ද දැමුවාය. එම ස්ත්‍රිය කසඹිලියා සුනු ඇඟට දැමූ කළ තමා නිදන කාමරය වෙත දුවගොස් යහනේ පෙරළිනි. එහි දී දමා තිබූ කසඹිලියා පත්නිසා වේදනාව බලවත් වූවාය. මෙසේ ක්‍රෝධ සිතින් අනුන්ට කළවිපාක තමා වෙත විත් හොඳ නොවන කුෂ්ඨ රෝගයක්

සෑදි සමාජයට මුහුණ දීමට නොහැකි තත්වයකට පත් වූ බව වදාළ සේක.

(ධම්මපදට්ඨ කථා - 607 පිට)

## 25. කුණ්ඩධාන හිමි පසු පස කාන්තාවන් ඒමට හේතුව

මෙම තෙරුණ් මහණ වූ දා පටන් කාන්තා රූපයක්පසු පස එනු ලැබේ. මෙය තෙරුන් නොදන්නා අතර අන්‍යයන්ට පෙනෙන්නාහ. මේ කාන්තාවක් සේ පසු පස යන රුව දකින මිනිසුන් තෙරුන්ට නොමනා බස් කියති. මෙය දකිනා භික්ෂූන් ද දුස්සීල වාදයෙන් බනිති. තෙරුන්ට එබන්දක් නොපෙනෙ බැවින් තෙරුන් ද අන් අයට මුසාවාදීන් දුස්සීල යැයි බනිති.

පසුව තෙරුන් පසු පස කාන්තාවක් නොයන බව ද කර්ම බලයෙන් එවැන්නක් පෙනෙන බව ද කොසොල් රජු සොයාගත්තේය. තථාගතයන් වහන්සේ අතීත කර්මය වදාළ සේක.

මේ හිමි කාශ්‍යප බුදුන් කල දෙවියෙක්ව ඉපිද සමගිව විසූ දෙනමක් භේද කළේය. ඒ සමගි දෙනම වඩින විට එක නමකට කැසිකිළි කිස කිරීමට අවශ්‍ය විය. එබැවින් කැලෑවට පිවිසියේය. ඒ භික්ෂුව කැසිකිළි කිස කොට එන කල මේ දෙවියා කාන්තා වෙසක් ගෙන රෙද්ද හදමින් අත්වල වැලි ගසා දමමින් කෙසඟ බඳිමින් වට පිට බලමින් පසු පස ආවාය. මෙය දුටු අනෙක් භික්ෂුව දුස්සීල වාදයෙන් චෝදනා කළේය. දෙදෙනාම බහින් බස් විය. පෝය කිරීමට ද විරුද්ධ වූ කළ දෙවියා විත් තමා කළ වරද කියා සමාව ගත්තේද පෙර තිබූ හිතවත්කම නැවත පෙර සේ ඇතිකර ගත නොහැකි විය. මේ පෙර ආත්මයකදී දෙවියකුව සිටියදී කළ පාප ක්‍රියා බලයෙන් අවීචියේ ඉපිද දුක්විඳ දුන් ද මෙසේ කර්මය පලදුන් බව වදාල සේක.

(මනෝ රථ පූර්ණි නම් වූ අං. නි අට්ඨ කථා 146 පිටුව)

## 26. කපිල මත්ස්‍යයාගේ කථාව

සැවැත් නුවර අචිරවතී නදියෙන් කෙවුලන් පිරිසකට රන්වන් මත්ස්‍යයෙක් දැලට අසුවිය. ඔවුහු ඒ රන්වන් මත්ස්‍යයා දැක සතුටුව කොසොල් රජු වෙත ගෙන ගියහ. රජු බුදු සමිඳු වෙත ගෙන ගියේය. මේ මාළුවා රන්වන් පාට නමුදු මුඛය විවර කළ කල්හි මහා දුගඳක් පිටවේ. මෙතෙම කාශ්‍යප බුදු සසුනේ පැවිදිව අවුරුදු 20,000 ක්

මහණකම් කළ කෙනෙකි. එකල මොහු ත්‍රිපිටකාධාරී බහුශ්‍රැත ධර්ම කථික භික්ෂුවක් වී සිටියේය. ඒ පරියාප්ති ධර්මය දරාගෙන සිටි බැවින්ම පිරිවර ද බොහෝ විය. පිරිවර නිසා බොහෝ ලාභ සත්කාර ද ලැබෙන්නට විය. හෙතෙම බහුශ්‍රැත මානයෙන් මත්ව ලාභ තන්හාවෙන් මැඩුණේ අති පණ්ඩිත මානය බැවින් අකැප දෑ කැප ලෙස ද කැප දෑ අකැප ලෙස ද වැරදි සහිත දෑ නිවැරදි ලෙසද නිවැරදි දෑ වැරදි ලෙසද ධර්ම විනය වරදවා කීය. එහිදී ලජ්ජී පේසල භික්ෂූන් ඔහු හැර දැමීය. පසුව හෙතෙම දූරාචාරයේ යෙදෙමින් කාශ්‍යප සම්බුදු සසුනේ පරියාප්ති ධර්මය පසු බැස් වූ බැවින් කෙළෙසූ බැවින් අවීචි මහා නිරයේ උපන්නේය. බුදු සසුනේ පැවිදිව සිටි ඔහුගේ සොයුරු සෝධන තෙරුන් වහන්සේ රහත් වී පිරිනිවුණේය. භික්ෂුණී ශාසනයේ පැවිදිව සිටි සාධින නම් මොහුගේ මව හා තාපතා නම් බාල නැගණිය මොහුගේ දෘෂ්ඨි ගෙන පේසල භික්ෂූන්ට ආක්‍රෝෂ පරිභව කොට එම නිරයේම උපන්නීය. බුද්ධාන්තරයක්ම අවීචියේ පැසී පසුව අවීචියෙන් මිදී තිරිසන් ආත්මයක් ලැබී මත්ස්‍යයෙකු වී උපන්නේය. පෙර මොහු කාශ්‍යප බුදු සසුනෙ ධර්ම දේශනා කළ බුදු ගුණ කී පිනෙන් රන්වන් විය. භික්ෂූන්ට ආක්‍රෝෂ පරිභව කළ පවින් මුවින් දුගඳ හමන්නට වූ බව වදාළ සේක.

(ධම්ම පදට්ඨ කථා - 739 පිට)

## 27. මහා කාල උපාසක ගුටිකා මැරුම් කෑමට හේතුව

මොහු බණ අසා සෝවාන් වූ උපාසක තුමෙකි. දිනක් රාත්‍රි බණ ඇසීමට දෙව්රමට ගොස් බණ අසා උදෑසන දෙව්රම් වෙහෙර පොකුණකින් මුහුණු සෝදමින් සිටියේය. රෑ ගෙයක් බිඳ වස්තුව පැහැරගත් සොරු ගේ හිමියන් ලුහුබඳිනා කල මහාකාල උවසු ඉදිරියේ බඩු දමා පැන ගියහ. පසු පස පන්නා ආ ගේ හිමියෝ ඒ භාණ්ඩ , දැක නුඹ ගෙවල් බිඳිමින් බණ අසන්නෙකු සේ හැසිරෙනු දැයි, කියමින් හොඳටම ගසා මරා ගියහ. භික්ෂූන් මෙය දැක නිවැරදි මිනිසාට පහර කා මියයන්න වීම ගැන කම්පා වී බුදු සමිඳුට සැළ කළේ. තථාගතයන් වහන්සේ මෙසේ වීමට හේතුව වදාළ සේක. මොහු පෙර ආත්මයක දී එක් ස්ත්‍රියක් කෙරෙහි ප්‍රේමයෙන් ඇලී ඇය හිමිකර ගැනීමට ඇගේ නිරපරාද වූ ස්වාමියාට බොරු වරදක් පමුණුවා මැරුවේය. අකුසල කර්මය මතු වී මේ දිවියේ මෙසේ දුක් දී මැරෙන්නට වූයේ යැයි වදාළ සේක.

(ධම්ම පදට්ඨ කථා - 517 පිට)

## 28. සසර පුරුදු ඉදිරියට යන බව

දිනක් බණ ඇසීමට පස්දෙනෙකු පැමිණි අතර සිව්දෙනෙකු මනාව බණ නොඇසීය. ඒ පිරිස අතර එක් තැනැත්තෙක් නිදි කිරා වැටුණේය. එක් තැනැත්තෙක් ගසක අත්තක් සොළවමින් සිටියේය. එක් තැනැත්තෙක් බිම ඉරි අඳිමින් සිටියේය. එක් තැනැත්තෙක් අහස දෙස බලා සිටියේය. එක් තැනැත්තෙක් මනාව බණ ඇසීය. අනඳ හිමි අර සිව්දෙනා බණ නොඅසන්නේ මන්දැයි ඇසූ කල තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක. , ආනන්දයෙනි, හිඳගෙන නිදා සිටි තැනැත්තා පන්සීයක් ජාතියෙහි සර්පව උපන්නෙකි. ඉරි අඳිමින් සිටි තැනැත්තා පන්සීයක් ජාතියෙහි ගැඩවිල්ව උපන්නෙකි. අත්තක් සොළවමින් සිටි තැනැත්තා පන්සීයක් ජාතියෙහි වඳුරුව උපන්නෙකි. අහස දෙස බලමින් සිටි තැනැත්තා පන්සීයක් ජාතියෙහි නැකත් බලන්නෙකි. මනාකොට බණ අසමින් සිටි තැනැත්තා පන්සීයක් ජාතියෙහි බ්‍රාහ්මණව උපන්නෙකි. එකල ඔවුන්ගේ සසර පැවැති පුරුද්දට අනුව ඔවුන් දැනුත් මෙසේ කරති , යි වදාළ සේක.

මෙසේම පිලින්දිවච්ඡ මහරහතන් වහන්සේ , වසලයා, යැයි කියා මිනිසුන්ට කථා කරති. ඊට හේතුව ද පන්සියක් ජාතින්හී බ්‍රාහ්මණව ඉපිද සිටීමය. තව ද රහත් හිමිනමක් මහා මඩ වලෙන් පැනගොස් කුඩා මඩ වලෙන් බැස යාමට හේතුව ද උන් වහන්සේ පෙර ආසන්නයේ ආත්ම ගණනාවක්ම වඳුරුව ඉපදී ඇති බැවිනි. මෙසේම අකීකරු වීම, ස්ත්‍රීන්ට රැවටීම, මෝඩ ක්‍රියා කිරීම, කළගුණ සැලකීම්, නුවණින් කටයුතු කිරීම් ආදී බොහෝ ගුණාගුණ සසර පුරුදු ලෙස ඉදිරියට එන බව ජාතකට්ඨ කථාවට අනුව පෙනේ. බොහෝ කථාවල මහණෙනි දැන් පමණක් නොව මොහු පෙරත් මෙසේ කළේය. යනාදී ලෙස දක්වා ඇත. ඒ අනුව පුරුදු ඉදිරියට යන බව වටහාගෙන කුසල ක්‍රියා වලම නිරතවෙත්වා.

## 29. පනස් පන් වසක් අසූචි කා ජීවත් වූ මිනිසෙක්

මොහු නමින් ජම්බුක ආජීවකයාය. මොහු දැන තේරෙන වයසේ සිට ආහාර ලෙස අනුබව කරනුයේ අසූචිය. වෙන කිසිවක් නොකයි. මේ නිසා දෙමව්පියෝ ආජීවකයනට බාරදුනි. එහිදී ආජීවකයෝ තල් ඇටයක් ගෙන මොහුගේ කෙස් එක එක උගුලා දමා මොහු මහණ කළේය. මොහු දැන තේරෙන වයසේ පටන් නිර්වස්ත්‍රව සිටිති. වස්ත්‍ර

නොඅඳිති. ඇඳක නොසැතපෙති. බිමම නිදති. දිනක් සුගතයන් වහන්සේ මොහු සිටින තැනට වැඩ එහි එක් තැනක් නවාතැන් ගෙන මොහු දමනය කළ සේක. එහිදී ඔහු මෙසේ වීමට කළ පූර්ව කර්මය ද වදාළ සේක.

පෙර මොහු කාශ්‍යප බුදු සසුණේ පැවිදිව සිටියදී දායකයන් කෙරෙහි බොහෝම කුළුපගුව විසීය. ආගන්තුකව වැඩි රහත් නමකට දායකයන් පැහැදී දන් දී සිවුරකට සළුවක් ද පුදා පසුව කෙස් රැවුල් බෑමට කරණවෑමියෙක් හා නින්දට ඇඳක් ද ලබා දුනි. නේවාසික භික්ෂුව මෙයට හිත රිදවා ගෙන ආගන්තුකව වැඩි රහත් හිමිට බැණ වැදුණේය. ඇවැත්නි ආගන්තුකය (1) තුඹට සුදුසු කෙළෙඹියගේ බත නොව අසූචි කෑමටය. (2) කරණවෑමියා ලවා කෙස් රැවුල් බෑවිම නොව තල් ඇටයක් ගෙන කෙස් රැවුල් ගලවා දැමීමය. (3) දායකයන් දුන් රෙදි හැඳීමට වඩා නග්නව ඇවිදීම වටින්නේය. (4) ඇඳෙහි නිදීමට වඩා බිම නිදීම කළයුතු වේ. යනාදි ලෙස ගර්ජනා කළේය. රහතන් වහන්සේ මොහු තමන් නිසා පව් කරගන්නා බැවින් නොකියාම වැඩි සේක.

එදා මේ කරගත් අකුසලය නිසා මැරීගොස් අවීචි මහා නිරයෙහි ඉපිද අප බුද්ධ ශාසන කාලය වෙනකල් බුද්ධාන්තරයක්ම එහි මහත් දුක් වින්දේය. එයින් චුතව දැන් මේ මිනිස්ව ඉපිද පනස් පස් වසරක් අසූචි කා ජීවත්වීමට සිදුවූවායැයි තථාගතයන් වහන්සේ වදාළ සේක. ඔහු පෙර ජීවිතයේ රහතන් වහන්සේට කල ආක්‍රෝෂ හතරම තමන්ට විපාක දෙන ලදී. පසුව මේ ජම්බුක ආජීවකයා බණ අසා සිව් පිළිසිඹියාලාභි මහරහතන් වහන්සේ නමක් වී පැවිදි විය. බලන්න පින්වතුනි අවුරුදු විසිදාහක් පිරූ ශ්‍රමණ ධර්මයේ කුසලයට වත් ඔහු කළ අකුසලය යටකරගන්න බැරිවුණා. අපයේ ඉපිදී දුක් වින්දා, අසූචි කා නග්නව ජීවත් වන්නෙක් වුණා, පසුව අවුරුදු විසිදාහක් තුළ පැවිදිව පිරූ පාරමී මතුවී රහත් බවද ලබා දුන්නා. මේ නිසා කර්ම බලය නොව තේරුම් ගෙන කල්පනාකාරීව ජීවත්වීමට පෙළඹෙන්වා.

(ධම්ම පදට්ඨ කථා - 301 පිට)

## 30. ලකුණ්ඨක භද්දිය හිමි මිටි වී ඉපදීමට හේතුව

මෙම හිමියෝ රහතන් වහන්සේ නමකි. නමුදු බොහෝ මිටි බැවින් බොහෝ නො හික්මුණන්ගේ කෙළි කවටකම් සමච්චල් කිරීම් ආදියට ලක්වූහ. තථාගතයන් වහන්සේ දිනක් මේ හිමි මිටි වී ඉපදීමට හේතුව වදාළ සේක. පෙර කාශ්‍යප බුදු සසුනේ මහත් ධන පරිත්‍යාගයක් කොට බොහෝ දෙනා එකතුව කරන්න ගිය චෛත්‍ය පිංකම මෙතුමා මැදිහත් වී පිංකම කුඩාවට කරවීය. යොදුන් හතකට හදන්න සූදානම් වූ චෛත්‍ය යොදුනකට කිරීමට යෝජනා කළේය. ඒ හේතුවෙන් මෙසේ බලන්නට අප්‍රසන්න ලෙස නින්දාවට සුදුසු සේ මිටිවී ඉපදුන බව වදාළ සේක. එබැවින් සත්පුරුෂයෙනි, අනුන්ගේ පින්කම් බාල නොකෙරෙත්වා.

(අපදාන පාලිය 541 වන අපදානය)

## 31. මුගලන් හිමි සොරුන්ගෙන් මැරුම් කෑමට හේතුව

මුගලන් ස්වාමීන් වහන්සේ අප බුදු සසුනෙහි ඍද්ධිලාභින් අතර අග්‍ර වූ අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ වේ. නමුදු තීර්ථකයන්ගෙ අල්ලස් දීම නිසා තෙරුන් විසින් කාලසීලා පර්වතයේදී දේහය හාල් ඇට ගණනට කුඩු කළේය. මෙසේ සොරුන්ගේ පහර කෑමෙන් විනාශ වීමට හේතුව පෙර එක් ජීවිතයක බිරිඳගේ කේලාම් අසා තම නිරාපරාද දෙමව්පියන් කැලයට ගෙන ගොස් මරා දැමූ පාප ක්‍රියාව වදාළ සේක.

(විසුද්ධි පා. විලාසිනී නම් අපදානට්ඨ කථා 207 පිට)

## 32. සීවලී මහරහතන් වහන්සේ බොහෝ කාලයක් මව්කුස දුක්විඳි කර්මය

මේ හිමිට අවුරුදු හතකුත් මාස හතකුත් දින හතක් මව්කුස හිර වී දුක් විඳීමට සිදුවිය. මව්තුමිය වූ සුප්පාවාසාව ට ද මෙතරම් කාලයක් දරුකුස දරා සිටීමට සිදුවිය. අවසානයේදී දින 07 ක් දරුගැබ හරස්වී මහත් කටුක දුක් විඳීමට සිදුවිය. මෙයට හේතුව සුගතයන් වහන්සේ වදාළ සේක. සීවලී හිමියෝ පෙර රජෙකුව සිටියදී දුර්වල රාජ්‍යයක් අල්ලා ගැනීමට යුද්ධ කළේය. නමුදු ඒ කුඩා රට අල්ලා ගැනීමට නොහැකි විය. එවිට රටට ආහාර පාන එන මාර්ග සියල්ල වසා සත් අවුරුද්දකුත් සත් මසක් රැකවල් ද සිටියේය. නමුදු රට අල්ලාගත

නොහැකි වූ අතර මවගේ උපදෙස් පරිදි ඒ නුවරට ආහාර සපයන එකම උමගද වසා දැමීය. පසුව රට වැසියන් යටත් විය. එදා බලය පාවිච්චි කරමින් දුර්වල රටකට දුන් දුක් හේතුවෙන් මෙදා මෙසේ දුක් විඳීමට වූ බව ද මව දුන් උපදෙස් හේතුවෙන් මවටද ඒ කර්මය ආ බව වදාළ සේක. එබැවින් සත්පුරුෂයෝ බලය නොමගට නොයොදත්වා.
(ආසාත රූප ජාතකය)

## 33 සූචිලෝම යක්ෂයා වූ භික්ෂුව

බුදු රජුන් ජීවමාන කාලයෙහි ගයා ප්‍රදේශයෙහි සූචි ලෝම නම් කර්කෂ වූ ඉඳිකටු බඳු ලෝම ගස් ඇති යක්ෂයෙක් විය. දිනක් තථාගතයන් වහන්සේ ඔහුගෙ භවනට වැඩ ඔහු දමනය කොට සෝවාන් ඵලයෙහි පිහිටුවා වදාළ සේක. පෙර පිරූ පාරමී ඇති මොහු මෙලෙස ඉඳිකටු බඳු ලොම් ඇති යක්ෂයෙක් වීමට හේතුව මෙසේ වදාළ සේක. මොහු කාශ්‍යප සම්බුද්ධ සසුනෙහි භික්ෂුවක්ව සිටියදී දිනක් දිගු මාර්ගයක පැමිණ බොහෝ ඩහදිය තිබුණි. ඒ භික්ෂුව ඇඟ පිරිසිදු කර නොගෙන ඇඳට තම ඇතිරිල්ලක් ද නොගෙන සාංඝික ඇතිරිල්ල මත අනාදරව ඇලවුණා.

වසර 20,000ක් පැවිදි දම් පිරුවත් මේ වරද මතු වී ඩහදිය එන රෝම කූප ඉඳිකටු බඳු වූ යක්ෂයෙක් වී ඉපදුනි. ඒ දිවියේ ද සසර දී පිරූ පාරමී ඇති බැවින් මග ඵල නිවන් සුව ද ලැබු සේක. මේ සඳහන් කළේ සාරත්ථප්පකාසිනී නම් සංයුත්ත නිකායට්ඨ කථාවේ 233 පිටුව අනුවය. නමුත් සුත්ත නිකායේ නිපාතට්ඨ කථාවේ 271 පිටුවේ මොහු පෙර උපාසකයෙකු වී සිටියදී බණ ඇසීමට ගොස් සඟසතු ඇතිරිලි කිලිටි කළ පවින් ඉහත ආත්මය ලැබූ බව පෙන්වා දී ඇත.

## 34. ඛරලෝම යක්ෂයා වූ උපාසක තුමා

මොහු සූචිලෝම යක්ෂයාගේ මිත්‍ර යක්ෂයෙකි. මොහුගේ ශරීරය අතිශයින්ම කර්කශ සේම විසම ද වේ. එසේ වීමට හේතුව හෙතෙම කාශ්‍යප බුදු සසුනේ උපාසක මහතෙක් වී සිටියදී විහාරයෙහි විසිතුරු ලෙස සාංඝික ඇතිරිළි බිම අතුරා තිබූ අතර එහි තමාගේ උතුරු සළුව එලා නොගෙන නිකම්ම වාඩි විය. එසේම සඟසතු තෙල් සහිත අතින් තම සිරුරද පිරිමදින්න යැයි කීවේය. එසේ සඟසතු තෙල් ද පරිභෝග කළ බැවින් මෙසේ කර්කශ වූ ශරීරයක් ඇති යක්ෂ ආත්මයක් ලැබූ බව

වදාළ සේක. මෙහි සඳහන් කළේ සංයුක්ත නිකායට්ය කථාවෙහි සුචිලෝම සූත්‍ර වර්ණනාව අනුවය. පරමත්ථ ජෝතිකා නම් සුත්ත නිපාතට්ය කථාවට අනුව සඟසතු තෙල් නොවිචාරා ගෙන තමාගේ ඇඟේ ගා ගත් පවින් මෙසේ වූ බව කියා ඇත.

## 35. උත්තර නම් සාමනේරයන් වහන්සේ උල තැබීමට

දම් සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය නමක් වූ උන්වහන්සේ දිනක් සැරියුත් මහරහතන් වහන්සේ ලෙඩ වී ඊට බෙහෙතක් සෙවීම සඳහා වැඩියේය. මගදී දිය කඩිත්තක් දක මුව දෝවනය කරද්දී ගම් දරුවන් ලුහුබඳිනා හොරු පිරිසක් මුදල් පොදිය පාත්‍රයට දා ගියේය. මේ දරුවන් පාත්‍රයෙහි තිබූ මුදල් පොදිය දක සාමනේරයන් වහන්සේට පහර දී වස්සකාර බමුණාට පෙන්වා ඔහු අණ පරිදි උල තියන්න නියම විය. වස්සකාර බමුණාගේ දුව පෙර විවාහ කරගන්න කියද්දී විවාහ කර නොගත් බැවින් මෙසේ නො විමසා උල තැබීමට ඔහු නියම කළ බව දත යුතු.

දූෂිත නීතියෙන් උල තබන ලද මුන් වහන්සේ සැරියුත් හිමිට බෙහෙත කෙසේ ගෙන යනුයේ දැයි සිතීය. මෙය නුවණින් දුටු සැරියුත් මහ රහතන් වහන්සේ සුගතයන් වහන්සේට මෙය දන්වා පිරිස හා එතැනට වැඩි සේක. එහිදී මෙසේ විපාක දීමට කල අතීත කර්මය වදාල අතර උත්තර හිමියෝ දෙසුම කෙළෙවර රහත් විය. පෙර මුන් වහන්සේ කුඩා ළමයෙකුව සිටියදී කොහොඹ කුරක් ගෙන මැස්සෙක් උල තැබූ කර්මය හා තම මෑණියන්ට පෙර එක ජීවිතයකදී තරහ ගෙන, ඔබ දවසක් උල තබනවා, යැයි කළ ශාපය ද යන මේ කර්ම දෙක හේතුවෙන් 500 වාර්යක් මෙසේ කොහොඹ උල් උඩ දිනයක් මුලුල්ලෙහි තබන ලද බව වදාල සේක.

(සද්ධර්මාලංකාරය 197 පිට)

## 36 පද්මාවතී දේවියගේ තබන පියවරක් පාසා මල් පිපෙන පිත නැති වීමට හේතුව

මෙතුමිය පෙර කාශ්‍යප බුදු සසුනටත් අප බුදු සසුනටත් අතර කාලය තුළ එත් ජීවිතයක කිරීට වච්ජගේ දුව උම්මාදත්ත නම් දාසියක් විය. දිනක් කුඹුරෙහි කුරුල්ලන් එලවමින් සිටියදී පසේ බුදු කෙනෙක් දක පැහැදී විලඳ හා නෙලුම් මලක් පුදා පැතුමක් කළාය. මේ විලඳ ගණනට දරුවන් ලැබෙන්නත් ඒ අය පසේ බුදුන් වහන්සේ අවබෝධ

කරගත් ධර්මය අවබෝධ කරගන්නෝ වෙන්නත් මතු තමා සියළු ස්ත්‍රීන්ට වඩා රූමතියක් වී ඉපදෙන්නත් පැතුවාය. නෙලුම් මල පිදූ පිනින් තබන පියවරක් ගානේ නෙලුම් මල් පිපේවායි ද පැතුමක් කළාය. පසුව පසේ බුදුන් වඩිද්දී පසේ බුදුන්ට නෙලුම් මලින් කවර ප්‍රයෝජනයක් ඇත්දැයි සිතා නැවත දුවගොස් නෙලුම් මල් ඉල්ලාගත්තීය.

පසුව නැවතත් සිතන්නී පසේ බුදුන් නෙලුම් මල අනවශ්‍ය නම් ගෙන නොයනු ඇත. එය ගෙන ගියේ ප්‍රයෝජන ඇති බැවිනැයි සිතා නැවත දුවගොස් ඒ මල දී සමාව ගන්නා ලදී. මෙතුමිය කළ පැතුම් සියල්ල පත්මාවතී නමින් උපන් ජීවිතයේ එලදුන් අතර රජ මහේෂිකාවක් ද වූවාය. ඇය තබන පියවරක් පාසා නෙලුම් මල් ද පිපුණේය. පසු කලෙක ඇය රජුට එපා වී යැවූ අතර තබන පියවරක් පාසා නෙලුම් මල් පිපෙන බව ද නැතිවිය. මෙසේ වීමට හේතුව එදා ඒ නෙලුම් මල පුදා නැවත ගත් බැවින් බව දත යුතු පසු කලෙක ඈ රජ මෙහෙසිය වූ අතර පෙර තිබූ ඉසුරුමත් දිවිය නැවත ලැබුවාය. ඊට හේතුව ගත් නෙලුම් මල නැවත පිදූ බැවින් යැයි දත යුතුය.

( සද්ධර්මාලංකාරය 172 පිට )

## 37. නිග්‍රෝධ සාමනේරයන් වහන්සේ චණ්ඩාල ගමක අනාථව ඉපදීමට හේතුව

පෙර එක් දිවියක දඹදිව ධර්මාශෝක රජු ද ලංකාවේ දෙවන පෑතිස් රජු ද නිග්‍රෝධ සාමනේරයන් වහන්සේ ද මී පැණි විකුණා දිවි ගෙවන පවුලක ඉපදුනු අතර එහි පසේ බුදු කෙනෙක් ගිලන්ව සිටින හෙයින් ඒ සඳහා පසේ බුදු කෙනෙකු මී පැණි සොයාගෙන වැඩි සේක. බාල සොහොයුරා මී පැණි කලයක් ගෙන පාත්‍රය උතුරා යන තරම් පුදා දඹදිව අධිරාජ්‍ය කිරීමට පැතුවේය. සොයුරන් තිදෙනා හවුලේ කරන වෙළඳාමක් බැවින් වැඩිමහලු සොයුරා මෙය අසා හිස මුඩු කළ සැඬොලන් ද ඇත. එබැවින් මොහු මී පැණි කලය චණ්ඩාලයෙකුට දෙන්න ඇතැයි ගර්හා කළේය. මේ දානය ගැන දැනගත් දෙවැනි අයියා කිව්වේ නුබේ ඔය පසේ බුදුන් අපට අවශ්‍ය නැත. මුහුදින් එතෙර දමාපිය යැයි කීය. පසුව බාල සොහොයුරාගේ පසේ බුදු වර්ණනාව අසා පිනද අනුමෝදන් විය. නමුදු මුලදී දොස් නැගි බැවින් එහි විපාක මෙසේ විය.

ශ්‍රද්ධාවෙන් මී පැණි පුදා දඹදිව අධිරාජ්‍යයා වීමට පැතූ බාල සොහොයුරා ඒ පිනෙන් ධර්මාශෝක අධිරාජ්‍යයා විය. පසේ බුදුනට නැති තැන නමුදු චණ්ඩල වාදයෙන් බැන්න වැඩිමහල් සොයුරා එකල සැඩොල් ගමක් මැද නුග ගසක් මුල අනාථව ඉපිද පසුව පැවිදිව නිග්‍රෝධ මහ රහතන් වහන්සේ විය. නුඹේ පසේ බුදුන් මුහුදින් එතෙරට දමව යැයි කී දෙවන අයියා ඉන්දීය මුහුදින් වෙන් වූ ලංකා තලයේ දෙවන පෑතිස් රජු විය. එබැවින් සත්පුරුෂයෙනි, තමා කියන කරන දෑ බොහෝ කල්පනාකොටම කියත්වා

(මහා වංශය සිංහල 21 පිට)

## 38. ස්වර්ණ තිලකා කුමරිය සැඩොල් කුලයක ඉපදීමට හේතුව

මෙතුමිය දිනක් මව සමග ලංකාවේ අභයගිරි චෛත්‍ය වැඳීමට ගොස් මල් අසුන අපිරිසිදු බැවින් එය පිරිසිදු කිරීමට පැන් ගෙන ඒමට මව ගිය අතර මෙතුමිය ඒ අපිරිසිදු මල් ආසනයේ , නමුදු සිත පහදවාගෙන ගෙනා සියළු මල් පුදා දුටු දුටු පුරුෂයන් වසඟ කරවන රූප සම්පත් පැතුවාය. මව්තුමිය පැන් ගෙනැවිත් බලන කල අපිරිසිදු මල් අසුනේම මල් පුදා ඇති බව දැක තම දුවට සැඩොල් කෙල්ල යැයි කියා කළ වරදට දොස් නැගීය. ඇයද තම මවට කිපී චණ්ඩාල කෙල්ල නම් ඔබමයි කියා කීවාය. පසු කලෙක මේ දුව දඹදිව මධුරා නුවර වීණා වාදනය කරන සැඩොල් කුලයක උපන් අතර දුටු දුටු පුරුෂයන් වසඟ කරන රූප සම්පත්තියක් ද ලැබුවාය.

ඇය ලබා ගන්නට නොහැකි වූ රජ දරුවන් පස්දෙනෙක් සිය දිවි නසා ගත්හ. අවසානයේ ඇයට ද රූප සම්පත්තිය නිසාම මැරෙන්නට වූවාය. එබැවින් තම මව්පියන්ට නොබැණිය යුතු අතර කරන පැතුම් ද මෙලෙස තමන්ටත් අනුන්ටත් දුක් දෙන පැතුම් නොවිය යුතුය.

(සද්ධර්මාලංකාරය 363 පිට)

## 39. කැළණි තෙරුන් වහන්සේ කකියන තෙල් කටාරමකට දමා මරන්න හේතුව

මේ තෙරුන් වහන්සේ කැළණි වෙහෙරෙහි විසූ අතර කැළණි තිස්ස රජුගේ බිසව හා උත්තිය නම් යුව රජ අතර නොමනා සම්බන්ධයක් තිබිණි. මෙය දැනගත් රජු ඔහු මරන්න සොයද්දී ඔහු පැනගොස්

සැඟවී සිට තරුණයෙකු හිතවත් කරගෙන ඔහුට සිවුරු පොරවා රජ දේවියට හසුන් පතක් දෙන්න යැයි දී එවන ලදී. මේ හොර පැවිද්දා කැළණි තෙරුන් වඩිද්දී පසුපස ගොස් දත් වළඳා එන ගමන් දේවියට ගන්න පෙනෙන සේ ඒ හසුන්පත හෙලීය. එය දුටු රජු එය ගෙන කියවා කිපී මෙය කැළණි තෙරුන් ලියා පොඩි නම අත බිසවට දෙන ලද්දක් යැයි සිතා තෙරුන් තෙල් කටාරමේ ලා ගිනිගසා මරවන්න නියෝග කළේය.

තෙරුන් වහන්සේ රහත් බැවින් එහි බද්ධ පරියංකයෙන් සිට මෙසේ වීමට හේතු වූ අකුසලය බැලූ සේක. තෙරුන් එක ආත්මයක ගොපළු දරුවෙකුව සිටියදී කිරි උණුකරන විට මැස්සෙකු අල්ලා දමා කකාරා මැරූ අකුසලය දැක මෙය නැවැත්විය නොහැකි කර්මයකැයි දැන එහිම පිරිනිවුන සේක. පසුව දෙවියන් කිපී මුහුද ගොඩ ගලා රජුගේ දුව බිළි දී ඇය විහාර මහා දේවිය යැයි රුහුණට ගොඩ බැස්සාය. ජීන්වතුනි, මැස්සකු මැරූ කර්මය මෙතරම් බරපතල නම් වෙන සතෙකු මැරුවොත් කොහොම විපාක දේ දැයි සිතිය යුතුය.

(සද්ධර්මාලංකාරය 446 පිට)

## 40. සාලිය කුමරුගේ ආදරවන්තිය අසෝකමාලා සැඬොල් කුලයක ඉපදුනේ ඇයි?

දුටුගැමුණු රජුගේ පුත් සාලිය කුමරු නිතරම දානමය පුණ්‍යකර්ම කිරීමට සිත නැමුණු කෙනෙකි. නමුදු විවාහ කරගත්තේ අතිශයින්ම පියකරු රූ සපුවකින් යුත් සූ සැටක් ස්ත්‍රී ලක්‍ෂණයන්ගෙන් හෙබි අශෝකමාලා නම් සැඬොල් කුමරියක් වේ. සාලිය කුමරු ඇයට බැඳි පෙම නිසා රජ සැප ද අතහැරියේය. මතු මෛත්‍රී බුදු සසුනේ මෛත්‍රී බුදු රජුන්ගේ බ්‍රහ්ම වර්ධන නම් එකම පුත්‍රයා වී ඉපදෙන්නේද මේ සාලිය කුමරුය. මෙතුමාගේ බිරිඳ සැඬොල් කුලයක ඉපදීමට හේතුව නම් ඇය පෙර මේ ලක්දිව සුමනා නමින් ඉපිද තරුණියකව සිටියදී දිනක් ඉඳුල් ඉහිරවා ආහාර ගෙන ඇති බව දුටු ඇගේ මව්තුමිය ඇයට , සැඬොල් කෙල්ල තෝ කුමක් නිසා මේ අපිරිසිදු කරන්නේ දැයි, දොස් නැගීය. එහිදී සුමනාවෝ මව කෙරෙහි කිපී , චණ්ඩාල කෙල්ල නම් මා නොව මෑනියන්ම යැයි, කීවාය. මෙහි විපාක වශයෙන් ඇය මේ ජීවිතයේ සැඬොල් කුලයක ඉපදුන බව ධර්මයේ දක්වා ඇත.

(සද්ධර්මාලංකාරය 549 පිට)

## 41. දාසක හිමි දාසියකගේ කුස ඉපදීමට හේතුව

මේ ස්වාමීන් වහන්සේ අනේපිඬු සිටුතුමාගේ ගෙදර බැලමෙහෙවර කරන දාසියකගේ කුස ඉපදීමට හේතුව මෙසේය. පෙර මෙතුමා කාශ්‍යප බුදු සසුනේ එක් මහරහතන් වහන්සේ නමකට උපස්ථාන කළ අතර දිනක් යම්කිසි සුළු වැඩක් තෙරුන් ලවා කෙරෙව්වේය. (ස්වාමීනි, ඔතන තියෙන පොත අරන් දෙන්න කියන්නා වාගේ) ඒ කරගත් අකුසල කර්ම බලයෙන් අප බුදු සසුන කාලයේ දාසියක කුස උපන් බව දක්වා ඇත. එබැවින් පැවිද්දන් භජනය කිරීම බොහෝම පරිස්සමෙන් කළයුතු වැඩක් බව දතයුතු

(පරමත්ථ දීපනීනම් ථෙර ගාථාට්ඨකථා 69 පිට)

## 42. අඩ්ඪකාසියගේ විශිෂ්ඨ රූප සම්පත් ලැබීමට හා ගණිකාවක් වීමට හේතුව

මෙතුමිය රජගහ නුවර අභිරූපමත් කාන්තාවක් වූවාය. ඇයගේ විශිෂ්ඨ රූප ශෝභාව නිසාම ඇය සියළු රජ දරුවන්ට පරිභෝගයට ගැනීමට ගණිකාවක් කොට තබන ලදී. ඇය මෙසේ බෙහෙවින්ම පරාධීන වූ ජීවිත වෘතියක තියැලීමට හේතුව මෙසේ දත යුතු, මෙතුමිය පෙර කාශ්‍යප බුදු සසුණේ පැවිදිව මනාව බඹසර ආරක්‍ෂා කළ අතර එක් දිනක් රහත් භික්‍ෂුවකට , ගණිකාව, යැයි ආක්‍රෝෂ කළ පවින් නිරයෙහි පැසී පසුව මෙකළ මෙසේ පරාධීන පහත් ජීවිතයක් ලැබූවාය. කාශ්‍යප සසුනේ බඹසර රැකි පිනෙන් විශිෂ්ඨ රූප සම්පත් ලැබූවාය. දූතේන උපසම්පදාව ලැබුවේද මෙතුමිය වේ. පසුව සසුනේ පැවිදිව රහත් වූවාය.

(අපදාන පාලියේ අඩ්ඪකාසි ථේරි අපදානය)

## 43. සාතාගිර හේමවත නැමැති යක්‍ෂයන් වූ ත්‍රිපිටකධාරී භික්‍ෂූන් දෙනම

කාශ්‍යප බුදු සසුනේ බොහෝම මිත්‍ර කුල පුත්‍රයන් දෙදෙනෙකු පැවිදි වුණා. දෙදෙනාම තරුණ කාලයෙහිම පැවිදි වූ බැවින් ග්‍රන්ථ ධූරය හැදෑරුවා. ප්‍රකෘතියෙන්ම ප්‍රඥාවන්ත වූ මේ දෙදෙනා වහන්සේ නොබෝ කලකින්ම ත්‍රිපිඨකාධාරී ව්‍යක්ත බහුශ්‍රැත භික්‍ෂූන් දෙනමක් වුණා. එසේම විනය විනිශ්චයේ ද අති දක්‍ෂ වූණා. එක එක නමට 500 ගණනේ දහසක් පිරිවර භික්‍ෂූන් ද වුණා. එනමුදු අවාසානවක මහිමය,

අධර්මවාදී දුශ්සීල භික්ෂූනගේ ලාභ සත්කාර හමුවේ හිස නමන්නත් වුණා.

දිනක් සසුනෙන් ඉවත් වීමට සුදුසු දුශ්සීල භික්ෂුවකට චෝදනාවක් එල්ල වී එය විනිශ්චය කිරීමේදී ලාභ සත්කාර වලට ගිජුවී ධර්මය විනය ශාස්තෲ සාසනය වසා බුදු සසුන නොරැක පුද්ගලයන් රකිමින් අගතිගාමීව විනය විරෝධීව ඒ ප්‍රශ්න විනිශ්චය කළා. ඒ හේතුවෙන් දුශ්සීල භික්ෂුව ආරක්ෂා වුණා. සිල්වත් භික්ෂුව හඬමින් පරාදීනව යන්නට ගියේය. එදා ඒ ලාභ සත්කාරයට ගිජු වී මේ කළ අධර්ම ක්‍රියාව නිසා ඒ මහ තෙරුන් දෙනම ඇතුළු ඊට පක්ෂවූ පිරිවර 1000 ක් දෙනාටම දෙව්මිනිස් යෝනියක උපත ආවර්ණය වුණා. යක්ෂයන් වී උපන්නා.

වැඩිහිටි භික්ෂුව හේමවත නම් යක්ෂයා වුණා. අනිත් මහ තෙරුන් සාතාගිර නම් යක්ෂයා වුණා. අධර්මවාදී 1000 ක් භික්ෂූන් ද පිරිවර යක්ෂයන් වී ඉපදුනා. මේ අයට පෙර පැවිදිව සිටිය දී උවටැන් කළ දායක පින්වතුන් දෙව්ලොව ඉපදුනා. මේ යක්ෂයන් ඒ කරුණ දැක මහත් ලැජ්ජාවට පත්වුණා. මේ මහ පොලොව එක යොදුනක් ගව් තුනක් වැඩෙන තුරු අප බුදු සසුන දක්වාම ඒ යක්ෂ ආත්මයෙන් අත් මිදෙන්න බැරිවුණා. දිනක් තථාගත ධර්මය ශ්‍රවණය කොට පෙර පිරූ පාරමී ඇති බැවින් මේ දෙයක්ෂයන් ප්‍රධාන පිරිවර 1000ක් යක්ෂයන් සෝවාන් වුණා. නමුත් අදටත් යක්ෂ යෝනියෙහිමයි. එබැවින් බුද්ධිමත් සත්පුරුෂයෝ විනය විනිශ්චයකදී පුද්ගලයන් නොරැක සම්බුදු සසුනම රකිත්වා.

(පරමත්ථ ජෝතිකා නාම සූත්ත නිපාතට්ඨ කථා - හේහමවත සූත්ත වණ්නනා 148 පිට)

## 44. මුවින් දුගඳ පිටවන රූමතිය

මෙතුමිය කාශ්‍යප මහ රහතන් වහන්සේ ගේ පුරාණ දූතිකාව භද්‍ර කපිලානිය වේ. මේ පච්ඡිම දිවියේ නොව පෙර එක් ජීවිතයක ඇයට විපාක දුන් කර්මයක් පෙන්වා ඇත. මෙතුමිය තරුණියක්ව විවාහ වී සිටියදී ස්වාමි පුරුෂයාට වෙන්කොට තබන ලද ආහාර කොටස තිවසට වැඩි පසේ බුදුන් වහන්සේ නමකට ස්වාමිපුරුෂයාගේ නැගණිය විසින් පූජාකරන්නට යෙදුනා. ස්වාමි පුත්‍රයා එයට සතුටු නොවුණු බැවින් ඔහු කෙරෙහි ඇති බලවත් ආදරය නිසා පසේ බුදු

හිමි පාත්‍රයෙන් ඒ දන් කොටස නැවත රැගෙන තම ස්වාමියාට පිළිගැන්වූවා.

එහිදී ඔහු ඒ දන නැවත පසේ බුදු හිමිට පිදුවා. මෙයට තරහගත් මෙතුමිය පසේ බුදු හිමිගේ පාත්‍රයෙහි තිබූ දානය විසිකොට පාත්‍රයට මඩ පුරා දුන්නා. ස්වාමියාගේ නැගණිය දාන පාත්‍රය දෙන විට ද , තමා මේ මඩ පිරවූ පාත්‍රය දෙන විටද, ඒ පසේ බුදු හිමිගේ මුහුණේ වෙනසක් නොවුණා. මෙය දුටු මැය කම්පා වී සමාව ගෙන පාත්‍රය නැවත සුවඳ දියෙන් සෝදවා ඉතා මියුරු දානයක් පූජා කළා. නමුදු කළ කර්මයට විපාක ලෙස එතුමියගේ මුවින් දුගඳ වහනය වන්නට වූ බව ධර්මයෙහි සඳහන් වේ.

## 45. සුප්පිය රහතන් වහන්සේ පහත් කුලයක ඉපදීමට හේතුව

මේ ස්වාමීන් වහන්සේ පෙර කාශ්‍යප බුදු සසුනෙහි පැවිදි වී බහුශ්‍රැත භික්ෂුවක් විය. එසේම ගිහිකල ක්ෂත්‍රිය කුලයක උපන්නෙක් ද වේ. එබැවින් ජාතිමදයෙන් හා සුතමදයෙන් මත්ව තමා උසස් කොට අනුන් පහත් කොට සිතමින් කටයුතු කළ අතර ඒ අකුසල බලයෙන් සැවැත්නුවර මිණී දවන කනත්තවල් බලාගන්නා කුලයෙහි ඉපදුන අතර සුප්පිය යැයි නම් තබන ලදී. තම මිත්‍ර සෝපාක හිමිගෙන් බණ අසා පැවිදිව විදසුන් වඩා පසු කලෙක රහත් වූයේය.

## 46. සමිති ගුත්ත හිමිගේ ශරීරය කුණු වී වැගිරෙන්නට හේතුව

මේ ස්වාමින් වහන්සේ පෙර පසේ බුදු කෙනෙකුට , මේ මුඩු ශ්‍රමණයා ඇඟ කුණුවී ඇති බැවින් ඇඟ වසා පොරවා යන්නෙමියි හඟිමි, කියා දෝෂාරෝපණය කිරීමහේතුයෙන් බොහෝ කල් නිරයෙහි පැසී කාශ්‍යප බුද්ධ කාලයේදී පිරිවැජියෙක් වී සිටියදී සිල්වත් උපාසක මහත , නුඹ කුෂ්ඨ රෝගියෙකු වන්නෙහිය, කියා ආක්‍රෝෂ කළේය. නාන තොටුපෙලෙහි තබන ලද සුනු සබන් ආදිය ද විනාශ කර දමන ලදී. එහි විපාක ලෙස නිරයෙහි පැසී දුක් විඳ මනුලොව ඉපිද බුදු සසුනේ පැවිදි වී සිටියදී මහා කුෂ්ඨ රෝගයක් වැළඳී ඇඟ කුණුව දියවෙවී වැගිරෙන්නට ගත්හ.

ගිලන් භික්ෂූන්ගේ සුවදුක් බැලීමට ගිය සැරියුත් මහ රහතන් වහන්සේ මේ භික්ෂුව දැක ,යාවතා බන්ධප්පවත්ති නාම සුක්ඛං දුක්ඛ මේව වේදනා දික්ඛන්ධේසු පන අසන්තේසු යේව නත්ථි දුක්ඛං, ඇවැත්නි

helaboduhavula@gmail.com

යම්තාක් ස්කන්ධයන්හි නොපැවැත්ම වූයේ ද එහි දුක ද නැත්තේය ය වේදනා විදර්ශනා කමටහන වදාර වැඩි අතර උන් වහන්සේ ඒ කමටහන වඩා රහත් විය.

(ථේරගාථට්ඨ කථා 175 පිට)

## 47. ආනන්ද ස්වාමීන් වහන්සේ පෙර ජාතියකදී කාන්තාවක් වී ඉපදීමට හේතුව

අප බුදු සසුනෙහි සතිමන්ත ගතිමන්ත ධිතමන්ත බහුශ්‍රැත අග්‍ර උපස්ථායක ආනන්ද ස්වාමීන් වහන්සේ ද පෙර එක් ජීවිතයක ධනවත් රන්කරුවෙක්ව සිටිය දී පරදාර සේවනයේ යෙදී බොහෝ දුක් විපාක වින්දේය. එදා රන්කරු කාලයේ කළා වූ පාප කර්මය අළුයට ගිනිමෙන් අවකාශයක් නොලබා කුසල කර්මයක විපාක වශයෙන් සිටු පුත්‍රයෙක්ව උපන්නේය. එහිදී කල්‍යාණ මිත්‍ර ඇසුර ඇතිව බොහෝ කුසල කර්ම කළේය.

නමුත් පෙර රන්කරු කාලයේ කළා වූ පරදාර කර්මය අළුයට ගිනිමෙන් මතුවී එයින් චුතව රෝරුව මහා නරකයේ බොහෝ කාලයක් පැසුනේය. බොහෝ දුක් විඳ එයින් චුතව පරදාර කර්මයේ විපාක වශයෙන් මහත් බල සම්පන්න (ගැල් වල) යානාවල යෙදෙන්නා වූ උදුරන ලද බීජ ඇති එළුවෙක් වෙලා උපන්නේය. එයින්ද මැරීගොස් දසන්ත රට මහත් බලවත් ගොනෙක් වී බීජුද්ධරණය කොට (දෙනුන් ගැබ් ගැන්වීමේ ශක්තිය නැතිකොට) ගැල් අදිමින් පරදාර කර්මයේ විපාක විඳ එම පරදාර කර්මය හේතුවෙන් නැවතත් ඉන් චුතව වැදූ රට ස්ත්‍රියක් ද පුරුෂයෙක්ද නොවූ නපුංසකයෙක්ව උපන්නේය. ඉන් ද මැරීගොස් තව්තිසා දෙව්ලොව දෙවඟනක් වී උපන්නේය.

මෙසේ නැවතත් තුන් වතාවක්ම සක් දෙව්දගේ පාද චාරිකාවක් වී ද නැවත දෙවරක්ම ජවන නම් දෙව් සුන්ට අගමෙහෙසිය වී ද ඉන් චුතවී අංගාතී රජුගේ අගමෙහෙසිය කුස පිලිසිඳ රුජා නම් රාජ කන්‍යාවක් වී ඒ ආත්මයෙන් අත්මිදී තව්තිසා දෙව්ලොව මහත් ආනුභව සම්පන්න දිව්‍ය පුත්‍රයෙක්ව උපන්නේය. මෙසේ පාරමී පුරන්නා වූ මහත් පුණ්‍යවන්තයන්ට පවා පරදර සේවනය හේතුවෙන් මහත් දුක් විපාක විඳින්න සිදුවිය. එබැවින් සසර සැප කැමති සත්පුරුෂයන් විසින් පර පුරුෂ පර ස්ත්‍රී සේවනයෙන් තම ජීවිත ආරක්ෂාකර ගනිත්වා.

(නාරද කාශ්‍යප ජාතකය)

## 48. සත්ව ඝාතනයේ ආදීනව

එක් කාලයක දිසාපාමොක් ඇදුරු තුමෙක් මතක හතක් දෙන්නෙමි යැයි එළුවෙකු මැරීමට සූදානම් වී අතවැසියා හට කීවා, එළුවා නාවා බෙල්ලට මාලයක් පළඳවා ශරීරය අලංකාර කොට ගෙන එන ලෙස එළුවා නාවා තැබූවිට එළුවාට පෙර ඉපදී සිටි ආකාරය බැලිය හැකි ජාතිස්මරණ ඥානය පහළ විය. පසුව එළුවා එකපාරටම සිනාසී නැවත හැඬුවාය. මෙය දුටු ශිෂ්‍යයාට එළුවා හා කථා කිරීමට හැකි බැවින් ඔහු මෙය එළුවාගෙන් ඇසූ කල ආචාරින් වහන්සේ ඉදිරිපිට සියල්ල කීවා.

තමා පෙර මෙසේම දිශාවන්ට ප්‍රධාන ගුරු උතුමෙකු වී සිටියද මතක හතක් දීමට එක් එළුවකු මරා එකක් අඩු පන්සිය වතාවක් ආත්මවල දී හිස සිඳලීමට ලක් වූ බවද මේ අවසන් වාරය බව දැක සිනා සුන බවද පැවසුවා. අඬන්න හේතුව දැන් තමා මැරීම නිසා මෙතෙක් දිගු කලක් තමාට දුක් විඳින්න සිදුවුණා වගේ මේ වර බමුණාට දුක් විඳින්නට වන බව කල්පනා කළ බැවින් යැයි කීවාය. පසුව ඇදුරුතුමා එළුවා නොමැරුවේ නමුදු, එදිනම හෙන පහරක් ගලකට වැදී ගල් පතුරක් ගැලවී විත් එළුවාගේ බෙල්ලට වැදී හිස වෙන්වී ගොස් එළුවා මැරුණු බව දැක්වේ. එබැවින් සත්ව ඝාතනයෙන් වැලකෙත්වා.

(ජාතකට්ඨ කථාවේ මතක හත්ත ජාතකය -149 පිට)

## 49. බීජක නම් දාසයාගේ පූර්ව කර්මය

ජාතකට්ඨ කථාවේ නාරද කාශ්‍යප ජාතකයේ එන අංගාත නම් රජුගේ රුජා නම් දියණියට අතීත ජාති හතක් ද අනාගතය පිළිබඳ ජාති හතක් ද දැකීමට හැකිවේ. මේ රුජා නම් රජ දුව වී ඉපිදි සිටියේ කල්ප ලක්ෂයක් පාරමී පුරාගෙන එන ලද අනද හිමි වේ. මෙතුමියගේ ඒ අතීත භවය පිළිබඳ බැලිය හැකි ඥානයෙන් මේ බීජක නම් දාසයා දාසයකු වීමට පූර්වයේ කළ පාප කර්මය දැක බලා කීවාය. මේ දාසයා පෙර ජීවිතයකදී භික්ෂූන් වහන්සෙ නමකට ආක්‍රෝශ පරිභව කළ පවින් බව දැක බලා කියන ලදී. එදා ඒ බීජක නම් දාසයා වී ඉපදී සිටියේ මුගලන් ස්වාමීන් වහන්සේ බව දතයුතු

helaboduhavula@gmail.com

## 50. සාම කුමරුගේ මව්පිය දෙපලගේ ඇස් අන්ධවීමට හේතුව

දූකුල කුමාරයෝ සහ පාරිකා කුමරිය පෙර වෛද්‍ය වෘත්තියෙහි නිරත වී සිටියදී ඇස් නොපෙනෙන මිනිසෙකුගේ ඇස් බෙහෙත් කොට සුවකළා. පසුව ඇස් සුව වුවද ගිවිසගත් සේ මිල නොදුන්හ. මෙය වෛද්‍ය තුමා අඹුවට කී විට කුලී නොදෙන්නේ නම් ඇස් අන්ධ කරව යැයි ඈ පැවසීය. අඹුවගේ බස පිළිගෙන ඇස් අන්ධ වන ලෙස බෙහෙත් ගිල්වා පෙණුනු ඇස් නැවත අන්ධ කළේය. ඒ අකුසල බලයෙන් මෙහිදී දෙදෙනාගේම දෑස් අන්ධ වූහ. කාශ්‍යප හිමි හා භද්‍රකාපිලානි යන මේ දෙදෙනා පෙර මේ සාම කුමරුගේ මාපියන් වී දෑස් අන්ධ වූ බව දත යුතු

(සාම ජාතකය)

## 51. මහා පිනැති පුණ්නා කුමරිය දාසියක් වීමට හේතුව

මෙතුමිය සැවැත් නුවර වතුර අදින දාසි ගෙදරක ඉපදුන අතර පුණ්නා යන නම ඇයට වූවාය. පෙර ඕතොමෝ විපස්සී සිඛී වෙස්සභූ කකුසඳ කෝනාගම කාශ්‍යප යන සෑම බුද්ධ සසුනකම පැවිදිව සිල්වත් ගුණවත් බහුශ්‍රැත ප්‍රියශීලී ධර්ම කථික මෙහෙනක්ව වාසය කළාය. බොහෝම ධර්ම කථික බැවින් ජනයා අතර ප්‍රසිද්ධ වූවාය. තම බහුශ්‍රැත භාවය හේතුවෙන් එක ප්‍රියශීලී මෙහෙනක් පහත්කොට සිතූ පවින් ආත්ම ගණනක් දාසියක් වී උපන්නාය.

මේ දිවියේද එසේම කර්ම විපාක දුන්නාය. පෙර මහත දම් පිරූ පිනෙන් රහත් වූවාය. මානය යනු පහත් ක්ලේශයකි. , මානෝ මක්කටෝ අතිමානෝ කුක්කුරෝ , යැයි බුදු රජාණන් වහන්සේ වදාරා ඇති පරිදි මානය හේතුවෙන් වඳුරන් වේ. ගොඩක් ම උඩඟු වීම අහංකාර වීම හේතුවෙන් සුනඛයින් වී ඉපදේ. මනුලොව මිනිසෙකු වී ඉපදුන ද පහත් කුලයක ඉපදේ.

(අපදාන පාලියේ පුණ්නා ථේරි අපදානය)

## 52. මෛත්‍රී බුදු රජුන්ගේ ශ්‍රී හස්තයෙහි ගෙඩියක් ඒමට හේතුව

පෙර එක් ජීවිතයක අප මහ බෝසතාණන් වහන්සේ රජෙකුව ඉපදී සිටියදී මෛත්‍රී බෝධිසත්වයන් වහන්සේ ඒ රජුගේ ඇත්ගාලේ ඇතුන් හික්මවන ඇත්ගොව්වා විය. දිනක් රජු ඇතෙකු පිට යද්දී ඒ

ඇතාට ඇතින්නියන්ගේ හද දැනී මද කිපී කැලෑවට යන්නට විය. රජු ඇතුගේ ගමන වලකා ගත නොහැකිව ගසක එල්ලී ජීවිතය බේරා ගත්තේය. පසුව නගරයට විත් ඇත්ගොව්වා ගෙන්වා නොහික්මුණු ඇතෙකු සරසා දීම ගැන හොඳටම දොස් නැගීය. ඇත්ගොව්වා කරුණු කීවද රජු නොපිළිගත්තේය.

ඇතු කීප දිනක් ඇතින්නන් හා සිට රාග හැසිරීම සපුරාගෙන නැවත ඇත් හලට ආවේය. පසුව ඇත්ගොව්වා මේ ඇතාගේ හික්මීම පෙන්වන ලදී. ඇත්ගොව්වා කී හැම දෙයක්ම ඇතා කරන්නේය. අන්තිමේදී රත්වූ ගිනියම් වූ යකඩයක් ඇතා වෙත එවා මෙය අල්ලව යැයි ඇතාට කීවේය. ඇති කඳුළු පිරි දෙනෙතින් ඇත් ගොව්වාගේ මුහුණ බලා සෙනෙහසින් පිරී කීකරු සිතින් ඒ ගිණියම් වූ යකඩය අල්ලන ලදී. එහිදී හොඬය විටි විටි ගා දැවී ගියේය. පසුව වහා එය අතහරින්න යැයි කී විට එය අත හැරියේය.

මේ හොඳ කීකරු ඇතා ද අකීකරු ඇතකුමෙන් රාගයෙන් මත්ව ගිය අයුරු සැමට ප්‍රකට විය. එදා ඒ කීකරු ඇතු නම් කාශ්‍යප මහ රහතන් වහන්සේ වේ. අනාගතයේ මෛත්‍රී බෝසතාණන් වහන්සේ බුදු වී වේභාර පර්වත පාමුලට වැඩි විට මේ කාශ්‍යප මහ රහතන් වහන්සේගේ දේහය පර්වත අතර සැඟවී තිබී ශ්‍රී හස්තයට ගෙන පෙන්වන්නේය. පසුව දේහය බුදුහිමිගේ ශ්‍රී හස්තයෙන්ම ආදාහනය වන්නේය. මෛත්‍රී බුදු රජුන්ගේ ශ්‍රී හස්තය දැවී අල්ල පුරා ගෙඩියක් හටගන්නේය. එහිදී පෙර තමා ඇත්ගොව්වෙකු ව ඉපදී සිටියදී කළ කර්මය මෙකළ එළදුන් බව වදාරන සේක. එබැවින් පාපකර්මයට බිය වෙත්වා.

## 53. විනයධරයන් අතර අගතැන්පත් උපාලි හිමියෝ කරණවැමියෙක් වීමට හේතුව

මුන් වහන්සේ අනුරුද්ධ හිමි ආදි සයදෙනා හා එකට මහණ වූ අතර ගිහිකල ශාක්‍යයන්ගේ කෙස් රැවුල් බාන කරණවැමියා විය. බුදු සසුනේ පැවිදිව විදසුන් වඩා රහත් වී විනයධරයන් අතර අගතැන්පත් විය. මෙවන් වාසනා ගුණ ඇති මුන් වහන්සේ මෙසේ පහත් කුලයක ඉපදුනේ පෙර අඤ්ජය රජුගේ පුත් චන්දන කුමරු වී සිටියදී දිනක් සිරිත නම් ඇතු පිටින් යද්දී දේවල නම් පසේ බුදුන් තමා ඉදිරියෙහි නොනැවතී එනවා දැක කිපී පසේ බුදුන් වහන්සේ ගැටීමට ඇතා මෙහෙය වීය. නමුදු ඇතා නිශ්චලව සිටියේය. එබැවින් කිසිවෙකුට

උපනෙනසේ කිසිම වරදක් නොවුව ද සිතේ ඇතිවූ පහත් කෝපය නිසා බොහෝ දුවිළි සහගත විය. පිය රජුට කියා පසේ බුදුන්ගෙන් සමාව ගත් නමුදු කළ කර්මයෙහි විපාක නැවැත්විය නොහැකි බැවින් මෙසේ අනුන්ගේ කෙස් රැවුල් බාන කරණවෑමියෙක්ව ඉපදුන බව වදාරා ඇත.

(ථේරි අපදානය)

## 54. අම්බපාලිය වෛශ්‍යාවක් වීමට හේතුව

මෙතුමිය විශාලා මහනුවර අඹ උයනක අඹ අතු අතර ඕපපාතිකව (මාපියන් නැතිව) පහළ වූවාය. ඇයගේ විශිෂ්ඨ රූපය නිසා සියළු රජ දරුවන්ට සිටුවරුන්ට පරිභෝගයට නගර සෝභිනියක් කරන ලද්දීය. ඇය මෙලෙස අසරණියක් වුණේ සිඛී බුදුසසුන කාලයේ මෙතුමිය බ්‍රාහ්මණ කුලයක ඉපිද කිපුණු සිතින් රහත් මෙහෙණකට වෛශ්‍යාවක මෙන් අනාචාර ඇතිව බුදුසසුන දූෂණය කරන්නීය යැයි ආක්‍රෝෂ කළා. ඒ පවින් නිරාදුක් විඳින්නට වූවාය. දසදාහක් ජාතීන්හී ගණිකාවක්ම වූවාය. නපුරු වූ විෂයක් අනුභව කළාක් මෙන් පසුව බුදු සසුනෙහි පැවිදිව රහත්ව සම්බුදු දුවණියක් වූවාය.

(පරමත්ථ දීපනි නම් ථේරිගාථට්ඨ කථා 162 පිට)

## 55. බොහෝ ස්වාමී පුත්‍රයන්ට ද හිඟමනේ ගොස් ජීවත් වූ මිනිසාට ද එපා වූ අභිංසකාවිය

මැය නමින් ඉසිදාසිය වේ. අවන්ත රට සිටුතුමාගේ එකම දුව විය. තම තත්වයට ගැලපෙන සිටු පවුලක සිටු පුත්‍රයෙකු හා සරණ ගියේ විය. ඇය අනලසව පණ්ඩිතව උත්සහවන්තව දාසියක් මෙන් සියළු කටයුතු තම ස්වාමියාට කරදුන්නී නමුදු නිරන්තරයෙන්ම ඒ සිටු පුත්‍රයා ඇයට බැණ වදින්නීය. අවසානයේ ඔහු විසින් ඇයව මාපියන් වෙත යවන ලදී. ඉසිදාසියගේ පියා ඇයව නැවත මධ්‍යම පන්තියේ සිටුවරයෙකුට සරණපාවා දුන්නාය. ඒ සිටු පුත්‍රයාටද තම ජීවිතය මෙන් ආදරය කළේද , සෙනහස දැක්වීද , මැයගේ කර්මය නිසා ඔහුටද එපා විය. ඔහු ද මෙතුමිය දෙමාපියන් ළඟට යැව්වේය.

පසුව සිටු පියා පාරේ ඉඳුල් කමින් යන හිඟන්නෙකු දැක ඔහු තම දුවට ස්වාමිකොට දී ඒ සිටු මැදුරේම නැවැත්වීය. මහ පුදුමයකි. අහෝ කර්මයක ඇති බලවන්තකම. මැය ඔහුට ද අතිශයින්ම ආදරයෙන්, සෙනෙහසෙන් මවක් මෙන්ද සයනයෙහි වෙසඟනක් මෙන් ද කටයුතු කළ නමුදු මේ හිඟන මිනිසාට ද ඇය එපාවී සිටු මැදුරින් බැහැර වී

යන්නට ගියේය. අහෝ මේ අකුසල කර්මයන්ට නින්දා වේවා. පසුව ඇය මහණ වීමට හෝ සිය දිවි නසා ගැනීමට තීරණය කළාය. පෙර පින් ඇති ඇය මහණ වූවාය. මහණ වී දින සතකින් රහත් වී ත්‍රිවිද්‍යාලාභි වූවාය.

මේ රහත් මෙහෙණින් වහන්සේ තමාගේ පූර්ව කර්මය මෙසේ කිවාය. ඇය පෙර එරකච්ච නුවර මහත් ධන ඇති රන්කරුවෙක්ව සිටියදී තරුණ මදයෙන් මත්ව පරදාර සේවනයේ යෙදී දිගු කලක් නිරාදුක් වින්දේය. ඉන් මිදී වැඳිරියක කුස පිළිසිඳ ඉපදුන කල්හි නායක වඳුරා මේ කුඩා වඳුරාගේ පුරුෂ ලකුණ විනාශ කළේය. මෙය ද පරදාර සේවනයෙහි දුක් විපාකයකි. පසුව මැරීගොස් අන්ධ වූ කුඳු වූ එළුදෙනක කුස පිළිසිඳ බිහි වූ අතර එහිදී ද බීජෝද්ධාරණය කරන ලදී. තව ද පුරුෂ නිමිත්ත ප්‍රදේශයෙහි පණුවන් ගසා අවුරුදු දොළහක් මහත්සේ දුක් විඳින්නට විය. මෙය ද පරදාර සේවනයෙහි විපාක වේ. පසුව අන්ධ වී මහත්සේ දුක්විඳ මැරී දාසියක කුස නපුංසකයෙක්ව ඉපදුනි. මෙයද පරදාර සේවනයෙහි විපාක වේ. පසුව අවුරුදු තිහෙන් මැරීගොස් දිළිඳු වූ අසරණ පවුලක උපන්නාය.

ගිරිදාස නම් ගැල් අයිති තරුණයෙක් හා විවාහ වූවාය. ඔහුට තවත් බිරිඳක් විය. එබැවින් මේ දිළිඳු කත ඒ බිරිඳ කෙරෙහි ස්වාමිපුත්‍රයා බිඳවා තමාගේ වසඟයේම පවත්වා ගැනීමට විද්වේෂණ කර්මය කළාය. (ස්වාමියාට ඒ බිරිඳ පෙනෙන විට අතිශයින්ම කිපෙන සේ කරන කටයුත්තකි) ඒ කළ පහත් අකුසලය හේතුවෙන් මේ දිවියේ ඇය තම ස්වාමියාට කොපමණ ආදරය කළත් සෙනෙහස දක්වූවත් දාසියක් මෙන් සියළු වැඩපල කළත් හොඳක් නම් අසන්නට නොලැබුණි. ඇය සියළු ස්වාමි පුත්‍රයන්ට එපා වූවාය. පාරේ ඉඳුල් කමින් ගිය හිඟන මිනිසාට පවා එපා විය. එබැවින් සත්පුරුෂයෙනි කර්මයේ ඇති බරපතලකම තේරුම් ගෙන අතිශයින්ම පරෙස්සමින් අකුසල් නොකොට ජීවත් වෙත්වා.

(ථේරී ගාථා - චත්තාලීස නිපාතය- ඉසිදාසී ථේරිය )

## 56. අනුන්ගේ වැසිකිළි පිරිසිදුකොට ජීවත්වන අසරණ සුනීතගේ පූර්ව කර්මය

මෙතුමා පෙර එක් ජීවිතයක දඟකාර කුඩා ළමයෙකුව සිටියදී දිනක් පසේ බුදු කෙනෙක් දැක , මොකද ඔබ වහන්සේ තුවාලකාරයෙක් වගේ මුළු සිරුරම පොරවාගෙන පිණ්ඩපාතේ යන්නේ? මොකද ඔබ

වහන්සේට බැරිද කෘෂිකර්ම ආදී රැකියාවක් කොට ජීවත්වෙන්න? ඉදින් ඔබට මොනවත් බැරිනම් අනුන්ගේ වැසිකිළිවල අසූචිවත් ඇද ජීවත්වන එකනේ තියෙන්නේ, කියා කියන ලදී. මෙහි විපාක වශයෙන් නිරයෙහි පැසී පසුව බොහෝ ආත්ම සිය ගණනක් අනුන්ගේ වැසිකිළිවල අසූචි අදින පුද්ගලයෙක්ව ජීවත් වන්නට සිදුවුණා.

අප බුදු සසුන කාලයේ ද රජගහ නුවර අනුන්ගේ වැසිකිළි පිරිසිදු කරන අසරණයෙක් වී ඉපදුනා මහා කාරුණික බුදුරජානන් වහන්සේගේ කරුණා දැලට හසුව පෙර පාරමී ඇති මෙතුමා පැවිදි කළ අතර නොබෝ දිනකින් විදසුන් වඩා රහත් වී ඖරස පුත්‍ර උතුමකු වුණා.

(පරමත්‍ථ දීපනී නම් ථේරගාථට්ඨ කථා 540 පිට)

## 57. මෝඝරාජ හිමිගේ කුෂ්ඨ රෝගයට හේතුව

අප බුදු සසුනෙහි රළු සිවුරු දරණ භික්ෂූන් අතර අගතැන්පත් වූ මේ හිමියෝ උපත ලබා සිටියේ රජ කුලයකය. සීයාගේ ඇවෑමෙන් රජවිය. නමුදු මහත් වූ කුෂ්ඨ රෝගයකින් දුක්විඳි බැවින් රජ සැප ද හිස් එකක් විය. (ආරෝග්‍යපරමා ලාභා- නිරෝගී කම පරම ලාභය වේ) එබැවින් මෝඝරාජ යැයි ප්‍රසිද්ධ විය. පසුව සසුනේ පැවිදිව රහත් විය. මේ මහා කුෂ්ඨ රෝගයට හේතුව නම් පියමතුරා බුදුසසුනේ පැවිදිවී සිටියදී ආසන ශාලාවක බිම් ගිනි තැබීම වේ. ඒ හේතුවෙන් අවුරුදු දාහක් නිරයේ පැසුන අතර ආත්ම පන්සීයකම උසස් කුලවතෙක් වුණත් උපතින්ම ශරීරයේ ලප කැළැල් (උපන් ලප) බොහෝ ඇත්තෙක් වී ඇත. මේ පච්ඡිම දිවියේ ද වාත රෝගයකින් මහා දුක් ගෙනදී ඇත.

(අපදාන පාළියේ 540 වන අපදානය)

## 58. දබ්බ මල්ල පුත්ත හිමි
## අමූලික බොරු චෝදනාවලට ලක්වුන හේතුව

දබ්බ මල්ල පුත්ත හිමි සත් අවුරුදු වියේදී පැවැදි වී රහත් වූ අතර උපන් දා සිට සිහිනෙනුදු මෛථුන ධර්මයෙහි යෙදී නැත. නමුදු මෙත්තියා මෙහෙණ තමා දූෂණය කළේ යැයි බුදු රජුන් හමුවේ පවා බොරු චෝදනා කළේය. සවග භික්ෂු ද බොහෝ භික්ෂූන් මැද ලාමක හැසිරීම් සම්බන්ධව බෙහෝ චෝදනාවන් එල්ල කළේය. එසේ අභූත චෝදනා වලට ලක්වීමට හේතුව මුන් වහන්සේ පෙර විපස්සී බුදු සසුනේදී පිරිසිදු සිල් ඇති භික්ෂු නමකට උන්වහන්සේ පිරිසිදු භික්ෂුවක්

යැයි දූන දූනද අමූලික චෝදනාවක් කොට නින්දා කළ බැවින් බව අපදාන පාලියෙහි දක්වේ.

ඉහත දක්වූ සියළු අඳුරු කර්මයෝ ශ්‍රාවක ශ්‍රාවිකා උවසු උවැසියන්ට විපාක දුන් ඒවාය. තුන්ලෝකයට පිහිටවන්නට ලොව පහළ වී වදාළ ශාන්ති නායක බුදුරජාණන් වහන්සේට ද කළ කර්මයේ විපාකයෙන් බේරී සිටීමට නොහැකි බව දතයුතු මෙත් බුදුරජුන්ගේ මතු විපාක දෙන කර්මයද එබන්දකි.

## 59. මහවැලි ගඟෙහි කිඹුලෙකු වූ මහා වාචකාල උපාසක තුමා

මෙතුමා සිරිලක අන්තර ගංගා නම් ගමෙහි විසූ අතර බුදු සසුනේ පැහැදී දානාදි පිංකම් කරමින් සෝවාන් වන සිතින් තිස් අවුරුද්දක් ද්වත්තිංසාකාර කර්මස්ථානය වැඩූ පිනැත්තෙකි. එසේ භාවනා කළේ ද පාරමී නොපිරී ඇති බැවින් හා වරදවා කළ බැවින් ආලෝක මාත්‍රයකුදු නොලබන ලදී. බුදු සසුන නෛයර්‍යානික නොවන බැවින් විශේෂයක් ලබන්න නොහැකි වී යැයි වරදවා වටහාගෙන මිසදිටු ගත්තේය. මරණාසන්නයේදී මේ මිසදිටු අදහස සිහිවිය.

මේ හේතුවෙන් මහවැලි ගඟෙහි නව ඉස්බක් පමණ දිග ඇතිව එයට සරිලන මහත් ශරීරයක් ද ඇති මහත් කිඹුලෙක්ව උපන්නේය. මේ කිඹුලා දිනක ආහාර සොයා කසා තොටට පැමිණියේය. එදින ගල්ටැම් පිරවූ ගැල් සැටක් ගඟින් එතෙරට ඇද යන ගව සමූහයා කරත්ත සහිතව ගිලින ලදී . නමුදු කුසගින්න සංසිඳවාගත නොහැකි විය. අප බුදු සසුනේ පෙන්වා ඇති වැරදි අතර ලොකුම වරද නම් මිසදිටු ගැනීම වේ. මෙය පංචානන්තරීක කර්මවලටද වඩා දීර්ඝ කාලයක් මහත් දුක් විඳීමට වන කර්මයකි. එබැවින් නිවන දක්වාම මිසදිටු ගැනීමක් අප අතින් නොවේත්වා යැයි ප්‍රාර්ථනය කරමු.

(විභංගට්ඨ කථා මනෝරථ පූරණී අටුවාව සද්ධර්මරත්නාකාරය - 162 පිට)

## 60. ආදරයේ වසඟත්වයට ගොස් නැට්ටුක්කාරයෙකු වූ උග්ගසේන සිටු පුත්‍රයා

රජගහ නුවර උග්ගසේන සිටු පුත්‍රයා දිනක් නෘත්‍ය සන්දර්ශනයක් බැලීමට ගිය අතර එහි නිත්‍ය දක්වන්නාවූ නාටිකාවක් කෙරෙහි සිත බැඳුනේ පූර්ව සෙනෙහසක් මතුවීමෙනි. නිවසට ගිය සිටුපුත්‍රයා ඇය

තමාට විවාහ කර දෙන්න යැයි මාපියන් ඇයද සිටියේ ආහාර වර්ජනයක්ද කොටය. දෙමාපියන් පුතු සිත වෙනස් කිරීමට උත්සහ ගත් නමුදු ඒ සියල්ල නිශ්ඵල විය. පසුව ඒ නාටිකාව විවාහ කරදීමට තීරණය කළේය. ඉන්පසු ඇය විවාහ කර දෙන ලදී. නමුදු සිටුපුතුගේ ඕනෑකමට සිදු වූ විවාහයක් බැවින් එම නාටිකාව නෘත්‍ය දැක්වීමට යන යන තැනට ඇයගේ පන්සියක් පිරිස හා සිටුපුතුටු ද යන්න සිදු විය. සිටු පුත්‍රයා කිසිදු නෘත්‍යයක් දැක්වීමට නොදන්නා බැවින් ඔවුන්ගේ බඩුපොදි ඇදීම් ආදිය ද කරන්නට සිදුවිය.

කාලයාගේ ඇවෑමෙන් එක් පුතෙකු ලැබුණේය. නාටිකාව එම කුඩා පුතු නලවන විට බඩුපොදි අදින්නාගේ පුතා නාඩා ඉන්නා ආදී ඇනුම්පද කියනු ලැබේ. මින් පීඩාවිඳි සිටුපුත් තමාද නෘත්‍ය දැක්වීමේ ශාස්ත්‍රය ඉගෙන ගෙන දක්ෂයෙකු විය. පසුව දිනක් රජගහ නුවර අති විශාල ජන සන්නිපාතයක් හමුවේ සිටුපුත්‍රයාගේ ශිල්ප දැක්වීමක් විය. සිටු පුත්‍රයා හැටරියන් උස උණගසක් මත ශිල්ප දක්වන්නට විය. තථාගතයන් වහන්සේ ද මහසඟරුවන පිරිවරාගෙන එතැනට වැඩිසේක. බුද්ධ අධිස්ඨානය අනුව සියල්ලෝම සිටුපුත්‍රයාගේ ශිල්ප දැක්වීම දිහා නොබලා භාග්‍යවතුන් වහන්සෙ දෙසටම නෙත් යොමු කළෝය. එහිදි සිටු පුත්‍රයාට තමා උගත් ශිල්පය ගැන මහත් කළකිරීමක් ඇතිවිය.

පසුව මෙය දුටු භාග්‍යවතුන් වහන්සේගේ මුගලන් ස්වාමීන් වහන්සේ අමාධර්මය දේශනාකොට වදාළ සේක. දෙසුම කෙළවර සූ අසුදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය විය. සිටුපුතු ද හැටරියන් උණ ගස මුදුනේදීම සිව්පිළිසිඹියා ලාභී මහරහතන් වහන්සේ නමක් වූවාහ. පසුව භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණ පැවිදි විය. නාටිකාංගනාවද මගේ ස්වාමියාගේ ජීවත්වීම යම්සේද මගේ ජීවත්වීම ද එසේම යැයි කියා පැවිදිව පිළිවෙත් පුරා රහත් විය. රහත් වීමට පිනැති මේ දෙපළ මෙසේ නෘත්‍ය දක්වන නාටිකාවක් හා නැට්ටුවෙක් වීමට හේතුවූ පූර්ව කර්මය ඒ භාග්‍ය වතුන් වහන්සේ හමුවේ අසා වදාළ අවස්ථාවේදී එය වදාළ සේක.

අතීතයේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ පිරිනිව් කල ශ්‍රී ධාතු නිදන් කොට රන් චෛත්‍යයක් ඉදිකළ අතර එයට අත්වැඩ දීමට මේ දෙපළ ද යානාවක නැගී බොහෝ ආහාර පානද ඇතිව යන්නට විය. අතර මගදී පිණ්ඩපාතයේ හැසිරෙන් එක් රහත් හිමිනමක් දැක දානයක් දීමට සිතක් විය. පසුව කාන්තාව එම ස්වාමී පුත්‍රයා ලවා ස්වාමීන්

වහන්සේගේ පාත්‍රය ගෙන්වාගෙන පාත්‍රය පුරවා දානය බෙදා දෙදෙනා සමග තෙරුන් වෙත ගොස් මෙය පූජාකොට දෙදෙනාම ප්‍රාර්ථනාවක් ද කළහ. ස්වාමීනි, ඔබ වහන්සේ යම් ධර්මයක් අවබෝධ කළේ නම් මේ පින අපටද ඒ උතුම් ධර්මාවබෝධය පිණිසම හේතු වේවායි කියාය.

මේ රහත් තෙරුන් වහන්සේ ඒ පැතුම ඉටුවන බව දිවැසින් දැන සිනහ පහළ කළහ. මෙය දුටු ඒ කාන්තාව ස්වාමියාට මෙසේ කිවාය. ස්වාමි පුත්‍රය, අපගේ ආර්යන් වහන්සේ සිනා පහළ කළේය. (ඇතැම් විට) එක්තරා නැට්ටුක්කාරයෙක් විය හැකි යැයි ස්වාමියා ද, සොඳුර එසේ විය හැකි යැයි, කියමින් දෙදෙනා පිටත් විය. කාලයක් ජීවත්ව ආයුෂ ඉවර ව පසු කළුරිය කොට ගොස් කළ පින් මතුවී දෙව්ලොව ඉපිද අපමණ දෙව් සැපකට ලාභී වුවෝය. අප බුදු සසුන කාලෙයේ දෙව්ලොවින් චුතවී අවුත් එම කාන්තාව පෙර රහත්හිමිට කළ දෝෂාරෝපණය මතුවී නැටුම් දක්වා මුදල් උපයා ජීවත්වන තැනක උපන්නීය. පුරුෂයා සිටුගෙදරක උපන්නේය. නමුදු ඔහු එදා , සොඳුර එසේ විය හැකි යැයි, එයට ප්‍රති වචන දුන් බැවින් මැය හා පෙර සෙනෙහසින් එකතුව නැට්ටුවෙක්ව ඒ ඒ තැන යන්නට සිදුවූ බව භාග්‍යවතුන් වහන්සේ පෙන්වා වදාළ සේක. එබැවින් අන් අයගේ වැරදි විවේචනයට නොගොස් දැහැමි වචනම කථා කරන්න අධිෂ්ඨාන කරගනිත්වා.

## 61. උපන්දාම ගඟේ පාකර දමු කිරිකැටි බිළිඳෙකුගේ අභිමානවත් කථාව

අකුසල කර්මවල අසෝභන විපාකත් කුසල කර්ම වල සෝභන හොඳ විපාකත් මේ කථාවෙන් ද මොනවට පෙන්නුම් කරයි. සත් පුරුෂ පින්වතුනි, පෙර ඈත අතීතයේ කාශ්‍යප බුදුන්ගේ පිරිනිවීමෙන් පසු බුදුරජුනගේ ඒකඝණ ධාතු නිදන් කොට යොදුනක් උස චෛත්‍ය කරන සමයේදී මහරහතන් වහන්සේ නමක් චෛත්‍යයට රත්රන් සම්මාදම් කරමින් එක් රන්කරුවෙක්ගේ නිවෙසකට වැඩියේය. මෙවිට රන්කරු තම භාර්යාව සමග කළහ කරමින් සිටි බැවින් තෙරුන් වහන්සේ ඔබලාගේ චෛත්‍යයට වැඩ නිමවීම සඳහා රන් නොපොහොනා බව මතක් කළ විට භාර්යාව සමග තිබුණු කෝපයෙන් නුඹ වහන්සේගේ ශාස්තෘන් වහන්සේ ජලයේ දමා යන්න යැයි කීය.

ඒ මොහොතේ තම භාර්යාව මා කෙරෙහි කෝප වුණි නම් මට නොබැන බුදුරජාණන් වහන්සේලාට වෛර කිරීම(දොස් කිම) වැරදි බව කී පසු, රන්කරු සංවේගයට පත් වී තෙරුන්ගෙන් සමාව ඉල්ලීය. බුදුරජුන්ගෙන් එයට සමාව ගන්න යැයි කීවිට කුමක් කොට කෙසේ සමාව ගත යුතුදැයි ඇසූ විට රනින් මල් පොකුරු තුනක් කොට චෛත්‍යයෙහි නිධන් කොට තෙත් වූ කෙස් ඇතිව සමාව ගතයුතු බව මතක්කොට වැඩිසේක. පසුව රන්කරු, රනින් මල් සාදමින් තමාගේ පුතුන් තුන්දෙනාගෙන් වැඩිමහලු පුතාට ඒ සඳහා උදව්වට කථාකළ නමුත් ඔහුගෙන් ලැබුණේ තාත්තේ ඔබ කළ වරද ඔබම බලාගන්න කියාය. දෙවැනි පුතාත් කැඳවා කී නමුත් කිසිම යහපත් ප්‍රතිචාරයක් නොවීය. ඔහුද පෙර සේම කීවේය. මව්පියන්ට ආදරය ඇති තුන්වන පුතාට මතක් කළ පමණින් පිළිගෙන මව්පියන් උපන් කෘත්‍ය දරුවන්ට බාරයි නේද සිතා පියාට සහය වී දෙදෙනා සමග මල් පොකුරු තුනක් සාදා ධාතු නිධන් කොට සමාකර ගත්තේය.

පින්වතුනි, මෙසේ මොහු බුදුන් වතුරේ දමන්න කී පවින් හත්වාරයක්ම බිහිවුණු කාලයේදීම ජලයේ දමන ලද්දේය. අවසාන ආත්ම භවයේ අප සම්බුදු රජුන්ගේ කාලයේ බරනැස් නුවර එක් සිටුකුමාරිකාවක් කුස මන්ත්‍ර බලයෙන් අහසින් යන එක් විජ්ජාධරයෙක් නිසා පිළිසිඳගෙන හොර රහසේම දස මසක් ඇවෑමෙන් මෙලොවට බිහිකොට තම දාසියක් සමග සාකච්ඡාකොට අළුත් භාජනයක් ගෙන්වා මේ කිරිකැටි දරුවා ගැබ්මල පවා නොසෝදා එහි දමා එය මනාකොට වසා මල්මාලාවලින් සරසා තමන්ගේ භාරයක් ඔප්පුකිරීමක් යැයි දාසිය ලවා නොහොල්මනේ ගඟේ පාකර හැරියා. අද සමාජයේ අපට නොදැනුවත්ව මෙබඳු දේවල් මොනතරම් වෙනවාද?

කෙසේ හෝ මේ පච්ඡිම භවික කිරිකැටියා ගඟ පහළ නාමින් සිටි කාන්තාවන් දෙදෙනෙකුගෙන් එක්කෙනෙක් ලබාගෙන දරුවා සෝදා පිරිසිදු කොට පෝෂණය කළාය. කෙස් කරකැවී ගැටගැසී තිබුණ නිසා ජටිල කියා නම තැබුවා. මේ කාන්තාව මහා කච්චායන මහරහතන් වහන්සේගේ උපස්ථායිකාවක් බැවින් උන්වහන්සේට මහණ කරන්න කියා කුඩා වයසේදීම පූජා කළා. මහ රහතන් වහන්සේ මේ දරුවා කුඩා බැවිනුත් මහත් සම්පත් විඳින පුණ්‍යවන්තයෙක් නිසාද කැඳවාගෙන ගොස් වෙන උපස්ථායක කුලයකට පෝෂණය කරන්න කියා බාරකලා. ඒ නිවසේ හිමියන් ද ආදරයෙන් රැකබලාගෙන දරුවාගේ පින් මහිමය කරුණු සහිතව දැනගෙන තමන්ගේ දූ කුමරියව මොහුට

සරණකොට දුන්නේය. අළුත් නිවසකට ගිය මේ දෙදෙනා නිවසට පැමිණීමත් සමගම ඒ ජටිල තරුණයාගේ පෙර පින් මතුවී නිවසට නැගෙනහිරින් අසූරියන් රන් පර්වතයක් පහළ විය. මෙය දැනගත් රජුගෙන් සිටු තනතුර ලබා ජටිල නමින් අමිතභෝගී සිටු කෙනෙක් විය.

මොහුට පුත්‍රයන් තිදෙනෙකු විය. ඒ දරුවන් වැඩි වියට පත්වූ පසු පැවිදිවීමේ අදහසින් යුතුව ඒ පුතුන් කැඳවා රන් දණ්ඩ ඇති වජිර තලයක් සහිත උදැල්ලක් දෙටුපුතාට දී රන් පර්වතයෙන් රන් පිඩක් ගේන්න කියා කීවේය. දෙටුපුතු උදැල්ලෙන් රන් පර්වතයට පහර දුන්නත් ගලකට ගැසුවාක් මෙන් විය. දෙවෙනි පුතාද එසේම පිටත් කළ නමුත් රන් නොකැපුණ බැවින් බාල පුතා පිටත් කළේය. බලන්න පින්වතුනි පෙර තාත්තාට රන්මල් හදා චෛත්‍යයට පූජාකිරීමට සහාය වූ බැවින් හරියට මැටි ගොඩකට ගසන්නාක් මෙන් රත්රන් කැපි කැපි යන්න පටන් ගත්තේය. වැඩිමහල් සොයුරන් දෙදෙනා පෙර රන්මල් හැදීමට සහාය නොවූ බැවින් ඔවුන්ට රන් ලබාගැනීමේ ශක්තියක් නොවීය.

ඒ මොහොතේ දරුවන් තුන්දෙනා කැඳවා මේ රන් පර්වතය නුඹලා සඳහා පහල නොවුවේය. මාගේ සහ බාල පුතාගේ පිනට පහළ වූවකි. ඒ නිසා මල්ලිත් සමග එකට පරිභෝග කරන්න යැයි බාරකොට අප බුදු සසුනේ පැවිදි වී අග්‍ර අමාමහ නිර්වාණ ධාතුව අවබෝධ කළේය. ඒ නිසා සත්පුරුෂ දරුවන් තම දෙමාපියන්ගේ කටයුතු බොහොම ආදරයෙන් කරදෙත්වා. කිසිවෙකු කිසිදා තෙරුවන්ට නිග්‍රහ නොකෙරෙත්වා.

## 62. අසීමිත ගුණැති මහා ප්‍රාඥ සම්මා සම්බුදු රජාණන් වහන්සේටද විපාක දුන් කර්ම දොළහ

දශබලධාරී බුදුරජාණන් වහන්සේ ට ද පූර්වයේ කරන ලද කර්ම දොලහක් මෙලොවදී විපාක දුන් බව දිනක් හිමාලයේ අනෝතප්ත විල අසලදී 500 ක් භික්ෂූන් හමුවේ වදාළ සේක. පුබ්බ කම්ම පිලෝතික අපදානයට අනුව ඒ මෙසේය.

01. සුන්දරී පරිබ්බාජිකාවගේ විහාර ස්ථානයට එනයන ගමන හේතුවෙන් විශාල අපවාදයක් නැගුනා. ඊට හේතුව පෙර මුනලධූර්තකව සිටියදී සරභ නම් පසේ බුදුරජුන් ට කළ දෝශාරෝපණය බව දත යුතුය.

02 පෙර ලොව පහළ වූ සම්බාහිභූ නම් බුදුරජුන්ගේ නන්ද නම් ශ්‍රාවකයන් වහන්සේට කාමභෝගිකය කියලා දොස් නගන්නට යෙදුනා. ඒ හේතුවෙන් සසර බොහෝ දුකට පත්වුණා. මේ සාරසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයකටත් පෙර කරන ලද කර්මය බුදුබව ලබාද බඩදරු අම්මාගේ වෙස්ගත් චිංචි මානවිකාව හේතුවෙන් පහත් වූ අපවාදයකට ලක්වුණා.

03 පසු කාලයකදී සුන්දරී පරිබ්බාජිකාව මරා මල් අසුන ලඟ වළලා බුදුරජුන් ඇය දූෂණය කොට මරා සඟවන ලද්දේ යැයි මහත් දෝශාරෝපණයක් දින 07 ක් තුළ පැවතුණා. දින 07 කින් පසු සත්‍ය එළිවුණා. කෙසේ නමුත් මේ නින්දාවට හේතුව පෙර භීම නම් ඍෂීන් වහන්සේට බැණ වැදීම බව දතයුතු

04 මහ බෝසතාණන් වහන්සේ පෙර වස්තු ලෝභය නිසා තම සොයුරා කන්දකින් පහළට තල්ලු කර ගලක් ද පෙරළා මරා දැමුවේය. ඒ හේතුවෙන් සසර බොහෝ දුකට පත්වී බුදු වූ ජීවිතයේ ද දෙව්දත් තෙර ගලක් පෙරලූ බව දත යුතුය

05 බෝසතුන් දිනක් කුඩා ළමයෙකුව සිටියදී පසේ බුදු කෙනෙක් දැක ගලකින් ගැසුවා. ඒ කර්මය හේතුවෙන් මේ ජීවිතයේ තම ජීවිතය නැති කිරීමට දෙව්දතුන් දුනුවායන් යෙදවූ බව දතයුතු

06 පෙර බෝසතුන් ඇත්ගොව්වෙක් වී සිටියදී පසේ බුදු කෙනෙක් වඩිනා බව දැක දූෂිත සිතින් මැරීම සඳහා ඇතා මෙහෙයෙව්වා. උන්වහන්සේ ඍද්ධියෙන් වැඩියා. නමුදු පහත් සිතින් කළ කර්මය නිසා මේ ජීවිතයේ තමන් වහන්සේ මැරීම පිණිස මත්වූ නාලාගිරි ඇතු ඉදිරියට ආ බව වදාළා

07 දෙව්දත් තෙරුන් තථාගතයන් වහන්සේ කෙරෙහි ගැටුනු සිතින් ගිජු කුලු පව්වේදී මහ ගලක් සක්මන් කරන බුදු හිමිගේ හිසට පෙරලුවා. පෙර පිරූ පාරමී බලයෙන් මහ ගලක් ඉබේම මතුවී ඒ ගල වැටෙන්නට නොදී රඳවා ගත්තා. නමුදු ගල් පතුරක් ගැලවී අවුත් ශ්‍රී පතුලේ ගැටී මාපට ඇඟිල්ල තැලී ලේ කැටි ගැසුනා. ජීවකතුමා ශ්‍රී පතුල පලා ලේ අස්කළා. මෙසේ ශ්‍රී පතුල පලන ලද්දේ පෙර පෘතුවිශ්වර රජව සිටියදී මිනිසෙකු මරවන ලද පවින් බව දත යුතු.

08. තථාගතයන් වහන්සේගේ හොඳ නොවන හිස ආබාධයට හේතුව පෙර කෙවුල් පවුලක ඉපදී සිටියදී තම ඥාතීන් බොහෝ මාළුන් ගොඩදා තිබෙනවා දක සතුටු සිතා පහළ කළ පාපය බව දත යුතුය. එදා ඒ මසුන් මැරූ සියළු ඥාතීන් මේ දිවියේ ද ඥාතීන් වී ඉපදුනා. ඒ සැමට ඒ ප්‍රාණඝාත කර්මය විපාක දීම ලෙස විඩූඪභ කුමරු අතින් මියයන්න වුන බව දක්වා ඇත.

09. තුන්ලෝකය පුරා පැතුරුන දායක උපස්ථායක ශ්‍රාවක ශ්‍රාවිකා පිරිසක් ඇති තථාගතයන් වහන්සේට දොළොස්වන වස්කාලයේ එක් බත් ඇටයකුදු නොලැබී ගියා. අශ්වයන් දෙන යවහාල් වළඳා ජීවත්වෙන්න වුණා.මෙසේ වීමට හේතුව පෙර ඵුස්ස බුදුරජාණන් වහන්සේට , ඔබ වහන්සේ මේ ප්‍රණීත ඇල් හාල් වළඳනවාට වඩා හොඳයි යවහාල් වැළඳුවා නම් , කියා දොස් නැගූ පාපය බව දත යුතු

10. සුගතයන් වහන්සේට හොඳ නොවන කොන්දේ ආබාධයක් තිබුණා. ධර්ම දේශනා කරන අවස්ථාවල එය හැදුනම සැරියුත් හිමිට දම් දෙසුම පවරා විවේක ගැනීමට වඩින බවද සඳහන් වෙනවා. මෙයට හේතුව පෙර මල්ලව පොර අල්ලන යෝධයෙකුව සිටියදී විරුද්ධවාදී මල්ලපොර කරුවෙකුගේ කොන්ද කැඩූ පව බව දතයුතු.

11. බුදුරජුන්ට වැළඳුන ලෝහිත පක්කන්දිකා (ලේ අතීසාරය) රෝගයට හේතුව පෙර වෛද්‍යවරයෙකුව සිටියදී සිටුවරයෙකුට බෙහෙත් කළා. ඔහු නියමිත මුදල නොගෙව්වා. පසුව විරේක බෙහෙත් දුන්නා. ඔහුට ලේත් සමග විරේක වුණා. සිටුවරයා බියවී නියමිත මුදල් ගෙවූකල නැවත සනීප කළා. නමුදු ඒ කර්මය විපාක දුන් බව දත යුතු

12. මහබෝසතාණන් වහන්සේට බුදුවීම පිණිස සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කිරීමට සිදුවුණේ පෙර ජෝතිපාල මානවකයාව සිටියදී ඝටීකාර බමුණා සමග කාශ්‍යප බුදුරජාණන් වහන්සේට දොස් කී පාපය බව දතයුතු.

සත්පුරුෂ හිතවතුනි, බලන්න මහත් වූ නුවණක් ඇති මහත් වූ බලයක් ඇති මහත් වූ යසසක් ඇති මහත් වූ පිරිවර සම්පත්තියක් ඇති මහත් වූ ගුන සම්පත්තියක් ඇති මහත් ඍද්ධි බලයක් ඇති තථාගත සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේට පූර්වයේ කරන ලද කර්ම සහ එත

විපාක වලින් බේරී සිටීමට නොහැකි නම්, එතරම් පාරමී ශක්තියක්, ගුණ ශක්තියක්, නුවණක්, පිරිවරක්, සෘද්ධි බලයක්, නැති අප ඔබ වැන්නවුන් කෙසේ නම් ගැලවෙන්නද? එබැවින් පසුතැවිලි වන්නට වෙන දෑ නොකරන්න. කිසි දිනක කාහටවත් දුකක්, පීඩාවක්, සිත් තැවුලක්, ඇති නොකරන්න. කිසිවෙකුට හිංසාවක් , පීඩාවක්, දුකක්, දොම්නසක්, කරදරයක් , විපතක් , වෙහෙසක්, නොකරන්න.

සත්පුරුෂයෙනි, ඔබ කිසිවෙකු නොවෙහෙසන මුළු ලොවක් සනහන දෑතක් ඇත්තෙකු වන්න. එබඳුම අවිහිංසාවාදී දෙපා යුග්මයක් ඇත්තෙකු වන්න. තම දෙනෙතින් අනුන් නොරවටන්න. අනුන් නොරිදවන්න. මුළු ලොවක් සනහන දෙනෙතක් ඇත්තෙකු වන්න. ඔබ දෙසවන නොමගට නොයොදන්න. සුමගට යොදවන්න. කය සංවර කර ගන්න. නිතරම ඔබ කතාකරන වචන නිවැරදි දැයි සිතන්න. යහපත් වූ සැම සිත් නිවන සනසන වචනම කතා කරන්න. ඔය සිත නොමගට නොයොදන්න. සුමගට යොදන්න. දාන්ත වූ ශාන්ත වූ සංවර වූ සංසිඳුනා වූ සුවිපත් වූ මනසක් ඇත්තෙකු වන්න. කිසිදු කිසිදින පහත් සිතුවිලි නොසිතන්න.

පින්වතුනි, මලක් වුණත් පැහැය පමණක් තිබුණාට මදි. දසත පැතිරෙන සුවඳ ද තිබීම වැදගත්. එසේ ඔබද ලස්සන සුවඳවත් මලක් වගේ ගුණයෙන් නුවණින් හෙබි මිනිසෙකු වන්න. පින්වතුනි, ලෝකයේ ගස්කොලන් තිබුණට සඳුන් ගස් බොහොම අඩුයි. එසේම නොයෙක් පාෂාණ ඇතත් මැණික් ගල් බොහොම අඩුයි. අලි ඇතුන් සිටියත් ගජමුතු තිබෙන ඇතුන් බොහොම අඩුයි.

පින්වතුනි, මේ වගේ තමයි ලෝකයේ මිනිසුන් සිටියාට කළගුණ දන්න පහත් වැඩ නොකරන අනුන්ට දුක් නොදෙන හැදුනු සිත් ඇති මිනිස්සු බොහොම අඩුයි. සත්පුරුෂයෙනි, ඔබ ගස් අතර සඳුන් ගසක් වගේ. ඇතුන් අතර ගජමුතු තිබෙන ඇතෙක් වගේ, මුවන් අතර කස්තුරි තිබෙන මුවෙක් වගේ, පාෂාණ අතර බැබලෙන මැණිකක් වගේ, ගුණයෙන් නුවණින් යුත් අනුන්ට දුක් නොදෙන සාදු ජනයාගේ ආදර ගෞරවයට ලක් වූ මානව හිතවාදී දයානුකම්පිත මිනිසෙකු වන්න අධිෂ්ඨාන කරගන්න. ඔබ සැම දෙනාටම සම්මා සම්බුද්ධ සරණයි.

''චිරං තිට්ඨතු සද්ධම්මෝ සම්මා සම්බුද්ධ සාසනං
සතං සමාගමෝ හෝතු යාව නිබ්බාන පත්තියා,''

# කර්ම විපාක
# KARMA VIPAKA

පළමු මුද්‍රණය 2002.05.26
**අළහකෝන් මැතිණිය ප්‍රධාන පිරිස**

දෙවන මුද්‍රණය 2003.01.07
**අල්විස් මැතිතුමා ප්‍රධාන පිරිස**

තෙවන මුද්‍රණය 2003.08.05
**පතිරත්න මැතුමා ප්‍රධාන පිරිස**

සිව්වන මුද්‍රණය 2008.10.25
**එම්.එල්.එම්.ඇම්.ගුණවර්ධන මැණිකේ ප්‍රධාන පිරිස**

පස්වන මුද්‍රණය 2010.03.04
**කේ. ජී. සුජිත් ප්‍රියන්ත ඇතුළු ප්‍රධාන පිරිස**

හයවන මුද්‍රණය 2011.05.10
**මස මාණවක කල්‍යාණ මිත්‍ර සංසදයේ සියළු පිරිස**

හත්වන මුද්‍රණය 2012.03.07
**මස මාණවක කල්‍යාණ මිත්‍ර සංසදයේ සියළු පිරිස**

**"ලාභ උපදවන පිළිවෙත අනෙකකි. නිවනට පැමිණෙන පිළවෙත අනෙකකි. බුද්ධ ශ්‍රාවක භික්ෂුව මෙය විශේෂයෙන් දැන අධාර්මික ලාභ සත්කාරය කෙරෙහි සතුටු නොවනේය. (කාය,චිත්ත,උපධි) විවේකය වඩන්නේය. ඒකාන්තයෙන් භාවනාවෙන් නුවන උපදියි. භාවනාවේ නො යෙදීමෙන් නුවණ වැනසෙයි. වැඩීම හා හානිය පිණිස වන මේ දෙමඟ දැන නුවණ වැඩෙන සේ තමා පිහිටුවිය යුතුය."**

**(ධම්ම පදය - 75282)**

helaboduhavula@gmail.com